අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2018

ඇගයීම් වාර්තාව

23 - දේශපාලන විද්‍යාව



පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2018

ඇගයීම් වාර්තාව

23 - දේශපාලන විද්‍යාව



පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

දේශපාලන විද්‍යාව

ඇගයීම් වාර්තාව - අ.පොෂ.ස. (උ.පෙළ) විභාගය - 2018

හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්ව විද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන් ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පොෂ.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන් ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් ද මෙය පිළිගැනේ. 2018 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 37752 ක් පාසල් අයදුම්කරුවෝ ද 10521ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමවුපියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂය භාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයන්ට එකසේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පොෂ.(උ.පෙළ) දේශපාලන විද්‍යාව විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද දේශපාලන විද්‍යාව විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබා ගෙන ඇති ආකාරය සවිස්තරාත්මක ව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පොෂ.(උ.පෙළ) 2018 විභාගයේ දේශපාලන විද්‍යාව විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට විභාග අපේක්ෂකයන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රීයව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයන්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2020.05.28
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

උපදේශකත්වය	:	බී. සනත් පූජිත විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
සම්බන්ධීකරණය	:	එස්. ප්‍රනවදාසන් නියෝජ්‍ය විභාග කොමසාරිස්
විෂය සම්බන්ධීකරණය		පී. ඩී. එන්. මැණිකේ සහකාර විභාග කොමසාරිස්
සංස්කරණය	:	ජයදේව උයන්ගොඩ (සේවාර්ජිත මහාචාර්ය) කොළඹ විශ්ව විද්‍යාලය
සැකසුම් කමිටුව	:	එච්. ඒ. චාමින්ද පුෂ්ප කුමාර ගුරු සේවය - I ඇඹිලිපිටිය මහා විද්‍යාලය ඇඹිලිපිටිය.
		නිරූපා මානෙල් ගුරු සේවය I ර/සුමනා බාලිකා විද්‍යාලය රත්නපුර.
		යූ. බී. ලසදාවතී ගුරු සේවය - I ගා/ ගිංතොට ශ්‍රී මේධංකර මහා විද්‍යාලය පිටිවැල්ල, ගාල්ල.
		එස්. එම්. වික්‍රම චන්ද්‍රසිරි ගුරු සේවය - I ගිරි/ ආර්.ජී. සේනානායක මහා විද්‍යාලය නාරම්මල.
		එස්. ඒ. ඉන්ද්‍රානී සෝමලතා ගුරු සේවය - I නික/ ශ්‍රී සුනන්ද මහා විද්‍යාලය පාදෙණිය
		බී. සී. ධර්මදාස ගුරු උපදේශක කලාප අධ්‍යාපන කාර්‍යාලය නාවුල.
පරිගණක පිටපත සැකසුම	:	ආර්. ඒ. එන්. එම් පෙරේරා දත්ත සටහන් ක්‍රියාකරු
පිටකවරය නිර්මාණය	:	ඒ. එල්. කේ චතුරාණි කළමනාකරණ සේවා නිලධාරී

ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 2
1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය 2
1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I පත්‍රය සඳහා සාධනය 5
1.3.2 II පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 6
1.3.3 II පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 6
1.3.4 II පත්‍රය සඳහා සාධනය 7

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 **I** පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I පත්‍රයේ ව්‍යූහය 9
2.1.2 I පත්‍රය 10
2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
2.1.4 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (විෂය ක්ෂේත්‍රය අනුව) 20
2.1.5. I පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 22
2.1.6 I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 23

2.2 **II** පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II පත්‍රයේ ව්‍යූහය 26
2.2.2 II පත්‍රය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 27
2.2.3 II පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 81

III කොටස

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 83

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 85

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ

මෙම පාඨමාලාව අවසානයේ දී ශිෂ්‍යයා,

1. තාර්කික දේශපාලන පුරවැසියෙකු බවට පත්වීමට ප්‍රමාණවත් දැනුම හා අවබෝධය ලබා ගනියි.
2. තමා ජීවත් වන දේශපාලන පරිසරය පිළිබඳ අවබෝධ කර ගැනීමට හා හඳුනා ගැනීමට සමත් වේ.
3. වගකීම් හා යුතුකම් අවබෝධ කර ගත් හොඳ පුරවැසියකු බවට පත්වීමට අදාළ හැකියා හා කුසලතා වර්ධනය කර ගනියි.
4. සමාජ සහ දේශපාලන සංසිද්ධීන් විචාරශීලී ව විමසීමේ හැකියාව වර්ධනය කර ගැනීමට අවශ්‍ය දැනුම ලබා ගනියි.
5. දේශපාලන ක්‍රමයේ විවිධ වෘත්තීන් දැරීම සඳහා අවශ්‍ය කුසලතා වර්ධනය කර ගනියි.
6. අන්තර් ජාතික දේශපාලනය පිළිබඳ අවබෝධ කර ගැනීම හා ඒ පිළිබඳ දක්වන උනන්දුව වැඩි කර ගනියි.
7. රාජ්‍ය තාන්ත්‍රිකයන් වීමට අවශ්‍ය මූලික දැනුම දියුණු කර ගනියි.

මෙම අරමුණු ඉටු කරගැනීම සඳහා විෂය නිර්දේශය ප්‍රධාන නිපුණතා 16ක් ඔස්සේ ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව විෂය නිර්දේශය කොටස් දෙකකට බෙදා දක්වා ඇත.

★ **විෂය නිර්දේශයේ I වන කොටස**

දේශපාලන විද්‍යාව විෂයය තුළ අන්තර්ගත වන න්‍යායන් සහ ඒවායේ ප්‍රායෝගික භාවිතය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම, මෙම කොටසේ අභිමතාර්ථය වේ. මේ අනුව සමහර ප්‍රශ්න මඟින් න්‍යායාත්මක සංකල්ප පිළිබඳ සෘජුව ම අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂාවට භාජනය කෙරෙන අතර තවත් සමහර ප්‍රශ්න මඟින් තෝරා ගත් රටවල් කිහිපයක් ආශ්‍රයෙන් න්‍යාය හා භාවිතය අතර පවතින සම්බන්ධය පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කෙරේ. මෙයට අමතර ව රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාවට නැංවීම, අන්තර්ජාතික දේශපාලනයේ මූලිකාංග, ගැටුම් සහ ගැටුම් කළමනාකරණය පිළිබඳ දැනුම පරීක්ෂා කර බැලීම ද අපේක්ෂා කෙරේ.

★ **විෂය නිර්දේශයේ II වන කොටස**

මෙම කොටසේ අභිමතාර්ථ වන්නේ ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ව පැවති යුගයේ බ්‍රිතාන්‍ය පාලකයන් විසින් ක්‍රියාවට නැංවූ දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිසංස්කරණවල බලපෑම හා නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආණ්ඩුක්‍රම වර්ධනය පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂාවට ලක් කිරීමත් ය. මෙයට අමතර ව ශ්‍රී ලංකාව සහ අන්තර්ජාතික සමාජය අතර පවත්නා සම්බන්ධතාවන්හි ස්වරූපය පිළිබඳ ව ද අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කෙරේ.

1.2. විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂක සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	29525	6625	36150
දෙමළ	8160	3843	12003
ඉංග්‍රීසි	67	53	120
එකතුව	**37752**	**10521**	**48273**

වගුව 1

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් විභාග අපේක්ෂකයන්		පෞද්ගලික විභාග අපේක්ෂකයන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	1892	5.01	224	2.12	2116	4.38
B	4284	11.34	733	6.96	5017	10.39
C	9846	26.08	1919	18.23	11765	24.37
S	11987	31.75	2950	28.03	14937	30.94
F	9743	25.80	4695	44.62	14438	29.90
එකතුව	**37752**	**100**	**10521**	**100**	**48273**	**100**

වගුව 2

1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් විභාග අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		අසමත් (F)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	2149	141	6.56	222	10.33	464	21.59	735	34.20	1562	72.68	587	27.32
2. ගම්පහ	2230	128	5.74	245	10.99	510	22.87	709	31.79	1592	71.39	638	28.61
3. කළුතර	1614	101	6.26	184	11.40	355	22.00	515	31.91	1155	71.56	459	28.44
4. මහනුවර	2202	97	4.41	174	7.90	464	21.07	721	32.74	1456	66.12	746	33.88
5. මාතලේ	734	29	3.95	77	10.49	161	21.93	231	31.47	498	67.85	236	32.15
6. නුවරඑළිය	1394	37	2.65	147	10.55	434	31.13	517	37.09	1135	81.42	259	18.58
7. ගාල්ල	2299	175	7.61	267	11.61	510	22.18	661	28.75	1613	70.16	686	29.84
8. මාතර	1276	64	5.02	116	9.09	282	22.10	358	28.06	820	64.26	456	35.74
9. හම්බන්තොට	1230	44	3.58	119	9.67	257	20.89	365	29.67	785	63.82	445	36.18
10. යාපනය	870	29	3.33	90	10.34	234	26.90	268	30.80	621	71.38	249	28.62
11. කිලිනොච්චි	59			1	1.69	9	15.25	33	55.93	43	72.88	16	27.12
12. මන්නාරම	169	5	2.96	14	8.28	57	33.73	67	39.64	143	84.62	26	15.38
13. වව්නියාව	174	7	4.02	17	9.77	43	24.71	63	36.21	130	74.71	44	25.29
14. මුලතිව්	23			2	8.70	4	17.39	11	47.83	17	73.91	6	26.09
15. මඩකලපුව	1064	23	2.16	102	9.59	251	23.59	382	35.90	758	71.24	306	28.76
16. අම්පාර	1343	65	4.84	150	11.17	350	26.06	450	33.51	1015	75.58	328	24.42
17. ත්‍රිකුණාමලය	443	33	7.45	55	12.42	103	23.25	121	27.31	312	70.43	131	29.57
18. කුරුණෑගල	2509	135	5.38	250	9.96	612	24.39	768	30.61	1765	70.35	744	29.65
19. පුත්තලම	1316	82	6.23	150	11.40	362	27.51	443	33.66	1037	78.80	279	21.20
20. අනුරාධපුරය	1243	87	7.00	138	11.10	296	23.81	352	28.32	873	70.23	370	29.77
21. පොළොන්නරුව	587	35	5.96	57	9.71	144	24.53	188	32.03	424	72.23	163	27.77
22. බදුල්ල	1645	73	4.44	172	10.46	467	28.39	594	36.11	1306	79.39	339	20.61
23. මොනරාගල	694	24	3.46	74	10.66	169	24.35	241	34.73	508	73.20	186	26.80
24. රත්නපුරය	1593	85	5.34	195	12.24	408	25.61	476	29.88	1164	73.07	429	26.93
25. කෑගල්ල	991	71	7.16	108	10.90	277	27.95	312	31.48	768	77.50	223	22.50
සමස්ත දිවයින	**29851**	**1570**	**115.51**	**3126**	**250.43**	**7223**	**603.21**	**9581**	**849.64**	**21500**	**1818.79**	**8351**	**681.21**

වගුව 3

1.2.4 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91 - 100	0	0.00	48273	100.00
81 - 90	324	0.67	48273	100.00
71 - 80	2511	5.20	47949	99.33
61 - 70	5665	11.74	45438	94.13
51 - 60	7815	16.19	39773	82.39
41 - 50	9053	18.75	31958	66.20
31 - 40	9351	19.37	22905	47.45
21 - 30	8442	17.49	13554	28.08
11 - 20	4710	9.76	5112	10.59
01 - 10	400	0.83	402	0.83
00 - 00	2	0.00	2	0.00

වගුව 4

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- (31 - 40 පන්ති ප්‍රාන්තරය ගතහොත්)

මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් සංඛ්‍යාව 9351කි. එය ප්‍රතිශතයක් වශයෙන් 19.37%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 22905ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 47.45%කි.

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණවලින් පෙන්වා දී ඇත.

උදා:- අපේක්ෂකයන් වැඩි ම සංඛ්‍යාවක් නිවැරදි පිළිතුරු සපයා ඇත්තේ 4 ප්‍රශ්නයට ය. එහි පහසුකා දර්ශකය 0.91කි. එනම් එහි පහසුකාව 91%කි. එයින් පැහැදිලි වන්නේ අපේක්ෂකයන්ගෙන් 91%ක් එම ප්‍රශ්නයට නිවැරදි ව පිළිතුරු සපයා ඇති බව යි.

අවම පහසුකාව 47 ප්‍රශ්නය සඳහා දක්වා ඇත. එහි පහසුකා දර්ශකය 0.17කි. එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 17%ක පිරිසකට, ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සැපයිය හැකි වුව ද අපේක්ෂකයන්ගෙන් 83%කට එම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සැපයීමට නොහැකි වූ බව යි.

1.3.2 **II** ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණවලින් පෙන්වා දී ඇත.

උදා:- මෙහි A කොටසෙහි 1 - 20 දක්වා ප්‍රශ්න අනිවාර්ය වන අතර ප්‍රශ්න සියල්ලට ම කෙටි පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා ප්‍රශ්නයකට ලකුණු එක බැගින් ලකුණු 20ක් හිමි වේ. මෙම කොටස සඳහා පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ගෙන් 99.5%ක් උත්සාහ දරා ඇත.

මෙහි B හා C කොටස්වල, එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය.

ප්‍රස්තාරයට අනුව B කොටසෙන් 75%ක් වූ වැඩි ම අපේක්ෂකයන් ප්‍රතිශතයක් 1 ප්‍රශ්නය ද, 39%ක් වූ අඩු ම ප්‍රතිශතයක් 4 ප්‍රශ්නය ද තෝරා ගෙන ඇත.

මෙහි C කොටසෙන් අපේක්ෂකයන්ගෙන් 78%ක් වූ වැඩි ම ප්‍රතිශතයක් 5 ප්‍රශ්නය ද 17%ක අවම අපේක්ෂකයන් ප්‍රතිශතයක් 8 ප්‍රශ්නය ද තෝරා ගෙන ඇත.

ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

1.3.3 **II** ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :

මෙහි B කොටසේ 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. එම ලකුණින් 76% - 100% ප්‍රාන්තරයේ එනම්, ලකුණු 16 - 20 තෙක් ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 4%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණින් 0% - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 00 - 05 දක්වා ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 46%කි.

ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 4 (RD/16/04/AL) පෝරමයෙන් ලබා ගත් නොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් නොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- පළමුවන ප්‍රශ්නයේ (ii) කොටස පහසුතම ප්‍රශ්නය වන අතර එහි පහසුතා දර්ශකය 0.89කි. එනම් එහි පහසුතාව 89%කි. එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 89%ක් එම ප්‍රශ්නයට සාර්ථක ව පිළිතුරු සපයා ඇති බව යි. අවම පහසුතාව දක්වා ඇත්තේ 18 ප්‍රශ්නයේ II කොටසට වන අතර එහි පහසුතා දර්ශකය 0.04කි. එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගේ 4%ක පිරිසක් පමණක්, මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇති නමුත් 96%ක පිරිසක් සාර්ථක ව පිළිතුරු සැපයීමට අසමත් වී ඇති බව යි



ප්‍රස්තාරය 5 (RD/16/04/AL) පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදි.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත. මෙහි B හා C කොටස් සඳහා එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය.

උදා:- B කොටසෙහි 3 (ii) ප්‍රශ්නය අපේක්ෂකයන්ට පහසු ප්‍රශ්නය වූ අතර එහි පහසුතා දර්ශකය 0.45කි. එනම් එහි පහසුතාව 45%කි. එයින් අදහස් වන්නේ ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන්ගෙන් 45%ක් එම ප්‍රශ්නයට සාර්ථක ව පිළිතුරු සපයා ඇති බව යි. එම කොටසේ 17%ක් වූ අවම පහසුතාව 2 (iii) ප්‍රශ්නය සඳහා දක්වා ඇත.

C කොටසෙහි 52% ක් වූ ඉහළ ම පහසුතාව 7 (i) ප්‍රශ්නය සඳහා දක්වා ඇති අතර 12%ක් වූ අවම පහසුතාව 8 (i) ප්‍රශ්නය සඳහා දක්වා ඇත.

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

- ★ කාලය පැය 02කි.
- ★ වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කි.
- ★ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.
- ★ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

2.1.2 I ප්‍රශ්න පත්‍රය

● අංක **1** සිට **15** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම ප්‍රයෝජනවත් වන්නේ:
A - දේශපාලන ක්‍රමයේ ක්‍රියාකාරිත්වය සහ එමගින් ජනතාවට ඇති බලපෑම තේරුම් ගැනීමට ය.
B - යහපාලනයේ සහ අයහපත් පාලනයේ වෙනස්කම් තේරුම් ගැනීමට ය.
C - රාජ්‍යයේ සහ ආණ්ඩුවේ ආධ්‍යාත්මික පදනම පිළිබඳව දැනගැනීමට ය.
D - ආණ්ඩුවේ බලාධිකාරී තීරණ ගැනීම හා සම්බන්ධ ක්‍රියාදාම පිළිබඳව තේරුම් ගැනීමට ය.
E - දේශීය හා ජාත්‍යන්තර තලයන්හි බල අරගලය කරන්නාවූ මාර්ග සහ විධික්‍රම තේරුම් ගැනීමට ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

2. දේශපාලනය:
A - ආණ්ඩුව පිළිබඳ කලාව මෙන්ම විද්‍යාව ද වේ.
B - අගය කිරීම් බලාධිකාරී බලය යොදවා බෙදාහරින විධික්‍රමය වේ.
C - සමාජ-ආර්ථික හා දේශපාලන ගැටලු අරබයා පවතින ප්‍රතිවිරෝධ අදහස් අතර ඇතිවන ගැටුම්වල ප්‍රතිඵලය වේ.
D - ආගමික අගය කිරීම් පදනම් කරගත් සමාජයක් ගොඩනැගීමේ සදාචාරාත්මක ක්‍රියාවලියක් වේ.
E - දේශපාලන විද්‍යාවේ ප්‍රායෝගික පැත්ත ලෙස සැලකේ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

3. මිනිසුන් රාජ්‍ය ලෙස සංවිධාන වී ඇත්තේ ඇයි?
A - සමාජය තුළ පවතින විෂමතා ආරක්ෂා කර පවත්වා ගෙන යාමට ය.
B - සමාජය පාලනය කිරීම සඳහා පාලන ක්‍රමයක් ගොඩනගා ගැනීමට ය.
C - ජාතික ආරක්ෂාව සුරක්ෂිත කොට පවත්වා ගෙන යාමට ය.
D - සමාජයේ ආර්ථික කාර්යයන් විධිමත් ලෙස සංවිධානය කර ගැනීමට ය.
E - ජනතා පරමාධිපතිත්වය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සුජාතභාවය ලබා ගැනීමට ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

4. දේශපාලන වශයෙන් සංවිධානය වූ සමාජයකට ආණ්ඩුවක් අවශ්‍ය වන්නේ ඇයි?
A - සමාජ ඒකාග්‍රතාව ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා ය.
B - සමාජයේ දිළිඳු කොටසේ අභිලාෂ පමණක් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා ය.
C - ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා ය.
D - නීතිය, ස්ථාවරභාවය, ආරක්ෂාව සහ සමාජ සාධාරණත්වය සැපයීම හා පවත්වා ගෙන යාම සඳහා ය.
E - ආර්ථික කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම හා බාහිර සම්බන්ධතා කළමනාකරණය කිරීම සඳහා ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

5. ස්වාධිපත්‍ය බලය:
A - රාජ්‍යයේ බලය පිළිබඳව සැලකිලිමත් වන දේශපාලන න්‍යාය වේ.
B - දේශීය සහ ජාත්‍යන්තර දේශපාලනය හසුරුවන ප්‍රධානතම න්‍යායාත්මක සංකල්පය වේ.
C - සමාජයට සහ අනෙක් සමාජ සංවිධානවලට ඉහළින් රාජ්‍යය අසහායත්වයට පත් කරන දේශපාලන සිද්ධාන්තය වේ.
D - රාජ්‍ය කැමැත්ත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සුජාතභාවය සපයන දේශපාලන න්‍යාය වේ.
E - සන්ධීය දේශපාලන ක්‍රමයක් තුළ පවා අසහාය සහ බෙදිය නොහැකි බවට සලකනු ලැබේ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

6. ධනවාදය:
A - ආරම්භක අවස්ථාවේ දී ගොඩනැගුවේ රාජ්‍ය නිර්බාධවාදී මූලධර්මය පදනම් කරගෙන ය.
B - පූර්ණ වෙළෙඳපොළ තරගය වර්ධනය කිරීම ඉලක්ක කොටගෙන ඇත.
C - 'වෙළෙඳපොළ ආර්ථිකය පාලනය නොකරන විට නිරායාසයෙන්ම සමතුලිතභාවය කරා ගමන් කරනු ඇත' යන විශ්වාසය මත ගොඩනගා ඇත.
D - නිදහස් වෙළෙඳපොළ ධනවාදය සහ රාජ්‍ය ධනවාදය යන ආකෘති යටතේ නූතන ලෝකය තුළ ක්‍රියාත්මක වේ.
E - ආර්ථික වෘද්ධිය සමග යළි බෙදාහැරීම යන ප්‍රතිපත්තිය මගින් සමාජ සාධාරණත්වය ඇති කිරීම ගැන සැලකිලිමත් වේ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

7. සමාජවාදය:

A - සමාන පුරවැසිභාවය සහ සමාන ඉඩප්‍රස්ථා යන මූලධර්මය පදනම් කරගත් සමාජ ක්‍රමයක් වේ.
B - නිෂ්පාදනය සහ බෙදාහැරීමේ මාධ්‍යයන් රාජ්‍ය අයිතිය පදනම් කරගත් ආර්ථික ක්‍රමයක් වේ.
C - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයට විකල්ප දේශපාලන ක්‍රමයක් වේ.
D - බහු පක්ෂ ක්‍රමයක් පදනම් කරගෙන ක්‍රියාවට නැංවෙන පාලන ක්‍රමයක් වේ.
E - ධනවාදය මගින් නිර්මාණය කර ඇති සමාජ අසමානත්වය පිළිබඳ ප්‍රශ්නයට විසඳුම් සෙවීමට උත්සාහ දරන දේශපාලන මතවාදයක් වේ.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

8. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය:

A - වෙළඳපොළ ආර්ථික ක්‍රමයට සහ විප්ලවකාරී සමාජවාදයට විකල්පයක් වන ආර්ථික මාදිලියක් වේ.
B - වෙළඳපොළ ආර්ථික ක්‍රමය සහ සමාජ සාධාරණත්වය අතර එකඟතාවක් නිර්මාණය කිරීම පිළිබඳ ව සැලකිලිමත් වේ.
C - 'සමාජ වෙනස් වීම විප්ලවය මගින් කළ යුතු ය' යන මාක්ස්ගේ න්‍යාය පිළිගන්නා දේශපාලන න්‍යායක් වේ.
D - වෙළඳපොළ ආර්ථික ක්‍රමය, විකාශනාත්මක සමාජවාදය සහ සුබසාධක රාජ්‍ය ක්‍රමය යන මුල්ගල් තුන මත ගොඩනගා ඇත.
E - ප්‍රජාතන්ත්‍රවාදී මාර්ග මගින් සමාජවාදී සමාජ ක්‍රමයක් නිර්මාණය කිරීම ඉලක්ක කරගෙන ඇත.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

9. කැබිනට් ආණ්ඩුක්‍රමයේ මූලික ලක්ෂණ:

A - සත්‍ය සහ නාමික වශයෙන් හඳුන්වන ද්විත්ව විධායකයක පැවැත්ම
B - නාමික විධායකය විසින් ව්‍යවස්ථාදායකයේ සාමාජිකයින් අතුරෙන් සත්‍ය විධායකය පත් කිරීම
C - සත්‍ය විධායකය සෘජුවම ව්‍යවස්ථාදායකයට වගකීම
D - විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර බලතල හා කාර්යයන් විධිමත් අයුරින් බෙදා නොතිබීම
E - නිශ්චිත නිල කාලයක් සඳහා ජනතාව විසින් සෘජුව පත් කරනු ලබන නාමික විධායකයක් නිබීම

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

10. ජනාධිපති ආණ්ඩුක්‍රමයේ මූලික ලක්ෂණ:

A - එකිනෙකට වෙනස් මැතිවරණ දෙකකින් විධායකය සහ ව්‍යවස්ථාදායකය සෘජුව තෝරා පත්කර ගැනීම
B - විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර බලතල බෙදීම
C - සංවරණ හා තුලන මූලධර්මය මත විධායකය සහ ව්‍යවස්ථාදායකය සිය බලතල ක්‍රියාවට නැංවීම
D - විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර පවතින සමීප සහයෝගිතාව
E - විධායකය සෘජුව ව්‍යවස්ථාදායකයට වගනොකීම

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

11. අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ:

A - ජනාධිපති සහ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයකින් සමන්විත ද්විත්ව විධායකයක් පැවතීම
B - ජනතාව විසින් ජනාධිපතිවරයා තෝරාපත් කිරීම සහ ජනාධිපතිවරයා විසින් අගමැති සහ කැබිනට් මණ්ඩලය පත් කරනු ලැබීම
C - අගමැති සහ කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයට සෘජුව වගකීම
D - ජනාධිපතිධුරය රාජ්‍යයේ විධායක බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර ආයතනය වීම
E - අගමැතිවරයා ආණ්ඩුවේ නායකත්වය දැරීම

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

12. ඒකතාන්ත්‍රික ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ:

A - පාලකයා විසින් අත්තනෝමතික ලෙස රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම
B - ජනතාවගේ ආගමික විශ්වාස පාලකයා කඩකරන විට පාලකයා තනතුරින් ඉවත් කිරීමට ජනතාවට හැකි වීම
C - ජනතා කැමැත්ත නොසලකා හරිමින් පාලකයාගේ කැමැත්ත සමාජය මත පනිත කිරීම
D - තනි දේශපාලන පක්ෂයක පැවැත්ම හෝ දේශපාලන පක්ෂ මුළුමනින්ම නොපැවතීම
E - රාජ්‍යය සහ සිවිල් සමාජය අතර වෙනසක් නොපැවතීම

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

13. ඒකීය ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ

A - මධ්‍යය සහ පරිධිය අතර බල හවුල්කාරිත්වය පදනම් කරගෙන රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම
B - මධ්‍යම ආණ්ඩුව විසින් අවධාරිත කරන ලද බලය සහිත පළාත් ආණ්ඩුක්‍රමයක පැවත්ම
C - ඒකීය පුරවැසිභාවයක් පැවැතීම
D - රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම පිළිබඳ මධ්‍යම ආණ්ඩුවේ ඒකාධිකාරිත්වය
E - සියලු ම උප-ජාතික ආණ්ඩුවලට ඉහළින් තිබෙන මධ්‍යම ආණ්ඩුවේ අසහාය ආධිපත්‍යය

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

14. සන්ධීය ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණ

A - ආණ්ඩුව ජාතික සහ උප-ජාතික වශයෙන් මට්ටම් දෙකකින් ව්‍යුහගත කර තිබීම
B - ස්වාධිපති බලය මධ්‍යය සහ පරිධිය අතර බෙදා තිබීම
C - සන්ධීය ක්‍රමයට නීතිමය පදනම් සපයන ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබීම
D - නීතිමය හෝ දේශපාලන වශයෙන් එකිනෙකට යටත් නොවන සමාන පාර්ශ්වකරුවන් සිටීම
E - රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ මනා කාර්යක්ෂමතාවක් පැවතීම

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

15. නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම තුළ දේශපාලන විධායකය

A - ආණ්ඩුක්‍රම යාන්ත්‍රණයේ අත්‍යවශ්‍ය අංගයක් වන අතර එය නොමැතිව කිසිදු ආණ්ඩුවකට ක්‍රියාත්මක නොහැකි ය.
B - ඡන්දදායකයන් විසින් තෝරාපත් නොකරන ලද අය විසින් ද දැරිය හැකි වේ.
C - කැබිනට්, ජනාධිපති සහ අර්ධ-ජනාධිපති යන ආකෘති අනුව සංවිධානය කර තිබේ.
D - නීති සහ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම පිළිබඳව වගකිව යුතු වේ.
E - එක් පුද්ගලයෙකුගෙන් හෝ පුද්ගලයින් කිහිප දෙනෙකුගෙන් හෝ සමන්විත කුඩා මණ්ඩලයක් වේ.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

- අංක **16** සිට **25** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධ ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවා **එක්** ප්‍රකාශයක් සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

16. නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම තුළ ව්‍යවස්ථාදායකය

(1) සාමාන්‍යයෙන් සමන්විත වන්නේ ජනතාව තෝරාපත් කරන ගිහි දේශපාලනඥයන්ගෙනි.
(2) සමස්ත ජාතියම නියෝජනය කරන නියෝජිතයින්ගෙන් සමන්විත විශාල මණ්ඩලයක් වේ.
(3) විවාද කිරීමේ ප්‍රධාන ජාතික සභාව ලෙස සැලකේ.
(4) ආණ්ඩුවේ කාර්යයන්ට සුජාතභාවය සැපයීමේ වගකීම දරනු ලැබේ.
(5) ජාතික අයවැය සම්පාදනය කිරීමේ හා ක්‍රියාවට නැංවීමේ වගකීම දරනු ලැබේ.

17. නූතන දේශපාලන ක්‍රම තුළ අධිකරණය:

(1) ආණ්ඩුවෙන් ස්වාධීන වූ රාජ්‍ය ආයතනයක් වේ.
(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හෝ ව්‍යවස්ථාදායකය පනවන පනත් හෝ මගින් පිහිටුවනු ලැබේ.
(3) ඉහළ සහ පහළ වශයෙන් ස්ථර දෙකක් අනුව සංවිධානය කරනු ලැබේ.
(4) නීතිය විනිශ්චය කිරීමේ බලය පැවරෙන ආණ්ඩුවේ ශාඛාව වේ.
(5) විධායකයේ අධීක්ෂණයට යටත්ව තම කාර්යයන් ඉටු කළ යුතු වේ.

18. නීතිය:

(1) රාජ්‍යය විසින් පනවනු ලබන පොදු රීති පද්ධතියක් වේ.
(2) මිනිසුන්ගේ ආධ්‍යාත්මික ජීවිතය පාලනය කිරීම පිළිබඳව සැලකිලිමත් වේ.
(3) සියලු දෙනාටම සමානව අදාළ වන බව පිළිගැනේ.
(4) දේශපාලන ක්‍රමයක් තුළ මිනිසුන්ට කළ හැකි හා කළ නොහැකි දේ විධානය කරන ප්‍රධාන දර්ශකය වේ.
(5) ජනතාවගේ නිදහස ආරක්ෂා කරන ප්‍රධාන ආරක්ෂකයා ලෙස සැලකේ.

19. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:

(1) ආණ්ඩුකරණයට නීතිමය පදනම් සපයන නීති අන්තර්ගත ලියවිල්ල වේ.
(2) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සලකනු ලැබේ.
(3) දේශපාලකයින්ගේ අයිවාසිකම් හා යුතුකම් ආරක්ෂා කරන ලියවිල්ල ලෙස සලකනු ලැබේ.
(4) රාජ්‍යය සහ පුරවැසියන් අතර සම්බන්ධතාව පෙන්නුම් කරන ප්‍රධාන නීතිමය ලියවිල්ල වේ.
(5) ව්‍යවස්ථානුකූලවාදයේ වර්ධනයට පදනම් සපයන ලියවිල්ල වේ.

20. සිවිල් සමාජය:
(1) පොදුවේ පිළිගත් අර්ථ නිරූපණයක් නොමැති සංකල්පයක් වේ.
(2) රාජ්‍ය පාලනයෙන් පරිබාහිරව පවතින සමාජ ජීවිතයේ එක් පැතිකඩක් එමගින් විස්තර කරනු ලැබේ.
(3) දේශපාලන සමාජයට අනන්‍ය වන බව පිළිගනු ලැබේ.
(4) විශේෂිත වූ මෙන්ම සීමිත අරමුණු කිහිපයක් උදෙසා පවතින සාමූහික සමාජ සංගතයක් ලෙස විස්තර කරනු ලැබේ.
(5) ස්වේච්ඡා සංවිධානවලින් සහ සමාජ කණ්ඩායම්වලින් ගොඩනැගී ඇත.

21. පුරවැසිභාවය:
(1) රටක ජීවත් වන සියලු දෙනාට ම හිමි නීතිමය අයිතිවාසිකමක් වේ.
(2) දේශපාලන සමාජයක ජීවත් වන පුරවැසියන්ට විශේෂිත ජාතිකත්වයක් ආරෝපණය කරන නීතිමය ව්‍යවහාරයක් වේ.
(3) උප්පත්තිය මගින් හෝ ලියාපදිංචි වීම මගින් හිමිකර ගත හැකි නීතිමය තත්ත්වයක් වේ.
(4) භුක්ති විඳින අයට දේශපාලන සමාජයක සමාන සහ පූර්ණ සාමාජිකත්වය හිමිකර දෙන නීතිමය තත්ත්වයක් වේ.
(5) රාජ්‍යය සහ පුරවැසියන් අතර සම්බන්ධතාවය නිරූපණය කරන නීතිමය තත්ත්වයක් වේ.

22. නියෝජනය:
(1) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය තුළ පාලකයින් සහ පාලිතයින් එකට සම්බන්ධ කරන ප්‍රධාන පුරුක වේ.
(2) තෝරාපත් කිරීමට සහභාගි වන අය සහ තේරීපත් වන අය අතර පවතින සම්බන්ධතාව පෙන්නුම් කරන නිර්නායකයක් වේ.
(3) ක්‍රියාවට නැංවිය හැක්කේ මැතිවරණ මගින් පමණි.
(4) භාරකාරත්වය, අවධාරිත කිරීම, අවසර දීම සහ සාදෘශ්‍යය (පෙනී සිටීම) යනුවෙන් විධි ක්‍රම හතරකින් යුක්ත වේ.
(5) දේශපාලන ක්‍රමයක දේශපාලන, ආර්ථික හා සමාජ කොටස්වලට සාධාරණ නියෝජනයක් සහතික කරන එකම ක්‍රමය වේ.

23. දේපළ:
(1) පෞද්ගලික, පොදු සහ රාජ්‍ය වශයෙන් වර්ග කිහිපයකින් සමන්විත වේ.
(2) දේපළ අයිතිය හෝ හිමිකම් පිළිබඳ අයිතිය ලෙස නීතියෙන් පිළිගෙන ඇත.
(3) චංචල හා නිශ්චල වශයෙන් කොටස් දෙකකට වර්ග කර ඇත.
(4) හිමිකමට, භුක්තිවිඳීමට, පැවරීමට, පාලනය කිරීමට, ආදායම් ඉපයීමට සහ විකිණීමට ඇති අයිතිය යන ගුණාංගවලින් යුක්ත වේ.
(5) කොමියුනිස්ට් පාලන ක්‍රම තුළ පවා මූලික මිනිස් අයිතියක් ලෙස පිළිගෙන ඇත.

24. අයිතිවාසිකම්:
(1) මානව අභිමානය තහවුරු කරන්නා වූ මනුෂ්‍යයන්ට හිමි දෙයක් වේ.
(2) බැඳීම් හා සමපාත වන බවට හඳුනාගෙන ඇත.
(3) නීතිමය හා සදාචාරාත්මක ලෙස දෙයාකාර ස්වරූපයක් ගනී.
(4) පුද්ගලයින්ගේ පෞද්ගලික වර්ධනය සහ ඔවුන්ගේ සාමූහික පැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය යැයි පිළිගෙන ඇත.
(5) සාධනීය හා නිෂේධනීය වශයෙන් කොටස් දෙකකට වර්ග කර ඇත.

25. දේශපාලන පක්ෂ:
(1) මැතිවරණ මගින් හෝ වෙනත් මාර්ග මගින් හෝ ආණ්ඩු බලය ජයග්‍රහණය කිරීම අරමුණු කොටගෙන සංවිධානය වූ පුද්ගල කණ්ඩායම් වේ.
(2) ආඥාදායක පාලන ක්‍රම තුළ පවා ක්‍රියාත්මක වීමේ නිදහස භුක්ති විඳියි.
(3) ව්‍යක්තීය, ක්‍රියාකාරී හා සාමාන්‍ය යනුවෙන් ත්‍රිවිධාකාර සාමාජිකයන්ගෙන් සමන්විත වේ.
(4) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රම තුළ ජනතාවගේ දේශපාලන කැමැත්ත නියෝජනය කරන ප්‍රධාන ක්‍රියාධරයින් වේ.
(5) කේඩර සහ ජනතාවාදී, නියෝජන සහ අනුකලන, ව්‍යවස්ථානුකූල සහ විප්ලවකාරී, වාමාංශික හා දක්ෂිණාංශික වශයෙන් වර්ග කරනු ලැබේ.

● අංක **26** සිට **35** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළව ප්‍රකාශ පහක් දී ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

26. 1833 කෝල්බෘක්-කැමරන් කොමිසම මගින් යෝජනා කරනු ලැබුයේ:
A - ආණ්ඩුකාරවරයාට අතිරේක බලතල පැවරීම මගින් ආණ්ඩුකාරවරයාගේ තත්ත්වය ශක්තිමත් කිරීම
B - විධායක සහ ව්‍යවස්ථාදායක කාර්යයන් කිරීම සඳහා ආණ්ඩුකාරයාට සහාය වීම පිණිස විධායක සහ ව්‍යවස්ථාදායක සභා පිහිටුවීම
C - නිදහස් ශ්‍රම වෙළෙඳපොළ වර්ධනය වීමට මග පෑදීම උදෙසා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම
D - උඩරට සහ මුහුදුබඩ පලාත් එක් කිරීම මගින් ලංකාව ඒකීය පාලන ක්‍රමයක් යටතට ගෙන ඒම
E - වෙළෙඳපොළ ආර්ථිකය වර්ධනය කිරීම උදෙසා රාජ්‍ය වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

27. 1911-1924 කාලය තුළ ක්‍රියාත්මක කළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මගින්:
A - මැතිවරණ දේශපාලනය හරහා ආණ්ඩුකරණයට සහභාගි වීමට ජනතාවට දොර විවෘත කරනු ලැබී ය.
B - අයවැය කටයුතු සඳහා සභාය වීමට මුදල් කාරක සභාව පිහිටුවනු ලැබී ය.
C - ව්‍යවස්ථාදායක සභාවේ නිලනොලත් සාමාජිකයින්ගේ සංඛ්‍යාව අඩු කෙරිණ.
D - ආණ්ඩුකාරවරයාගේ බලතල නොවෙනස්ව පවත්වා ගෙන යනු ලැබී ය.
E - ව්‍යවස්ථාදායක සභාවේ නිලනොලත් සාමාජිකයින්ගේ බලකල අනුක්‍රමයෙන් වැඩි කෙරිණ.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

A - බටහිර අධ්‍යාපනය ලත් උගත් මධ්‍යම පාන්තික කණ්ඩායමක් විසින් පිහිටුවන ලද සංවිධානයක් විය.
B - බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය තුළ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ලබා ගැනීම අරමුණ කරගත්තේ ය.
C - කුල, වාර්ගික, ආගමික ආදී විවිධ අභ්‍යන්තරික බෙදීම් හේතුවෙන් අභිශයින්ම දුර්වල වූ සංවිධානයක් විය.
D - බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව පැන නැගුන කම්කරු අරගලවලට ප්‍රතිරෝධකයක් ලෙස සංවිධානය කරන ලදී
E - සාමාන්‍ය ජනතාවගේ ආශාවන්ට වඩා සමාජ ප්‍රභූන්ගේ ආශාවන් ගැන වැඩියෙන් සැලකිලිමත් වූ සංවිධානයක් විය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

29. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ සුවිශේෂී ලක්ෂණ වූයේ:
A - ස්වදේශික සහ යටත්විජිත නියෝජිතයින්ගෙන් සමන්විත වූ අමාත්‍ය මණ්ඩලයක් පැවතීම
B - ව්‍යවස්ථාදායක සභ විධායක බලතල දෙවර්ගයම පැවරූ ව්‍යවස්ථාදායකයක් තිබීම

29. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ සුවිශේෂී ලක්ෂණ වූයේ:
A - ස්වදේශික සහ යටත්විජිත නියෝජිතයින්ගෙන් සමන්විත වූ අමාත්‍ය මණ්ඩලයක් පැවතීම
B - ව්‍යවස්ථාදායක සභ විධායක බලතල දෙවර්ගයම පැවරූ ව්‍යවස්ථාදායකයක් තිබීම
C - සාමාන්‍ය අවස්ථාවලදී නාමික විධායකයෙකු ලෙස ක්‍රියා කළ යුතු බවට අපේක්ෂා කළ ආණ්ඩුකාරවරයකු සිටීම
D - රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සියලු ම මන්ත්‍රීවරුන්ගෙන් සැලුම්ලත් විධායක කාරක සභා හතක් පැවතීම
E - අධිරාජ්‍ය ආණ්ඩුවේ අභිලාෂ වෙනුවෙන් පෙනී සිටී මුර බල්ලන් නමින් හැඳින්වුන රාජ්‍ය නිලධාරීන් තිදෙනකු සිටීම
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

30. 1931 දී සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම කෙරෙහි ඩොනමෝර් කොමිසමට බලපෑ සාධක:
A - සමාජයේ අවවරප්‍රසාදිත කොටස් සවිබල ගැන්වීමේ අවශ්‍යතාව
B - ආණ්ඩුකරණය තුළ සමාජ ප්‍රභූන්ගේ කතිපයාධිකාරී නායකත්වය දුර්වල කිරීමේ අවශ්‍යතාව
C - දේශපාලනඥයින් ඡන්දදායකයින්ට ඇති වගකීම වැඩි කිරීමේ අවශ්‍යතාව
D - සාමාන්‍ය ජනතාවට වඩාත් සක්‍රිය ලෙස දේශපාලනයට සහභාගි වීමට මාවත පැදීමේ අවශ්‍යතාව
E - ජනතාව දේශපාලන වශයෙන් සවිබල ගැන්වීම මගින් යටත් විජිත පාලනයට එරෙහි හැඟීම් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

31. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අංග ලක්ෂණ:

A - නාමික හා සත්‍ය යනුවෙන් නිල නාමවලින් හැඳින්වූ ද්විත්ව විධායකය

B - ලංකාව ඉල්ලා සිටින්නේ නම් ලංකාව වෙනුවෙන් නීති පැනවීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට පවරන ලද බලය

C - පහළ මන්ත්‍රී මණ්ඩලයෙන් පමණක් තෝරාපත් කරගත් නියෝජිතයින්ගෙන් සමන්විත සත්‍ය විධායකය

D - නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් සහ සෙනෙට් සභාවෙන් සමන්විත ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකය

E - බ්‍රිතාන්‍ය රාජාධිකරණය මුල්කොට ගත් අධිකරණය

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

32. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යස්ථාව යටතේ සංස්ථාපනය කළ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය:

A - තෝරාපත් කළ සහ නාමකරණයෙන් පත්කළ සාමාජිකයින් වශයෙන් දෙවර්ගයකින් සමන්විත විය.

B - නීති සම්පාදනය සම්බන්ධයෙන් හිමිවූ බලය සීමිත විය.

C - අග්‍රාණ්ඩුකාරයා විසින් ක්‍රියාවට නැංවූ කැඳවීම, කල් තැබීම සහ විසුරුවාහැරීම යන බලතලවලට යටත්ව ක්‍රියාත්මක විය.

D - බ්‍රිතාන්‍ය කිරීටයේ කැමැත්ත සහිතව නාමික විධායකය තනතුරෙන් ඉවත් කිරීමේ බලය හිමි විය.

E - නියමිත නිල කාලයට ප්‍රථමයෙන් විසුරුවා නොහැරියහොත් පස් අවුරුදු නිල කාලයක් භුක්ති වින්දේ ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

33. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:

A - ශ්‍රී ලංකාව නිදහස් ස්වෛරී ස්වාධීන ජනරජයක් බවට පත් කළේ ය.

B - ජනාධිපති ආණ්ඩුක්‍රමයක් සංස්ථාපනය කළේ ය.

C - බ්‍රිතාන්‍ය කිරීටය රාජ්‍ය නායකයා වශයෙන් පිළිගැනීම අත්හළේ ය.

D - විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ බලතල එක්තැන් කළ ඒකමණ්ඩල ව්‍යවස්ථාදායකයක් පිහිටුවීය.

E - පූර්ව අධිකරණ විවරණ බලය සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

34. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය:

A - ජනාධිපති යන නිල නාමයෙන් හැඳින්විණ.

B - සිව් අවුරුදු නිල කාලයක් සඳහා අගමැතිවරයා විසින් පත් කරන ලදී.

C - නිල කාලය තුළදී සිවිල් හෝ අපරාධ නඩු පැවරීමෙන් වැළකීමේ මුක්තිය හිමිවිය.

D - පනත්වලට අවසාන අනුමැතිය දීමේ බලය හිමිවිය.

E - කාර්යයන් සහ වගකීම් ඉටු කිරීමේ දී අගමැති සහ කැබිනට් මණ්ඩලයේ උපදෙස් පිළිපැදිය යුතු විය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

35. 1978 දෙවන ජනරජ මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්

A - දෙමුහුන් ජනාධිපති ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කෙරිණ.

B - අර්ධ ව්‍යවස්ථාදායක බලය සහිත ව්‍යවස්ථාදායකයක් පිහිටුවනු ලැබිණ.

C - ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වය යටතේ අධිකරණ ක්‍රමය ප්‍රතිව්‍යුහගත කෙරිණ.

D - සිංහල සහ දෙවිඩ භාෂා ජාතික භාෂා බවට පත් කෙරිණ.

E - ව්‍යවස්ථාවේ අන්තර්ගත රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම අධිකරණ විනිශ්චයට යටත් විය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

● අංක **36** සිට **44** දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ අතුරෙන් එකක් **සාවද්‍ය** වේ. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

36. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා රාජ්‍යය:

(1) නිදහස් ස්වෛරී ස්වාධීන ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයක් වේ.

(2) ඒකීය රාජ්‍යයක් වේ.

(3) ජනරජයක් වන අතර එහි පරමාධිපත්‍ය බලය ජනතාව සතු වේ.

(4) ස්වාධීන ස්වෛරී පළාත් නවයකින් සමන්විත ජනරජයක් වේ.

(5) බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දී ඇති ජනරජයකි.

37. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පුරවැසියන් ඉටු කළ යුතු මූලික යුතුකම් සහ බැඳීම් කිහිපයක් වන්නේ:
(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය ආරක්ෂා කොට අනුගමනය කිරීම
(2) ජාතික අභිලාෂ වර්ධනය කිරීම හා ජාතික සමගිය පෝෂණය කිරීම
(3) තමන්ගේ ආගම සහ භාෂාව වර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට කටයුතු කිරීම
(4) පොදු දේපළ සුරක්ෂිත කොට ආරක්ෂා කිරීම සහ පොදු දේපළ අයථා ප්‍රයෝජනයට ගැනීමට සහ නාස්ති කිරීමට එරෙහිව කටයුතු කිරීම
(5) සෙසු අයගේ අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස ගරු කිරීම

38. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන වගන්තියට අනුව ජනරජයේ පරමාධිපත්‍ය බලය ජනතාව සතුවේ. 4 වන වගන්තියට අනුව ජනතාව සතු පරමාධිපත්‍යය ක්‍රියාවට නැංවිය යුත්තේ:
(1) ව්‍යවස්ථාදායක බලය පාර්ලිමේන්තුව සහ ජනමත විචාරණ මගිනි.
(2) ජාතික ආරක්ෂාව ඇතුළු විධායක බලය ජනතාව තෝරාපත් කරන ජනාධිපතිවරයා මගිනි.
(3) අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ වෙනත් නීතිවලින් පිහිටුවන අධිකරණ මගින් පාර්ලිමේන්තුව විසිනි.
(4) සර්වජන ඡන්ද බලය මැතිවරණ සහ ජනමත විචාරණ මගිනි.
(5) මූලික අයිතිවාසිකම් නීතිපතිවරයා මගිනි.

39. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ප්‍රදානය කර ඇති මූලික අයිතිවාසිකම්:
(1) සියලු ම පුද්ගලයින්ට භුක්ති විඳිය හැකි සහ පුරවැසියන්ට පමණක් භුක්ති විඳිය හැකි යනුවෙන් වර්ග දෙකකින් යුක්ත වේ.
(2) විධායක හෝ පරිපාලන ක්‍රියාවකින් උල්ලංඝනය වූ විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වගන්තිය යටතේ අධිකරණ විනිශ්චයට යොමු කළ හැකි ය.
(3) භුක්ති විඳිය හැක්කේ ව්‍යවස්ථාවේ 15 වගන්තියේ දක්වා තිබෙන සීමාවලට යටත්ව ය.
(4) මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ අන්තර්ගත සියලු අයිතිවාසිකම්වලට අනන්‍යසම වේ.
(5) ආණ්ඩුවේ සියලු ම ආයතන විසින් පිළිගැනීම, ගරු කිරීම, ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම කළ යුතු ය.

40. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30(1) වගන්තියට අනුව ජනාධිපතිවරයා ආණ්ඩුවේ ප්‍රධානියා වේ. ඒ අනුව ජනාධිපතිවරයා:
(1) කැබිනට් මණ්ඩලයේ සාමාජිකයින් පත් කරමින් ඔවුන්ට අමාත්‍යාංශ පවරා දෙයි.
(2) කැබිනට් රැස්වීම්වල මුලසුන දරයි.
(3) රාජ්‍ය ප්‍රතිපත්තිවලට අවසාන අනුමැතිය දෙයි.
(4) අමාත්‍යාංශ ලේකම්වරුන් පත්කරයි.
(5) පාර්ලිමේන්තුවේ කතානායකවරයා පත්කරයි.

41. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කැබිනට් මණ්ඩලය:
(1) පාර්ලිමේන්තුවේ නියෝජිතයින් අතුරින් තෝරාගත් සාමාජිකයින්ගෙන් හා ජනාධිපතිවරයා/වරියගෙන් සමන්විත වේ.
(2) ආණ්ඩුව මෙහෙය වීම හා ඒ පිළිබඳ පාලනය භාරව ක්‍රියා කළ යුතු වේ.
(3) පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට බැඳී සිටී.
(4) පාර්ලිමේන්තුවේ සම්මත කරන විශ්වාසභංග යෝජනාවක් මගින් විසුරුවා හැරීමට යටත් ය.
(5) අවම වශයෙන් මසකට වරක්වත් රැස්වීම් පැවැත්විය යුතු ය.

42. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සංස්ථාපනය කළ පාර්ලිමේන්තුව:
(1) පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය මූලධර්මය යටතේ පිහිටුවා ඇත.
(2) සාමාජිකයින් 225න් සමන්විත වන අතර එයින් 196ක් ජනතාව විසින් ද ඉතිරිය නාමකරණයෙන් ද පත්කරනු ලැබේ.
(3) 19 වන සංශෝධනය මගින් එහි නිල කාලය අවුරුදු පහකට සීමා කර ඇත.
(4) අවම වශයෙන් සැම වර්ෂයකම එක් වරක්වත් රැස්විය යුතු ය.
(5) එයට හිමි ව්‍යවස්ථාදායක බලය අත්නොහළ යුතු අතර කිසිම ආකාරයකින් අන්සතු නොකළ යුත්තේ ය.

43. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සංස්ථාපනය කළ අධිකරණ ක්‍රමය:
(1) ජනතාව සතු අධිකරණ බලය පාර්ලිමේන්තුව විසින් ක්‍රියාවට නංවන හස්තය වේ.
(2) ඉහළ සහ පහළ අධිකරණ වශයෙන් මට්ටම් දෙකකින් යුක්ත ය.
(3) අධිකරණ සේවා කොමිසමේ මෙහෙය වීම සහ පාලනය යටතේ ක්‍රියාත්මක විය යුතු ය.
(4) ඉහළ අධිකරණ දෙකකින් සහ පහළ අධිකරණ වර්ග කිහිපයකින් සමන්විත වේ.
(5) ව්‍යුහගත කර තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නායකත්වය යටතේ වන අතර එය උසස්ම හා අවසාන උත්තරීතර අධිකරණය වේ.

44. 1978 ව්‍යවස්ථාවට හඳුන්වා දෙන ලද 19 වන සංශෝධන යටතේ ජනාධිපතිවරයාට පැවරුණු නව කාර්යයන් හා වගකීම් වන්නේ:
(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද ආරක්ෂා කරන බවට ද වගබලා ගැනීම
(2) ජාතික ප්‍රතිසංධානය සහ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම
(3) රාජ්‍ය සේවයේ දූෂණ සහ අල්ලස් තුරන් කිරීම සඳහා නව නීති පැනවීම
(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VII අ පරිච්ඡේදයේ සඳහන් ආයතනවල විධිමත් ක්‍රියාකාරිත්වය සහතික කිරීම හා පහසු කිරීම
(5) නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණය නිර්මාණය කිරීම සහ තහවුරු කිරීම

● අංක **45** සිට **50** දක්වා ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙකක් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන කවර ප්‍රකාශය දැ'යි සඳහන් කරන්න.

අංක 1 වගුව සඳහා යොමුව

අංකය	ප්‍රකාශය 1	ප්‍රකාශය 2
(1)	සත්‍ය	සත්‍ය
(2)	සත්‍ය	අසත්‍ය
(3)	අසත්‍ය	සත්‍ය
(4)	අසත්‍ය	අසත්‍ය
(5)	සත්‍ය	සත්‍ය වන අතර පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙයි.

වගුව 1

	ප්‍රකාශය 1	ප්‍රකාශය 2
45.	ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා තෝරන්නේ නියෝජිතයින් 536 දෙනෙකුගෙන් සමන්විත ඡන්ද විද්‍යාලයක් මගිනි.	වොෂින්ටන් DC හැරුණු විට අනෙක් සෑම ප්‍රාන්තයකටම ඒවායේ භූමිය සහ ජනගහනය අතර පවතින වෙනස්කම් නොසලකමින් සමාන නියෝජිත සංඛ්‍යාවක් ඡන්ද විද්‍යාලයට තෝරාපත් කිරීමේ හිමිකම ඇත.
46.	බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අලිඛිත බව පොදුවේ පිළිගැනේ. එම හේතුවෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම්‍ය එකක් වන බව ද පොදුවේ පිළිගැනේ.	එබැවින් බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා විශේෂිත ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම අවශ්‍ය නොවන අතර එකී ව්‍යවස්ථා සංශෝධනය සාමාන්‍ය බහුතර ඡන්දයෙන් සම්මත කරගත හැකි ය.
47.	ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩුවේ ජනාධිපතිවරයා සිවි අවුරුදු නිලකාලයක් සඳහා ඡන්ද විද්‍යාලයක් මගින් තෝරාපත් කරන අතර ඡන්ද විද්‍යාලය සමන්විත වන්නේ මධ්‍යම ආණ්ඩුවේ පාර්ලිමේන්තුවේ සියලු ම මන්ත්‍රීවරුන්ගෙනි.	ඇමරිකා එක්සත් ජනපදයේ මෙන් ඉන්දියාව තුළ ජනාධිපති තනතුරට එක් පුද්ගලයෙකුට පත්විය හැකි වාර ගණන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සීමාකර නැති අතර එක් පුද්ගලයෙකුට ඕනෑම වාර ගණනක් තේරී පත් විය හැක.
48.	ප්‍රාංශය තුළ ආණ්ඩුවේ සියලුම සාමාජිකයින් අගමැතිවරයා විසින් තම අභිමතය පරිදි පත් කරනු ලැබේ.	ප්‍රාංශයේ ආණ්ඩුව තම කාර්යයන් සම්බන්ධයෙන් ජාතික මන්ත්‍රණ සභාවට වගකිව යුතු අතර වගකීම කඩකරන විට විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීම මගින් ආණ්ඩුව බලයෙන් ඉවත් කිරීමට ජාතික මන්ත්‍රණ සභාවට හැකියාව තිබේ.
49.	රාජ්‍යය තුළ ජීවත් වන ජනතාවගේ සමාජ යහපත ඉහළ දැමීමේ අරමුණු ඉටු කර ගැනීම හා සම්බන්ධ ආණ්ඩුවල ක්‍රියා රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස අර්ථකථනය කළ හැක.	එම කාර්යයන් බෙදාහැරීම්, බදු අයකිරීම්, නියාමනය හා සංකේතාත්මක යනුවෙන් කොටස් හතරකට වර්ග කළ හැකි ය.
50.	අන්තර්ජාතික දේශපාලනය සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ ජාතික අභිලාෂ වර්ධනය කිරීම ඉලක්ක කරගෙන ජාතීන් අතර කෙරෙන්නාවූ දේශපාලනය ලෙස ය.	අන්තර්ජාතික දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාධරයින් අන්තර් රාජ්‍ය සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන වේ.

2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01	3	26	5
02	2	27	3
03	5	28	2
04	4	29	2
05	1	30	1
06	1	31	3
07	2	32	2
08	3	33	4
09	1	34	2
10	2	35	1
11	1	36	4
12	4	37	3
13	5	38	5
14	1	39	4
15	4	40	5
16	5	41	5
17	5	42	1
18	2	43	3
19	3	44	3
20	3	45	4
21	1	46	5
22	3	47	3
23	5	48	3
24	2	49	5
25	2	50	2

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.



ප්‍රස්තාරය : 6

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

මෙහි පළමු හා දෙවන ප්‍රශ්න සකසා ඇත්තේ අංක 01 දේශපාලන විද්‍යාවේ ස්වභාවය නම් විෂය ඒකකය යටතේ ය. එහි පළමු ප්‍රශ්නය සඳහා පහසුතාව 55%ක් ද දෙවන ප්‍රශ්නය සඳහා පහසුතාව 88%ක් ද දක්වා ඇත.

2.1.4 **I** ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ : (විෂය ඒකක අනුව)

විෂය ඒකකය	ප්‍රශ්න අංක	ප්‍රශ්න සංඛ්‍යාව	වැඩි ම පහසුතාව		අඩු ම පහසුතාව	
			ප්‍රශ්නය	පහසුතාව	ප්‍රශ්නය	පහසුතාව
1. දේශපාලන විද්‍යාවේ ස්වභාවය	1.2	2	2	88%	1	55%
2. රාජ්‍යයේ ස්වභාවය	3.5	2	3	60%	5	47%
3. ආණ්ඩුවේ ස්වභාවය, ආණ්ඩුක්‍රම ආකෘති සහ කාර්යයන්	4,9,10, 11,12, 13,14, 15,19	9	4	91%	9	36%
4. ආණ්ඩුකරණයට ජනතාව සම්බන්ධ වන විධික්‍රම	17,18,20, 21,22, 23,24,25	8	18	78%	20	22%
5. ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය අතර පවත්නා සම්බන්ධතාව	16	1		20%		
6. ශ්‍රී ලංකාවේ පැවති යටත් විජිත පාලනයේ ස්වභාවය	26, 27, 28, 29, 30	5	26	64%	29	34%
7. තෝරා ගත් රටවල ආණ්ඩුක්‍රම ආකෘති	45,46, 47,48	4	48	49%	47	17%
8. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථා බිහිවීමේ පසුබිම	31,32	2	31	59%	32	36%
9. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල විශේෂිත විධි විධාන සහ ආයතන	33,34,35, 36,37,38, 39,41, 42,43	10	37	56%	43	18%
10.1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන්	40,44	2	40	37%	44	25%
11. සමාජය තුළ ක්‍රියාත්මක වන දේශපාලනයේ ස්වරූපය	6,7,8	3	8	55%	6	41%
12. රාජ්‍ය ප්‍රතිපත්ති	49	1		25%		
13. අන්තර් ජාතික දේශපාලනය	50	1		27%		

I පත්‍රයේ ප්‍රශ්න අතුරෙන් 10ක් “නිදහසින් පසු ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල විශේෂිත විධිවිධාන සහ ආයතන” යන ඒකකය සඳහා වෙන් වී තිබිණි. මෙහි 56% වූ වැඩි ම පහසුතාව ප්‍රශ්න අංක 37 සඳහා වන අතර 18%ක අවම පහසුතාව 43 ප්‍රශ්නය සඳහා ලැබී ඇත.

“ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය”, “රාජ්‍ය ප්‍රතිපත්ති” , “අන්තර් ජාතික දේශපාලනය” යන ඒකක සඳහා එක් ප්‍රශ්නය බැගින් වෙන් වී තිබිණි.



ප්‍රස්තාරය 7

I ප්‍රශ්න පත්‍රයට ඇතුළත් විෂය ඒකක අනුව 72%ක වැඩි ම පහසුතාව ලබා ගෙන ඇත්තේ “දේශපාලන විද්‍යාවේ ස්වභාවය” යන ඒකකයට ය. පළමු හා දෙවන ප්‍රශ්න එම ඒකකයෙන් සකස්කර ඇති අතර ඒවා ඉතා සරල මෙන් ම සිසුන්ට ඉතා හුරු පුරුදු ප්‍රශ්න වූ බැවින් ඒවායෙහි පහසුතාව ඉහළ අගයක් ගෙන ඇත.

‘ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය අතර පවත්නා සම්බන්ධතාව’ යන ඒකකය ඇසුරින් සකස් වූ ප්‍රශ්න අංක 16 සඳහා 20%ක පිරිසක් සාර්ථක ව පිළිතුරු සපයා ඇති අතර 80%ක පිරිසකට සාර්ථක ව පිළිතුරු සැපයීමට නොහැකි වී ඇත.

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ගෙන ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය					
		1	2	3	4	5	MISSING
1	3	14.6	7.9	55.3	18.8	2.7	0.6
2	2	1.6	88.1	2.5	3.7	4.0	0.1
3	5	12.7	14.1	6.5	5.7	60.3	0.7
4	4	3.7	1.3	1.7	91.1	1.8	0.5
5	1	47.4	10.7	11.4	25.3	4.6	0.7
6	1	40.8	9.1	33.6	5.8	10.0	0.7
7	2	7.5	50.3	14.3	22.9	4.4	0.6
8	3	7.3	12.7	54.9	6.6	17.9	0.7
9	1	36.2	44.4	7.8	8.6	2.5	0.6
10	2	21.5	55.6	8.6	5.1	8.6	0.6
11	1	43.5	26.3	12.7	11.3	5.4	0.8
12	4	8.4	5.4	4.3	78.5	2.9	0.6
13	5	16.0	4.6	6.6	9.0	63.2	0.7
14	1	40.0	25.4	7.0	11.1	15.9	0.6
15	4	20.3	7.3	8.5	55.3	7.9	0.8
16	5	40.3	14.9	15.5	8.8	20.0	0.5
17	5	19.3	9.6	5.5	6.9	58.2	0.7
18	2	6.3	77.8	3.3	7.8	4.2	0.5
19	3	2.9	4.6	75.1	8.5	8.3	0.5
20	3	29.9	24.2	21.9	12.7	10.7	0.7
21	1	25.1	32.4	10.2	20.4	11.1	0.8
22	3	4.6	9.9	43.1	25.1	16.6	0.7
23	5	3.6	6.7	22.5	6.5	60.0	0.7
24	2	5.4	28.6	14.1	8.2	43.1	0.7
25	2	9.6	55.6	17.8	4.1	12.3	0.6
26	5	9.6	8.3	7.7	9.7	64.0	0.6
27	3	9.5	11.1	62.4	7.2	9.0	0.8
28	2	20.2	49.4	15.0	9.6	5.1	0.7
29	2	6.6	33.7	32.5	16.0	10.7	0.6
30	1	55.7	3.6	12.5	17.1	10.3	0.9
31	3	8.9	4.0	59.4	22.2	4.7	0.8
32	2	27.8	35.7	10.1	18.3	7.1	1.1
33	4	21.1	15.4	13.6	42.9	6.3	0.7
34	2	8.7	34.7	26.5	24.1	5.3	0.8
35	1	21.3	26.5	5.0	25.0	21.2	1.0
36	4	10.3	16.0	13.8	32.0	27.1	0.9
37	3	8.4	12.0	56.0	12.6	10.2	0.8
38	5	6.9	7.6	24.2	9.4	51.0	1.0
39	4	41.4	7.8	14.3	30.3	5.5	0.8
40	5	10.6	20.1	15.9	16.3	36.5	0.7
41	5	33.4	20.0	6.8	10.4	28.7	0.8
42	1	28.0	12.3	8.2	32.5	18.3	0.8
43	3	57.3	5.2	18.0	11.4	7.3	0.8
44	3	12.1	11.7	25.4	36.8	13.0	1.0
45	4	20.5	34.8	12.6	22.1	9.1	1.0
46	5	24.1	14.7	8.4	10.8	41.2	1.0
47	3	10.5	32.5	16.6	35.3	4.2	0.9
48	3	11.3	8.2	48.8	22.7	7.9	1.1
49	5	24.7	32.1	6.1	10.8	25.2	1.1
50	2	39.5	26.6	11.2	7.7	13.8	1.2

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර ඇත.

2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

පිටු අංක 5හි ප්‍රස්තාර අංක 01හි දැක්වෙන දත්ත අනුව බහුවරණ ප්‍රශ්න 50 අතුරෙන් 91%ක ඉහළ ම පහසුතාව ප්‍රශ්න අංක 4 සඳහා ලැබී ඇත. එමෙන් ම ප්‍රශ්න අංක 2, 4, 12, 18, 19 සඳහා 75% ඉක්ම වූ ඉහළ පහසුතාව පෙන්නුම් කරන බැවින් මෙවර විභාගයේ එම ප්‍රශ්න පහසු ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය. අපේක්ෂකයන්ගෙන් 75%ට වඩා වැඩි පිරිසකට ඉහත ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සැපයීමට හැකි වී තිබේ.

ප්‍රශ්න අංක 9, 16, 20, 21, 24, 29, 32, 34, 35, 36, 39, 40, 41, 42, 43, 44, 45, 47, 49, සහ 50 යන ප්‍රශ්න විස්ස සඳහා පහසුතාව 40%ට වඩා අඩු අගයක් ගන්නා බැවින් එම ප්‍රශ්න බොහෝ අපේක්ෂකයන්ට නිවැරදි ව පිළිතුරු සැපයීමට දුෂ්කර වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය. එම ප්‍රශ්න අතුරෙන් 47 ප්‍රශ්නය වඩාත් දුෂ්කර වී ඇති අතර එහි පහසුතාව 17%කි. තෝරාගත් රටවල ආණ්ඩු ක්‍රම විෂය ඒකකයටඅදාළ ව සකසා තිබූ මෙම ප්‍රශ්නය, දී ඇති ප්‍රකාශ දෙකක් පිළිබඳ ව සත්‍ය අසත්‍යතාවය නිගමනය කිරීමට ඉදිරිපත් කර තිබිණි. එක් ප්‍රකාශයක ඉන්දීය ජනාධිපති තෝරා පත්කරන ඡන්ද විද්‍යාලයේ සාමාජික පිරිස මධ්‍යම ආණ්ඩුවේ පාර්ලිමේන්තුව තුළ පමණක් සිටින්නේ ද යන කරුණ ද අනෙක් ප්‍රකාශය මඟින් යම් පුද්ගලයකුට ඉන්දීය ජනාධිපති තනතුර දැරිය හැකි වාර ගණන කොපමණ ද යන කරුණ ද විශ්ලේෂණයට ඉදිරිපත් කර තිබිණි. නිර්දේශිත රටවල් පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් පන්ති කාමරය තුළ දී ලබා නොගැනීම ද සිසුන්ගේ සාධන මට්ටම අඩු වීමට හේතු වී ඇත.

ප්‍රශ්න අංක 16 සඳහා 20%ක පහසුතාවක් දක්වා ඇත. මෙම ප්‍රශ්නය මඟින් සාවද්‍ය ප්‍රකාශය තේරීමේ අවස්ථාව අපේක්ෂකයන්ට ලබා දී තිබිණි. ප්‍රශ්නයට අදාළ ව නූතන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය තුළ ව්‍යවස්ථාදායකයේ කාර්යයන් සඳහන් වන අතර එයට සාවද්‍ය ප්‍රකාශය “ජාතික අයවැය සම්පාදනය කිරීමේ හා ක්‍රියාවට නැංවීමේ වගකීම දරනු ලැබේ.”ලෙසට සඳහන් ව තිබිණි. ප්‍රකාශය ආරම්භයේ දී ම අයවැය සම්පාදනය යන අදහස දක්නට ලැබෙන බැවින් එහි ඇති ක්‍රියාවට නැංවීම යන අදහස සැලකිල්ලට නොගෙන අපේක්ෂකයන් අනවධානයෙන් කටයුතු කර ඇත. උපදෙස් ප්‍රශ්නය, හා එයට දී ඇති වරණ අවධානයෙන් සම්පූර්ණයෙන් කියවා නිවැරදි පිළිතුරු ලකුණු කිරීමට සිසුන් යොමු කිරීමේ අවශ්‍යතාව මෙයින් පෙනී යයි.

අඩු පහසුතා මට්ටමක් ප්‍රශ්න අංක 35හි හඳුනාගත හැකි ය. එහි පහසුතාව 21%කි. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තේරීමට යෝජිත මෙම ප්‍රශ්නයේ දී 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සිදුකරන ලද කාර්ය සමූහයෙන් “ව්‍යවස්ථාවේ අන්තර්ගත රාජ්‍ය ප්‍රතිපත්ති මූලධර්ම අධිකරණ විනිශ්චයට යටත් විය” යන E ප්‍රකාශය වැරදි ප්‍රකාශය ලෙස ඇතුළත් කර තිබුණි. එහෙත් අපේක්ෂකයන්ගෙන් වැඩි පිරිසක් **“සිංහල සහ දෘවිඩ භාෂා ජාතික භාෂා බවට පත් කෙරෙණි”**. ලෙස සඳහන් වූ D ප්‍රකාශය වැරදි ප්‍රකාශය ලෙස තෝරා තිබිණි. එමගින් ගම්‍ය වන්නේ අපේක්ෂකයන්ගෙන් බහුතරයක් තුළ ලංකාවේ සිංහල දෘවිඩ භාෂා ජාතික භාෂා බවට පත්කරන ලද්දේ 1978 ව්‍යවස්ථාවෙන් බවට අවබෝධයක් නොමැති බව යි.

එක් එක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්හි විධි විධාන සහ දැනුම පුළුල් කිරීමේ අවශ්‍යතාව මෙයින් අවධාරණය කෙරේ.

විසිවන ප්‍රශ්නයෙහි, 22%ක අඩු පහසුතා මට්ටමක් පෙන්නුම් කරයි. දී ඇති ප්‍රකාශ අතුරෙන් සිවිල් සමාජය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය "දේශපාලන සමාජයට අනන්‍යවන බව පිළිගනු ලැබේ" යන තුන්වන ප්‍රකාශයයි. එහෙත් අපේක්ෂකයන්ගෙන් වැඩි පිරිසක් "පොදුවේ පිළිගත් අර්ථ නිරූපණයක් නොමැති සංකල්පයක් වේ" යන පළමුවන ප්‍රකාශය හා දෙවන ප්‍රකාශය වන "රාජ්‍ය පාලනයෙන් පරිබාහිර ව පවතින සමාජ ජීවිතයේ එක් පැතිකඩක් එමගින් විස්තර කරනු ලැබේ" යන ප්‍රකාශ සාවද්‍ය ප්‍රකාශය ලෙස තෝරා තිබිණි. එහෙත් ඒවා සිවිල් සමාජයට අදාළ වන නිවැරදි ප්‍රකාශයන් ය. එසේ ම අපේක්ෂකයන්ට "දේශපාලන සමාජයට අනන්‍ය වන බව පිළිගනු ලැබේ" යන ප්‍රකාශය විශ්ලේෂණය කර ගැනීමේ අපහසුතාව ද ඇති වී තිබේ. එබැවින් සිසුන්ගේ අවබෝධය පුළුල් කිරීමට ගුරුවරුන් කටයුතු කළයුතු බව මෙයින් අවධාරණය කෙරේ.

ප්‍රශ්න අංක 21 සඳහා 25%ක අඩු පහසුතා අගයක් ලැබී ඇත. පුරවැසිභාවය පිළිබඳ ව දී ඇති ප්‍රකාශ පහ අතුරින් සාවද්‍ය ප්‍රකාශය වන්නේ **"රටක ජීවත් වන සියලු දෙනාට ම හිමි නීතිමය අයිතිවාසිකමක් වේ"** යන වරණය යි. එහෙත් අපේක්ෂකයන්ගෙන් බහුතරයක් **"දේශපාලන සමාජයක ජීවත්වන පුරවැසියන්ට විශේෂිත ජාතිකත්වයක් ආරෝපණය කරන නීතිමය ව්‍යවහාරයක් වේ"** යන දෙවන වරණය සාවද්‍ය ප්‍රකාශය ලෙස හඳුනා ගෙන ඇත. රටක පුරවැසිභාවය හිමිවන්නේ කෙසේ ද යන්නත් ජීවත් වූ පමණින් ම නීතිමය අයිතිවාසිකම් නොලැබෙන බවත් අපේක්ෂකයන්ට අවබෝධ වී නොමැත. විෂය නිර්දේශයේ ඇතැම් මාතෘකා සඳහා ප්‍රමාණවත් අවධානයක් පන්ති කාමරයේ දී නොලැබෙන බව නිරීක්ෂණය කළ හැකි ය. එසේ ම නිසි අවධානයෙන් විවිධ පැතිකඩ ඔස්සේ විචාරාත්මක ව කරුණු අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව පෙනී යයි.

අඩු පහසුතා අගයක් පෙන්නුම් කළ 49 ප්‍රශ්නයේ පහසුතාව 25%කි. දී ඇති ප්‍රකාශ දෙකක සත්‍ය අසත්‍යතාව වරණ පහක් තුළින් නිගමනය කිරීමට ඉදිරිපත් කර තිබිණි. ඒ අනුව පළමු ප්‍රකාශයෙන් රාජ්‍යය තුළ ජීවත්වන ජනතාවගේ සමාජ යහපත ඉහළ දැමීමේ අරමුණු ඉටුකර ගැනීම හා සම්බන්ධිත ආණ්ඩුවල ක්‍රියා කලාපය රාජ්‍ය ප්‍රතිපත්ති බවත් දෙවන ප්‍රකාශයෙන් එම කාර්යයන් බෙදා හැරීම, බදු අය කිරීම, නියාමනය, සහ සංකේතාත්මක යනුවෙන් කොටස් 4 කට වර්ග කළ හැකි බවත් දක්වා ඇත. අදාළ පිළිතුර වන්නේ පළමු ප්‍රකාශය සත්‍ය වන බව සහ දෙවන ප්‍රකාශය පළමු ප්‍රකාශය මැනවින් පහදා දෙන බව සඳහන් 5 වරණය යි. එසේ වුව ද වැඩි ම අපේක්ෂකයන් පිරිසක් පළමු හා දෙවන වරණය ද තෝරා ඇත. එය 57%ක් පමණ වූ අතර 5 වරණය තෝරා ඇත්තේ 25%ක් පමණ වීමෙන් සිසුන්ගේ අඩු සාධන මට්ටම පෙන්නුම් කරයි. ප්‍රශ්න රටාවේ වෙනස්වීම් ඇතිවන විට සන්සුන්ව ප්‍රශ්න කියවා නිවැරදි වරණය තෝරා ගැනීමට සිසුන් පුහුණු කිරීමේ අවශ්‍යතාව මෙයින් අවධාරණය කෙරේ.

පහසුතාව 29%ක් වූ 24 ප්‍රශ්නය ද අපේක්ෂකයන්ට දුෂ්කර වී ඇත. සාවද්‍ය ප්‍රකාශය තේරීමට අපේක්ෂකයාට අවස්ථාව ලබා දී ඇති මෙම ප්‍රශ්නයේ තේමාව වන්නේ "අයිතිවාසිකම්" යන්නයි. මෙහි සාවද්‍ය ප්‍රකාශය දෙවන වරණය වන අතර, එහි සඳහන් වන්නේ බැඳීම් හා සමපාත වන බව ය. 28.6%ක පිරිසක් එම වරණය තේරුව ද 43%ක වැඩි ම පිරිසක් තෝරා ඇත්තේ **සාධනීය හා නිෂේධනීය වශයෙන් කොටස් දෙකකට වර්ග කර ඇත.** ලෙස සඳහන් 5 වරණයයි. ඉන් පැහැදිලි වන්නේ දෙවන වරණයේ දක්වා තිබුණු බැඳීම් අයිතිවාසිකම් නොවන බව සිසුන්ට අවබෝධකර ගැනීම දුෂ්කර වී ඇති බව යි. අයිතිවාසිකම් පිළිබඳ දේශපාලන විද්‍යා සංකල්පය සිසුන්ට පැහැදිලි කිරීමේ දී එදිනෙදා ව්‍යාවහාර කරන අර්ථවලින් වෙනස් වන බව සිසුන්ට පෙන්වා දීමේ වැදගත්කම මෙයින් පැහැදිලි වේ.

ප්‍රශ්න අංක 41 පහසුතාව 29%කි. සාවද්‍ය ප්‍රකාශය තේරීමට ඉදිරිපත් කර ඇති මෙම ප්‍රශ්නයේ තේමාව වන්නේ "**1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කැබිනට් මණ්ඩලය**" යන්නයි. "**අවම වශයෙන් මසකට වරක්වත් රැස්වීම් පැවැත්විය යුතුය**" ලෙස සඳහන් 5 වරණය සාවද්‍ය ප්‍රකාශයයි. නමුත් වැඩි ම පිරිසක් තෝරා ඇත්තේ 1 හා 2 වරණයන්ය. 1 වරණය වන්නේ පාර්ලිමේන්තුවේ නියෝජිතයන් අතුරෙන් තෝරාගත් සමාජිකයන්ගෙන් හා ජනාධිපතිවරයා/වරියගෙන් සමන්විත වේ යන්නයි. මෙහි දී පැහැදිලි වන්නේ 1978 ව්‍යවස්ථාව යටතේ කැබිනට් මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය ප්‍රමාණවත් නොවන බව ය. මෙය සාමන්‍ය දේශපාලන දැනුමෙන් ද පිළිතුරු ලිවිය හැකි ප්‍රශ්නයකි. ව්‍යවස්ථාවේ විධි විධාන මෙන් ම ආණ්ඩුවේ ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සිසුන් සතු සාමන්‍ය දේශපාලන දැනුම ද වර්ධනය කිරීමේ අවශ්‍යතාව මෙයින් අවධාරණය කෙරේ.

28 ප්‍රශ්නයේ පහසුතාව 49%කි. අපේක්ෂකයන්ගෙන් 51%කට මෙම ප්‍රශ්නය දුෂ්කර වී ඇත. ප්‍රශ්නයේ විමසා ඇත්තේ ලංකා ජාතික සංගමයේ ස්වභාවය පිළිබඳව ය. මෙහි දී 51%ක පිරිසකට නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරා ගැනීමට නොහැකි වී තිබේ. මෙහි දී ලංකා ජාතික සංගමයේ ස්වභාවය හා ක්‍රියාකාරිත්වය නිසි ලෙස තේරුම් ගෙන නොතිබීම එයට හේතුවකි. එබැවින් ලංකා ජාතික සංගමයේ ස්වභාවය හා ක්‍රියාකරිත්වය පිළිබඳ මනා අවබෝධයක් සිසුන්ට ලබා දීමේ අවශ්‍යතාව මෙයින් පැහැදිලි වේ.

ඉහත දක්වා ඇත්තේ සමස්තයක් ලෙස 2018 අ.පො.ස. උසස් පෙළ දේශපාලන විද්‍යාව I පත්‍රයට අපේක්ෂකයන් අවම පහසුතා දක්වන ලද ප්‍රශ්න කිහිපයකි. පහසුතා මට්ටම පහළ යාම කෙරෙහි බලපා ඇති හේතු සාධක හා එම දුර්වලතා මඟ හරවා ගැනීම සඳහා ඒ ඒ ප්‍රශ්න යටතේ දක්වා ඇති ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අමතර ව පහත දැක්වෙන ක්‍රියාමාර්ග යොදා ගැනීම ද සුදුසු බව පෙන්වා දිය හැකි ය.

(i) දේශපාලන විද්‍යාව පිළිබඳ විශේෂඥවරුන්ගේ සහ සම්පත් දායකයන්ගේ මඟපෙන්වීම් යටතේ විෂය සංවර්ධන වැඩසටහන් ජාතික, පළාත්, කලාප මට්ටමින් සංවිධානය කිරීම

(ii) විෂය ඉගෙනුම් ඉගැන්වීම් කරන ගුරුභවතුන්ට විශේෂ පුහුණු පාඨමාලා සංවිධාන කිරීම.

(iii) විෂය සඳහා ප්‍රවීන ගුරු උපදේශකවරුන්ගේ සේවය අධ්‍යාපන කලාප මට්ටමින් සලසාදීම

(iv) විෂය නිර්දේශයට අදාළ වූ විෂය විශේෂඥයන් විසින් සම්පාදිත ග්‍රන්ථ ඒ ඒ පාසල්වල විෂයභාර ගුරුවරුන්ට ලබා ගැනීමට අවශ්‍යය පහසුකම් සලසා දීම

(v) නව විෂය නිර්දේශයට අවශ්‍ය ග්‍රන්ථ සම්පාදනයේ දී නිවැරදි විෂය කරුණු පමණක් ම ලබාදීම වෙනුවෙන් නිශ්චිත ග්‍රන්ථ සම්පාදන කමිටුවක් පත් කිරීම

(vi) පන්ති කාමරය තුළ විෂය ඉගැන්වීමේ දී සාකච්ඡා, කණ්ඩායම් ක්‍රියාකාරකම්, බුද්ධි කලම්භනය, පැවැරුම් වැනි විවිධ ඉගෙනුම් ක්‍රම අනුගමනය කරමින් විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අවස්ථා සලසා දීම

(vii) විෂය පිළිබඳ අමතර දැනුම අඩු බව දක්නට ලැබෙන බැවින් පොතපත කියවීම මීට වඩා වර්ධනය කරවීමට අවශ්‍ය ක්‍රියාකාරකම් සංවිධානය කිරීම

(viii) විෂය විශේෂඥවරුන්ගේ උපදෙස් හා මඟ පෙන්වීම් මත විෂය නිර්දේශයේ සිසුන්ට තේරුම් ගැනීමට දුෂ්කර මාතෘකා සඳහා සරල මට්ටමින් අමතර කියවීම් පොතක් සේ සකසා සිසුන් අතට පත් කිරීමට කටයුතු කිරීම

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

කාලය පැය 03කි. (අමතර කියවීම් කාලය මිනිත්තු 10කි)
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.

A කොටස - කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 20කි. ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ලකුණු 20කි.

B කොටස - අර්ධ ව්‍යූහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 4කි. ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

C කොටස - අර්ධ ව්‍යූහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 4කි. ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු - 20 + 40 + 40 = 100

2.2.2. II ප්‍රශ්න පත්‍රය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

II පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර **2** හා **3** ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමඟ දක්වා ඇත.

A කොටස

1 සිට 20 දක්වා ප්‍රශ්න

1. පහත දැක්වෙන ප්‍රකාශවලින් විස්තර කෙරෙන දේශපාලන සංවිධාන **දෙක** හඳුනාගෙන නම් කරන්න.
   (i) සියලුම සමාජ සංවිධානවලට වඩා උත්තරීතර වූ සර්වබලධාරී දේශපාලන සංවිධානය
   (ii) රාජ්‍යයේ කැමත්ත ක්‍රියාවට නංවන දේශපාලන ආයතන

   1 රාජ්‍යය .....

   2 ආණ්ඩුව .....

2. පහත දැක්වෙන ප්‍රකාශ දෙක මගින් නූතන ලෝකයේ පවතින ආණ්ඩුක්‍රමයක් සහ රාජ්‍ය මාදිලියක් විස්තර කර ඇත. එවා හඳුනාගෙන නම් කරන්න.
   (i) ජනතාව විසින් ජනතාව උදෙසා ක්‍රියාවට නංවන ජනතාවගේ ආණ්ඩුව
   (ii) රාජ්‍යය තුළ ජීවත්වන ජනතාවට සමාජ සේවා සහ සමාජ ආරක්ෂණය සපයන රාජ්‍යය

   1 ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය .....

   2 සුභසාධක රාජ්‍යය .....

3. පහත දැක්වෙන ප්‍රකාශ (i) සහ (ii) මගින් විස්තර කෙරෙන්නේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීම සඳහා භාවිතයට ගැනෙන උපකරණ **දෙකකි**. ඒවා හඳුනාගෙන නම් කරන්න.

   (i) " එය ප්‍රංශ භාෂාවේ භාවිත වන පදයක් වන අතර එහි අර්ථය වන්නේ අදහස් විමසිය යුතුය" යන්නය. මේ අනුව එමගින් අදහස් කෙරෙන්නේ ජනතා තීන්දුව උදෙසා යම් පනතක් ජනතාවට හෝ ඡන්දදායකයින්ට හෝ යොමු කළ යුතු ය යන්නයි. එය නීති සම්පාදන ක්‍රියාමාර්ගයක් වන අතර ඒ අනුව ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන ලද පනතක් ඡන්දදායකයින් විසින් අනුමත කරන තෙක් නීතියක් බවට පත් නොවේ."
   (ii) "මෙම උපකරණය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දක්වන නිශ්චිත ඡන්දදායක සංඛ්‍යාවකට පනතක් යෝජනා කර ව්‍යවස්ථාදායකයේ සලකා බැලීම සඳහා ඉදිරිපත් කළ විටෙක එසේ කිරීමට ව්‍යවස්ථාදායකය බැඳී සිටී. අනතුරුව අදාළ පනත ව්‍යවස්ථාදායකය විසින් ජනතාවගේ අනුමැතිය හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ සඳහා ඉදිරිපත් කළ යුතු ය. මෙම උපකරණය භාවිත කිරීමේ අරමුණ වන්නේ නීති සම්පාදනය යෝජනා කිරීමේ බලය ජනතාව අතට පත් කිරීම ය"

   1 ජනමතවිචාරණය .....

   2 ප්‍රාරම්භනය .....

4. පහත දැක්වෙන ප්‍රකාශ (i) සහ (ii) මගින් අදහස් කෙරෙන්නේ කුමක් ද යන්න නම් කරන්න.

(i) එය මානව ප්‍රජාව විස්තර කිරීම සඳහා භාවිතයට ගැනෙන පදය වන අතර රාජ්‍යය ඓතිහාසික වශයෙන් පැනනැගුනේ ඒ තුළිනි.

(ii) පොදු බැඳීම් එනම් භාෂාව, ආගම, වර්ගය, භූමිය සහ ඉතිහාසය වැනි අනන්‍යතා මත ගොඩනැගුණු පොදු සංස්කෘතිය පිළිබඳ හැඟීම බෙදාහදා ගන්නා මනුෂ්‍ය කණ්ඩායමක් ය.

1 සමාජය

2 ජාතිය

5. පහත දැක්වෙන ප්‍රකාශ මගින් විස්තර කෙරෙන දේශපාලන න්‍යායන් **දෙක** නම් කරන්න.

(i) බලය අධික වශයෙන් කේන්ද්‍රගත වීම වැළක්වීමේ සංරෝධකයක් ලෙස දේශපාලන බලය රාජ්‍යයේ විවිධ ආයතන අතර බෙදා හැරිය යුතු බව ප්‍රකාශ කරන සිද්ධාන්තය

(ii) නීතිය ඉදිරියේ සමාන බව සහ නීතියේ සමාන ආරක්ෂාව සියලු දෙනාටම හිමිවිය යුතු බව සහතික කෙරෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මූලධර්ම

1 බලතල බෙදීම

2 නීතියේ ආධිපත්‍යය

6. රාජ්‍යයේ ආරම්භය, පරිණාමය සහ අවසානය පිළිබඳ අවධි පහක් මාක්ස්වාදී න්‍යායෙන් යෝජනා වේ. එහි අවසාන අවධි **දෙක** දක්වන්න.

1 සමාජවාදී යුගය

2 කොමියුනිස්ට් සමාජය

7. සමාජ සම්මුතිවාදය රාජ්‍යයේ ආරම්භය පිළිබඳව ඉදිරිපත් වී ඇති දේශපාලන න්‍යායක් වේ. එම න්‍යායේ එක් ආරම්භකයෙකු විසින් අසහාය බලැති රාජාණ්ඩුක්‍රමයක් යෝජනා කරන ලද අතර තවත් අයෙකු විසින් නියෝජන ආණ්ඩු ක්‍රමය යෝජනා කර ඇත. ඒ **දෙදෙනා** නම් කරන්න.

1 අසහාය බලැති රාජාණ්ඩුක්‍රමය තෝමස් හොබ්ස්

2 නියෝජන ආණ්ඩුක්‍රමය ජෝන් ලොක්

8. පහත දැක්වෙන ප්‍රකාශ **දෙක** මගින් විස්තර කෙරෙන්නේ කුමක් ද යන්න හඳුනාගෙන ඒ **දෙක** නම් කරන්න.

(i) "ආණ්ඩුවේ විශේෂිත ප්‍රතිපත්තිවලට බලපෑම් කරන හෝ ඒවා පාලනය කිරීමට උත්සාහ කරන නමුත් ආණ්ඩු බලය අත්පත් කර ගැනීමට හෝ ආණ්ඩුවේ ප්‍රතිපත්ති මුළුමනින්ම පාලනය කිරීමට හෝ උනන්දු නොවන පුද්ගලික සහ ස්වේච්ඡා සංවිධාන"

(ii) මෙම පදය පොදුවේ භාවිත කෙරෙන්නේ ප්‍රජාවට බලපාන හෝ ප්‍රජාවේ උනන්දුව ඇති කරවන කරුණු පිළිබඳ ව මනුෂ්‍යයන් දක්වන අදහස්වල සමස්තය හැඳින්වීමට ය. මේ අනුව ඒ වූ කලී විවිධ අදහස්, විශ්වාස, මිථ්‍යා, අගතීන් සහ අපේක්ෂාවල මිශ්‍රණයකි.

1 බලපෑම් කණ්ඩායම්/ආශා කණ්ඩායම්

2 මහජන මතය

9. ස්වාධිපත්‍ය බලය රාජ්‍ය අධිකාරී බලයේ මූලාශ්‍රය ක්‍රියාවට නැංවීම ලෙස සැලකේ. නූතන ලෝකය තුළ ආණ්ඩුක්‍රම ආකෘති දෙකක් යටතේ රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය ක්‍රියාවට නැංවීම සංවිධානය කර ඇත. එම ආකෘති දෙක නම් කරන්න.

1 සන්ධීය රාජ්‍ය ක්‍රමය

2 ඒකීය රාජ්‍ය ක්‍රමය

10. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන්නේ නියෝජනය පදනම් කරගෙනය. නියෝජනය සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසි දෙකක් තිබේ. එම කොන්දේසි **දෙක** නම් කරන්න.

1 සර්වජන ඡන්ද බලය

2 කාලීනව පවත්වන මැතිවරණ

11. (i) ශ්‍රී ලංකාව තුළ ව්‍යවස්ථාදායක සභාවක් ප්‍රථම වරට පිහිටුවූයේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය යටතේ ද ?

(ii) ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටු වූයේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය යටතේ ද?

1 1833 කෝල්බෘක්-කැමරන් ප්‍රතිසංස්කරණය

2 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

12. (i) ශ්‍රී ලංකාව තුළ (i) සීමිත ඡන්ද බලය හඳුන්වා දුන්
(ii) සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දුන්
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ නම් කරන්න.

1 1910 කෲව්-මැකලම් ප්‍රතිසංස්කරණය

2 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

13. (i) ශ්‍රී ලංකාව තුළ (i) වාර්ගික නියෝජනය හඳුන්වාදුන්
(ii) වාර්ගික නියෝජනය අහෝසි කළ
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ නම් කරන්න.

1 1833 කෝල්බෘක්-කැමරන් ප්‍රතිසංස්කරණය

2 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

14. (i) ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රථම වරට හඳුන්වා දෙන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද?

(ii) රාජ්‍ය සේවාව දේශපාලන විධායකය යටතට පත්කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි කළේ කුමන ව්‍යවස්ථාව යටතේ ද?

1 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය

2 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

15. (i) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කරන ලද ඉහළ අධිකරණ දෙකක් තිබේ. එම අධිකරණ **දෙක** නම් කරන්න.
(ii) ඉහළ අධිකරණ දෙකෙහි විනිශ්චයකරුවන් පත් කිරීම හා සම්බන්ධ කාර්ය පටිපාටිය කුමක් ද?

1 ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය

2 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපතිවරයා විසින්

16. (i) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එනු ලැබූ සංශෝධනයක් මගින් ශ්‍රී ලංකාව තුළ පළාත් සභා ස්ථාපිත කරන ලදී. එම සංශෝධනය නම් කර එය ගෙන එනු ලැබූ වර්ෂය දක්වන්න.
(ii) ශ්‍රී ලංකාවේ වර්තමාන පළාත් පාලන ක්‍රමය සමන්විත වන්නේ පළාත් පාලන ආයතන වර්ග තුනකිනි. එම පළාත් පාලන ආයතන වර්ග **තුන** නම් කරන්න.

1 13 වන ව්‍යවස්ථා සංශෝධනය 1987

2 මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා

17. (i) එක්සත් ජාතින්ගේ සංවිධානයේ තීරණ ගැනීමේ ඉහළම ආයතනය කුමක්ද?
(ii) එක්සත් ජාතින්ගේ සංවිධානයේ මහ ලේකම්වරයා පත්කිරීමේ ක්‍රියාපටිපාටිය කුමක් ද?

1 මහා මණ්ඩලය

2 ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය මත මහා මණ්ඩලය විසින්

18. (i) කලාපීය සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා දකුණු ආසියාතික රටවල් විසින් ස්ථාපනය කරන ලද සංවිධානය කුමක් ද?
(ii) රැස්වීම් වාරවල දී සාකච්ඡාවට භාජනය **නොකළ යුතු** කරුණු දෙකක් එම සංවිධානයේ සමාරම්භක ප්‍රකාශනයේ සඳහන් වේ. එම කරුණු **දෙක** නම් කරන්න.

1 කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික රාජ්‍ය සංවිධානය/සාක්

2 ද්විපාර්ශ්වික කරුණු සහ දේශපාලන කරුණු

19. (i) ජාත්‍යන්තර හා දේශීය ගැටුම්වලදී වින්දිතයින් බවට පත්වන අයගේ පීවිතය සහ ආත්ම අභිමානය ආරක්ෂා කිරීම වෙනුවෙන් අන්තර්ජාතික මානුෂවාදී නීතිය සමග බද්ධ වී කටයුතු කරන ප්‍රධාන රාජ්‍ය නොවන ක්‍රියාකාරිකයා කවුරුන් ද?
(ii) එම සංවිධානයේ මූලස්ථානය පිහිටුවා ඇත්තේ කවර නගරයේ ද?

1 අන්තර්ජාතික රතුකුරුස කමිටුව

2 ජිනීවා-ස්විට්සර්ලන්තය

20. (i) යුරෝපීය ජාතීන් අතර ඒකාග්‍රතාව ඇති කිරීම උදෙසා ක්‍රියාකරන සංවිධානය කුමක් ද?
(ii) මේ වනවිට එම සංවිධානයෙන් ඉවත් වීමට තීරණය කර ඇති රට කුමක් ද?

1 යුරෝපා සංවිධානය/යුරෝපා ආර්ථික හවුල

2 මහා බ්‍රිතාන්‍යය

A කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



A කොටසට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර අපේක්ෂකයන්ගෙන් 99.5%ක් එම කොටසට පිළිතුරු සපයා තිබිණි. මෙම කොටසේ ඇති ව්‍යුහගත කෙටි ප්‍රශ්න 20 සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 40%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 29%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 5%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්න සඳහා ලකුණු 10ට වැඩියෙන් ලබා ගත් පිරිස 34%ක් වන අතර ලකුණු 11ට අඩුවෙන් ලබා ගත් පිරිස 66%කි. එමෙන් ම අපේක්ෂකයන්ගෙන් 26%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 5 හෝ ඊට අඩුවෙනි.



A කොටසෙහි අන්තර්ගත ප්‍රශ්න 20 අතුරෙන් 89%ක වැඩිම පහසුතාව 1 ප්‍රශ්නයේ (ii) කොටස සඳහා ලැබී ඇත. එසේ ම 4%ක අඩුම පහසුතාව 18(ii) ප්‍රශ්නය සඳහා ලැබී ඇත.

A කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :

A කොටසේ කෙටි ප්‍රශ්න 20ට අයත් කොටස් ප්‍රශ්න 40 අතුරෙන් පහසුතාව 50%ට වැඩි ප්‍රශ්න සංඛ්‍යාව 17කි.

පළමුවන ප්‍රශ්නයෙන් අපේක්ෂිත පිළිතුරු වන්නේ දේශපාලන විද්‍යාවේ ප්‍රධාන මාතෘකාව වන රාජ්‍යය හා රාජ්‍යයේ ක්‍රියාකාරී ආයතනය වන ආණ්ඩුව පිළිබඳ ව හඳුනා ගැනීම ය. මෙම ප්‍රශ්නය සඳහා 88% හා 89%ක් වූ ඉහළ ම පහසුතා අගයන් ලැබී ඇත. දේශපාලන විද්‍යාවේ ජනප්‍රිය මාතෘකා දෙකක් මෙම ප්‍රශ්න තුළින් විමසා තිබීම පහසුතාව ඉහළ අගයක් ගැනීමට හේතු වී ඇත.

බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ප්‍රජාතන්ත්‍රීය අංගයක් වූ සීමිත ඡන්ද බලය හා සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දීම පිළිබඳ අපේක්ෂකයන් තුළ පවතින අවබෝධය පිරික්සීමේ ප්‍රශ්නයක් වූ 12 (ii) ප්‍රශ්නය සඳහා පහසුතාව 84%කි.

ප්‍රශ්න අංක 2 (ii), 3 (ii), 4 (ii), 6 (i), (ii), 7 (ii), 8 (ii), 9 (i), (ii), 10 (i), (ii), 14 (i), 15 (ii), 17 (ii), 18 (ii), 19 (ii), හා 20 (i), (ii) යන ප්‍රශ්න කොටස් 18 සඳහා පහසුතාව 40%ට වඩා අඩු බැවින් එම ප්‍රශ්න බොහෝ අපේක්ෂකයන්ට නිවැරදි පිළිතුරු සැපයීමට දුෂ්කර වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය. ඒ අතුරෙන් 18(ii), 10(ii), හා 17(ii) ප්‍රශ්න වඩාත් දුෂ්කර වී ඇත. එම ප්‍රශ්නවල පහසුතා දර්ශක පිළිවෙළින් 0.04%, 0.09%, 0.1% වේ.

අවම පහසුතාව 18 (ii) ප්‍රශ්නය සඳහා ලැබී ඇත. එය 0.5%ටත් වඩා අඩු මට්ටමකි. අන්තර් ජාතික සංවිධාන කෙරෙහි අපේක්ෂකයන් වැඩි අවධානයක් යොමු කර නොමැති බව 2018 අ.පොෂ (උසස් පෙළ) අපේක්ෂකයකු සපයන ලද පහත සඳහන් පිළිතුර මඟින් පැහැදිලි වේ.

උදා :


18. (i) කලාපීය සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා දකුණු ආසියානික රටවල් විසින් ස්ථාපනය කරන ලද සංවිධානය කුමක් ද?

(ii) රැස්වීම් වාරවල දී සාකච්ඡාවට භාජනය කොතෙදු යුතු කරුණු දෙකක් එම සංවිධානයේ සම්මාරම්භක ප්‍රකාශනයේ සඳහන් වේ. එම කරුණු දෙක නම් කරන්න.

(1) කාර්ණ් කාලි කාර ය

(2) .....

ඉහත උදාහරණයෙන් සාක් සංවිධානය ස්වකීය රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය නොකළ යුතු අනිවාර්ය කාරණා දෙක පිළිබඳ දැනුවත්භාවයක් නොමැති වීමෙන් ලකුණු අහිමි කරගත් ආකාරය තහවුරු වේ.

මේ තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා ජාත්‍යන්තර දේශපාලනය, අන්තර් ජාතික සංවිධාන පිළිබඳ ව විධිමත් සාකච්ඡා පැවැත්වීමත්, කාලීන අන්තර්ජාතික දේශපාලන තොරතුරු පිළිබඳ ව අවධානය යොමු කරවීමත් අවශ්‍ය ය. සමකාලීන ජාත්‍යන්තර සිදුවීම්, ප්‍රතිපත්ති විශ්ලේෂණ අඩංගු පුවත්පත්, සඟරා සහ අන්තර්ජාල මූලාශ්‍ර පරිශීලනය කිරීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොමු කළ යුතු අතර විෂය නිර්දේශයේ සියලු ම තේමා ආවරණය කිරීම විෂයභාර ගුරුවරුන්ගේ ද වගකීම වේ.

ආණ්ඩුකරණයට ජනතාව සම්බන්ධ වන විධික්‍රම පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම පිරික්සීම 10 ප්‍රශ්නයේ අරමුණ වේ. මෙම ප්‍රශ්නයේ පහසුතාව 9%කි. එයින් පැහැදිලි වන්නේ අපේක්ෂකයන්ට මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම ඉතා දුෂ්කර වූ බව යි. මෙය දුෂ්කර ප්‍රශ්නයක් නොව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය පිළිබඳ ව්‍යාවහාරික දැනුම පදනම් කරගෙන පිළිතුරු ලිවිය හැකි ප්‍රශ්නයකි.

උක්ත කාරණය 2018 අ.පොෂ (උසස් පෙළ) විභාගයේ දී අපේක්ෂකයන් දෙදෙනෙකු සපයන ලද පහත සඳහන් පිළිතුරු මගින් පැහැදිලි වේ.


10. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන්නේ නියෝජනය පදනම් කරගෙන ය. නියෝජනය සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසි දෙකක් තිබේ. එම කොන්දේසි **දෙක** නම් කරන්න.

උදා : 01

(1) ..... ඡන්දදායකයා ගේ බලය .....

(2) ..... ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ක්‍රමය ලබා දීම .....

උදා : 02

(1) ..... සාමාන්‍ය මැතිවරණ නියෝජිතයන් ..... ✗

(2) ..... ඡන්දදායකයන් නියෝජිතයන් ..... ✗

පළමු උදාහරණයෙන් උපරිම ලකුණු ප්‍රමාණය උපයාගත් ආකාරය ද දෙවන උදාහරණයෙන් අදාළ ලකුණු ප්‍රමාණය අහිමි කරගත් ආකාරය ද පැහැදිලි වේ.

ප්‍රශ්න අංක 17 (ii) කොටසට 10 %ක පහසුතාව ලැබී ඇත. මෙම ප්‍රශ්නයෙන් විමසා ඇත්තේ එක්සත් ජාතීන්ගේ මහ ලේකම් පත් කරන ක්‍රියා පටිපාටිය යි. බොහෝ අපේක්ෂකයන් මහා මණ්ඩලයෙන් එය සිදු කෙරෙන බව වටහාගෙන තිබුණත්, ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ ලබා ගත යුතු බව අවබෝධ කර ගෙන නොමැත. උක්ත කාරණය අපේක්ෂකයෙකු සපයන ලද පිළිතුරු ආශ්‍රයෙන් තහවුරු කළ හැකි ය.


17. (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කීරණ ගැනීමේ ඉහළම ආයතනය කුමක් ද?

(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයා පත්කිරීමේ ක්‍රියාපටිපාටිය කුමක් ද?

උදා :01

(1) ..... මහා මණ්ඩලය .....

(2) .....

අදාළ ආයතනය හඳුනා ගැනීම නිසා ප්‍රශ්නයේ පළමු කොටසට ලකුණු උපයාගත් ආකාරය ද අදාළ ක්‍රියාපටිපාටිය පිළිබඳ අනවබෝධය නිසා දෙවන කොටසට ලකුණු අහිමි කර ගත් ආකාරය ද තහවුරු වේ.

ප්‍රශ්න අංක 7 (ii), 8(ii), 10(i), (ii), 14(i), 15(ii),17(ii), 18(ii), 19(ii) හා 20(ii) යන ප්‍රශ්න කොටස් 10 සඳහා ලැබී ඇති පහසුතාව 30%ට අඩුවන බැවින් එම ප්‍රශ්න බොහෝ අපේක්ෂකයන්ට නිවැරැදි පිළිතුරු සැපයීමට දුෂ්කර වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය.

මෙහි 7 ප්‍රශ්නයේ (ii) කොටසින් නියෝජන ආණ්ඩුක්‍රමය ප්‍රකාශයට පත්කළ ප්‍රධාන සමාජ සම්මුතිවාදියා කවුරුන් ද යන්න විමසා ඇත. නමුත් බොහෝ අපේක්ෂකයන් ජෝන් ලොක් පාර්ලිමේන්තුව මුල් කර ගත් නියෝජන ආණ්ඩු ක්‍රමයක් පිළිබඳ අදහස සම්මුතිවාදය තුළින් ඉදිරිපත් කළ බව අවධානයට ගෙන නැත.

මෙම තත්ත්වය මෙවර විභාගයේ දී අපේක්ෂකයන් දෙදෙනෙකු සපයන ලද පිළිතුරු ආශ්‍රයෙන් තහවුරු කළ හැකි ය.


7. සමාජ සම්මුතිවාදය රාජ්‍යයේ ආරම්භය පිළිබඳව ඉදිරිපත් වී ඇති දේශපාලන න්‍යායක් වේ. එම න්‍යායේ එක් ආරම්භකයෙකු විසින් අසහාය බලැති රාජාණ්ඩුක්‍රමයක් යෝජනා කරන ලද අතර තවත් අයෙකු විසින් නියෝජන ආණ්ඩුක්‍රමය යෝජනා කර ඇත. ඒ **දෙදෙනා** කුමි කරන්න.

උදා : 01

(1) අසහාය බලැති රාජාණ්ඩුක්‍රමය ..... හොබ්ස් ..... හොබ්ස් .....

(2) නියෝජන ආණ්ඩුක්‍රමය ..... ලොක් ..... ලොක් 01

උදා : 02

(1) අසහාය බලැති රාජාණ්ඩුක්‍රමය ..... හොබ්ස් ..... හොබ්ස් .....

(2) නියෝජන ආණ්ඩුක්‍රමය ..... ජීන් ජැක්විස් රූසෝ ..... ✗

පළමු උදාහරණයෙන් ජෝන් ලොක් එම අදහස ප්‍රකාශයට පත් කළ බව අවබෝධ කරගත් නිසා ලකුණු උපයාගත් ආකාරය ද, එම අවබෝධය නොමැතිකම මත අදාළ ලකුණු අහිමි කර ගත් ආකාරය දෙවන උදාහරණය මගින් ද පැහැදිලි වේ.

ප්‍රශ්න අංක 14 (i) මගින් විමසා ඇත්තේ පළමු වතාවට ලංකාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පිහිටුවූයේ කිනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද යන්නයි. 2018 අ.පොෂ (උසස් පෙළ) විභාගයේ දී අපේක්ෂකයන් දෙදෙනෙකු සපයන ලද පිළිතුරු පහත දැක්වේ.


14. (i) ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ප්‍රථම වරට හඳුන්වා දෙන ලද්දේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද?

(ii) රාජ්‍ය සේවාව දේශපාලන විධායකය යටතට පත්කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව අහෝසි කළේ කුමන ව්‍යවස්ථාව යටතේ ද?

උදා : 01
(1) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(2) 72 වැනි ව්‍යවස්ථාව

උදා : 02
(1) 1972 ඉංග්‍රීසි රාජ්‍ය පාලන ක්‍රමය
(2) 1978 ජේ.ආර්. රාජ්‍ය පාලන ක්‍රමය

ගුරුවරුන් මෙන් ම සිසුන් පළමු ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂමක් සම්බන්ධයෙන් වැඩි අවධානය සෝල්බරි ආණ්ඩුක්‍රමය වෙත යොමු කර තිබූ නිසා ලංකාවේ ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂම හඳුන්වා දෙන ලද්දේ 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය තුළ බව අවධානයට ගෙන නැත. පළමු උදාහරණයෙන් අදාළ ආණ්ඩුක්‍රමය ඩොනමෝර් ක්‍රමය බව හොඳින් අවබෝධ කරගෙන තිබීමෙන් උපරිම ලකුණු උපයාගත් ආකාරය ද, දෙවන උදාහරණයෙන් ආදාළ ආණ්ඩුක්‍රම පිළිබඳ නිවැරැදි අවබෝධයක් නොවූ බැවින්, ලකුණු උපයා ගත නොහැකි වූ බව ද තහවුරු කළ හැකි වේ. ඒ නිසා 18%ක අඩු පහසුතාව 14(i) ප්‍රශ්නය සඳහා ලැබී ඇත.

2018 අ.පොෂ (උසස් පෙළ) විභාගයේ දී අපේක්ෂකයන් දෙදෙනෙක් 15 ප්‍රශ්නය සඳහා සපයන ලද පිළිතුරු පහතින් උපුටා දැක්වේ.


15. (i) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ස්ථාපිත කරන ලද ඉහළ අධිකරණ දෙකක් නිමයි. එම අධිකරණ **දෙක** නම් කරන්න.

උදා : 01
(ii) ඉහළ අධිකරණ දෙකෙහි විනිශ්චයකරුවන් පත් කිරීම හා සම්බන්ධ කාර්ය පටිපාටිය කුමක් ද?
(1) ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය.
(2) ඒ සඳහා ව්‍යවස්ථාදායකයේ අනුමැතිය ලබා ගැනීම.

උදා : 02
(ii) ඉහළ අධිකරණ දෙකෙහි විනිශ්චයකරුවන් පත් කිරීම හා සම්බන්ධ කාර්ය පටිපාටිය කුමක් ද?
(1) අභියාචනාධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණය
(2) ජනාධිපති විසින් පත් කරනු ලබයි.

ප්‍රශ්න අංක 15 (ii) මගින් විමසා ඇත්තේ වර්තමාන ලංකාවේ ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන් පත්කෙරෙන ක්‍රියාපටිපාටිය කුමක් ද? යන්නයි. බොහෝ අපේක්ෂකයන් එය ජනාධිපතිවරයා විසින් සිදු කරන බවට පිළිතුරු සපයා තිබුණ ද 19 වන සංශෝධනයෙන් කළ වෙනස වර්තමානයට ගළපා නොමැත. කාලීන වෙනස අවබෝධ කරගත් නිසා උපරිම ලකුණු ලබා ගැනීමත් එහි දුර්වලතාව නිසා ලකුණු අහිමි වීමත් දැකගත හැකි ය. මෙහි දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ ගත යුතු බව සඳහන් කර නොමැති නිසා මෙහි පහසුතාව 17% දක්වා පහළ ගොස් ඇත.

2018 අ.පො.ස (උසස් පෙළ) විභාගයේ දී අපේක්ෂකයන් දෙදෙනෙකු 19 ප්‍රශ්නය සඳහා සපයන ලද පිළිතුරු පහතින් දැක්වේ.


19. (i) ජාත්‍යන්තර හා දේශීය ගැටුම්වලදී විහිදිසයින් බවට පත්වන අයගේ ජීවිතය සහ ආත්ම අභිමානය ආරක්ෂා කිරීම වෙනුවෙන් අන්තර්ජාතික මානුෂවාදී නීතිය සමඟ බද්ධ වී කටයුතු කරන ප්‍රධාන රාජ්‍ය නොවන ක්‍රියාකාරිකයා කවුරුන් ද?

උදා : 01

(ii) එම සංවිධානයේ මූලස්ථානය පිහිටුවා ඇත්තේ කවර නගරයේ ද?

(1) රතු කුරුස සංවිධානය

(2) ජිනීවා නගරය

උදා : 02

(ii) එම සංවිධානයේ මූලස්ථානය පිහිටුවා ඇත්තේ කවර නගරයේ ද?

(1) රතු කුරුස සංවිධානය

(2) ස්විට්සර්ලන්තයේ සැන් ෆ්‍රැන්සිස්කෝ නගරය

මෙම ප්‍රශ්නයේ 2 කොටසෙන් විමසා ඇත්තේ අන්තර්ජාතික රතුකුරුස සංවිධානයේ මූලස්ථානය පවතින නගරය කුමක්ද? යන්නයි. බෝහෝ අපේක්ෂකයන් අන්තර්ජාතික සංවිධාන යටතේ එක්සත් ජාතින් ගේ සංවිධානය පිළිබඳ ව පමණක් වැඩි අවධානයක් යොමු කිරීම නිසා සෙසු ජාත්‍යන්තර සංවිධාන පිළිබඳ පවතින්නේ අඩු අවබෝධයකි. ඒ නිසා රතුකුරුස මූලස්ථානය, ස්විස්ටර්ලන්තයේ ජිනීවා නගරයේ බව නොදැන සිටීම පහසුතාව 27% දක්වා පහළ අගයක් ගැනීමට ප්‍රධාන හේතුවක් වී ඇත.

2018 අ.පො.ස (උසස් පෙළ) විභාගයේ දී අපේක්ෂකයෙකු 20 ප්‍රශ්නය සඳහා සපයන ලද පිළිතුරු පහත දැක්වේ.


20. (i) යුරෝපීය ජාතීන් අතර ඒකාග්‍රතාව ඇති කිරීම උදෙසා ක්‍රියාකරන්නා සංවිධානය කුමක් ද?

(ii) මේ වන විට එම සංවිධානයෙන් ඉවත් වීමට තීරණය කර ඇති රට කුමක් ද?

(1) යුරෝපා සංගමය

(2) බ්‍රිතාන්‍යය

වර්තමානයේ එම සංවිධානයෙන් ඉවත් වූ සාමාජිකයා මහා බ්‍රිතාන්‍යයි. එම කාලීන දේශපාලන දැනුම අත් කරගත් අපේක්ෂකයන් නිවැරදි පිළිතුරු සැපයීමට සමත් වී ඇත. අපේක්ෂකයන් වැඩි පිරිසකට එම කාලීන දැනුම නොමැති බව ප්‍රශ්නයේ ii කොටසට පහසුතාව 23%ක් වීමෙන් ම පැහැදිලි වේ. එම නිසා කාලීන දැනුම ලබා ගැනීමට සිසුන් ව යොමු කිරීම අවශ්‍ය වේ.

A කොටසට අපේක්ෂකයන් පිළිතුරු සැපයීමේදී මුහුණදුන් ප්‍රධානතම අභියෝගය ඔවුන් කෙටි කාලය තුළ වේගයෙන් නිවැරදි නිගමනවලට එළඹීම වේ. එයින් ඒ සඳහා විෂය දැනුමට අමතරව සංයමයකින්, වේගයෙන් හා නිවැරදිව සිතීමේ හැකියාව සහ ප්‍රායෝගික බව යනාදිය අත්‍යාවශ්‍ය වේ. මෙය ගුරුවරුන් අවධානය යොමුකළ යුතු කරුණකි. ගුරුවරුන් ශිෂ්‍යයන්ට අභ්‍යාස ලබා දී කෙටි ප්‍රශ්න වලට සීමිත කාලය තුල පිළිතුරු සැපයීමට උසස් පෙළ විභාගය අරමුණු කරගෙන පුරුදු පුහුණු කළ යුතුය. කෙටි ප්‍රශ්න සම්පූර්ණ විෂය නිර්දේශයම ආවරණය වන පරිදි සකස් කරනු ලබයි. නමුත් පාසල්වල සම්පූර්ණ විෂය නිර්දේශයම ආවරණය නොකිරීම සහ ඉලක්ක ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ප්‍රමුඛස්ථානය ලබාදීම යනාදිය එම කොටසේ ශිෂ්‍යයන් අඩු සාධන මට්ටමක් ලැබීමට හේතුවක් වී ඇතැයි සැලකිය හැකිය.

B කොටස

1 ප්‍රශ්නය

1. රාජ්‍යය සමාජය තුළ උත්තරීතර සංවිධානය ලෙස සලකන්නේ ඇයි?

අභිමතාර්ථය : මනුෂ්‍ය සමාජයක් තුළ මනුෂ්‍යයන් විසින් සංවිධානය කර ඇති සමාජ සංවිධානවල ස්වරූපය හඳුනා ගැනීම සහ එම සංවිධාන අතුරින් රාජ්‍යය උත්තරීතර සමාජ සංවිධානය ලෙස සළකන්නේ ඇයිද යන කරුණ සම්බන්ධයෙන් අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම.

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු මූලික කරුණු

(1) රාජ්‍යය හඳුනා ගැනීම **(ලකුණු 05)**

(2) රාජ්‍යය උත්තරීතර සමාජ සංවිධානය ලෙස හඳුනා ගැනීම **(ලකුණු 10)**

(3) නිගමනය : ප්‍රශ්නය මගින් මතුකර ඇති කරුණ සත්‍ය ද නැද්ද යන්න අදහසක් පදනම් කොට ගත් නිගමනයකට එළඹීම. **(ලකුණු 05)**

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මෙය මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- නිශ්චිත දේශසීමා සහිත භූමි ප්‍රදේශයක් තුළ ජීවත් වන ජනතාවගේ පොදු ආශාවන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම අරමුණු කොටගෙන බලාධිකාරී බලය ක්‍රියාවට නැංවීම පිණිස විශේෂිත ආකාරයෙන් සංවිධානය කරන ලද දේශපාලන ආයතන පද්ධතියකින් සමන්විත මනුෂ්‍ය සමාජය රාජ්‍යය ලෙස සළකනු ලැබේ.
- මේ අනුව දේශපාලන වශයෙන් සංවිධානය වූ මනුෂ්‍ය ප්‍රජාවක් රාජ්‍යය ලෙස හඳුනා ගැනීම සඳහා උපකාර වන සාධක කිහිපයක් තිබේ. නිශ්චිත දේශසීමා සහිත භූමි ප්‍රදේශයක් තිබීම, එම භූමිය තුළ ස්ථිර ලෙස පදිංචි වූ මනුෂ්‍ය ප්‍රජාවක් සිටීම, එම මනුෂ්‍ය ප්‍රජාවේ දේශපාලන, ආර්ථික හා සමාජ අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක වන පාලන ආයතන පද්ධතියක් තිබීම සහ එසේ ක්‍රියාත්මක වීම සඳහා පදනම සපයන බලාධිකාරී බලයක් තිබීම එම සාධක වේ.
- සමාජය ලෙස සංවිධානය වී ඇති මනුෂ්‍ය ප්‍රජාවක් ගත්විට ඒ තුළ මනුෂ්‍යයන් විසින් විවිධ අරමුණු උදෙසා පිහිටුවා ගෙන තිබෙන සමාජ සංවිධාන දහස් ගණනක් දැකිය හැක. මෙම සංවිධාන අතුරින් කුඩාම සමාජ සංවිධානය වන්නේ පිරිමියෙකු සහ ගැහැණියක එක්ව පිහිටුවා ගන්නා පවුලය. ඉහළම සමාජ සංවිධානය වන්නේ මනුෂ්‍ය ප්‍රජාවේ සියලුම දෙනා විසින් එකට එක් වී පිහිටුවාගෙන ගෙන ඇති රාජ්‍යය නැමැති සංවිධානයයි.
- මේ අනුව බලන විට රාජ්‍යයද මිනිසුන් විසින් පිහිටුවා ගෙන ඇති සමාජ සංවිධාන අතුරින් එක් සමාජ සංවිධානයක් වේ. නමුත් අනෙක් සමාජ සංවිධාන සමග සසඳන විට රාජ්‍යය ඒ සෑම සමාජ සංවිධානයකටම වඩා උත්තරීතර සමාජ සංවිධානය ලෙස සළකනු ලැබේ. මේ සම්බන්ධයෙන් බලපාන හේතු සාධක දෙකක් පෙන්වා දියහැක.
- එයින් එකක් වන්නේ මනුෂ්‍ය සමාජයක ජීවත් වන සියලුම මනුෂ්‍යයන්ගේ සහභාගිත්වයෙන් පිහිටුවා ගත් එකම සමාජ සංවිධානය රාජ්‍යය වීමය. වෙනත් කිසිදු සමාජ සංවිධානයකට එවැනි පොදු මනුෂ්‍ය සහභාගිත්ව පදනමක් නොමැත. ඒ සෑම සමාජ සංවිධානයක්ම සංවිධානය කර තිබෙන්නේ මනුෂ්‍ය සමාජයේ කොටසකගේ සහභාගිත්වයෙන් පමණි.
- රාජ්‍යය සතුවන බලාධිකාරී බලය දෙවන හේතු සාධකය වේ. බලාධිකාරී බලය යනුවෙන් හඳුන්වන්නේ බලය යොදවා බලය ක්‍රියාවට නැංවීමට ඇති හැකියාවයි. මෙම බලය දේශපාලන විද්‍යාව තුළ සාම්ප්‍රදායිකව හඳුන්වන්නේ ස්වාධිපත්‍ය බලය ලෙසය. එය සළකනු ලබන්නේ උත්තරීතර සහ අසහාය බලයක් ලෙසය.

- අනෙක් සෑම කරුණකටම වඩා රාජ්‍යය අනෙක් සමාජ සංවිධාන වලින් වෙනස් වන්නේත් සහ අනෙක් සමාජ සංවිධාන වලට වඩා රාජ්‍යය උත්තරීතර යැයි සළකනු ලබන්නේත් රාජ්‍යය සතු මෙම බලාධිකාරී බලය හේතුවෙනි.
- රාජ්‍යය විසින් රාජ්‍යය තුළ ජීවත් වන මානව ප්‍රජාව පාලනය කිරීම සඳහා නීති පනවන්නේත්, නීති ක්‍රියාවට නංවන්නේත් සහ නීති කඩකළ විට දඬුවම් පමුණුවන්නේත් මෙම බලය පදනම් කරගෙනය. මෙසේ පමුණුවන දඩුවම් සරල අවවාද කිරීමේ සිට මරණ දඩුවම දක්වා වෙනස් වියහැක. මෙයින් එක් දෙයක් පැහැදිලි වේ. එනම් දඩුවම් කිරීම හරහා කෙනෙකුගේ ජීවිතය වුවද නැතිකර දැමීමේ නීත්‍යානුකූල බලයක් රාජ්‍යයට හිමිවන බවය.
- මේ ආකාරයේ බලාධිකාරී බලයක් අනෙක් කිසිදු සමාජ සංවිධානයකට හිමි නොවේ. අනෙක් සමාජ සංවිධාන සතුව සාමාජිකයින් කෙරෙහි යෙදවිය හැකි යම් බලයක් තිබුනද එය රාජ්‍යය සතු බලාධිකාරී බලයට කිසිසේත්ම සම නොවේ. අනෙක් අතට එම බලය පවතින්නේ රාජ්‍යයේ බලාධිකාරී බලයට යටත්වය. අනෙක් සමාජ සංවිධාන සතු බලය රාජ්‍යයේ බලාධිකාරී බලය සමග ගැටීමක් ඇතිවුවහොත් එහිදී අනිවාර්යයෙන්ම සිදු වන්නේ සමාජ සංවිධානයේ බලය යටපත් වී රාජ්‍යයේ බලාධිකාරී බලය ක්‍රියාත්මක වීමයි. සමහර විට එම ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස සමාජ සංවිධානය මුළුමණින්ම විනාශ වී යාමයි.
- මීට ඉහතින්ද දැක්වූ පරිදි රාජ්‍යය අනෙක් සමාජ සංවිධාන වලට වඩා උත්තරීතර වීම කෙරෙහි බලපාන අනෙක් වැදගත් කරුණ වන්නේ පොදුභාවය සහ පෞද්ගලිකභාවය යන කරුණය. මෙයින් අදහස් කරන්නේ රාජ්‍යය පොදු සමාජ සංවිධානයක් වන බව සහ අනෙක් සෑම සමාජ සංවිධානයක්ම පෞද්ගලික සංවිධාන වන බවයි.
- මනුෂ්‍ය සමාජයක ජීවත් වන සියලුම මනුෂ්‍යයන්ගේ සහභාගිත්වයෙන් පිහිටුවා ගෙන ඇති එකම සමාජ සංවිධානය වන්නේ රාජ්‍යයයි. අනෙක් සෑම සමාජ සංවිධානයක්ම පිහිටුවා ගෙන තිබෙන්නේ මනුෂ්‍ය සමාජයක ජීවත් වන මනුෂ්‍යයන්ගෙන් කොටසකගේ සහභාගිත්වයෙන් පමණි. මේ අනුව රාජ්‍ය ක්‍රියාත්මක වන්නේ රාජ්‍යය තුළ ජීවත් වන සමස්ත මනුෂ්‍ය ප්‍රජාවම සඳහාය. රාජ්‍යය ක්‍රියාත්මක වන්නේ සමස්ත මනුෂ්‍ය ප්‍රජාවේ බලය පදනම් කර ගෙනය. එමෙන්ම රාජ්‍යය ස්ථාවර මෙන්ම අඛණ්ඩව පවතින සමාජ සංවිධානයක් වේ. මේ කිසිදු ගුණාංගයක් අනෙක් කිසිදු සමාජ සංවිධානයකට නොමැත. මේ හේතු සාධක නිසාවෙන් ද රාජ්‍යය අනෙක් සමාජ සංවිධාන වලට වඩා උත්තරීතර වේ.
- අන්තර්ජාතික දේශපාලනය කෙරෙහි අවධානය යොමුකරන විටද රාජ්‍යයේ උත්තරීතරභාවය දැකගත හැක. අන්තර්ජාතික දේශපාලනය හා සම්බන්ධ ක්‍රියාකාරිකයින් කිහිප දෙනෙක් දැකිය හැකි වූවද රාජ්‍යයන් හැරුන විට අනෙක් සෑම ක්‍රියාකාරිකයෙක්ම හඳුන්වන්නේ පෞද්ගලික ක්‍රියාකාරිකයින් ලෙසය. අන්තර්ජාතික සමාජයේ පැවැත්ම හෝ විනාශය සම්බන්ධයෙන් බලපාන තීරණාත්මක ක්‍රියාකාරිකයා වන්නේ රාජ්‍යයන්ය. එම නිසා අන්තර්ජාතික දේශපාලනය රාජ්‍යයන් අතර කෙරෙන්නාවූ දේශපාලනය ලෙස හඳුන්වයි.

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



B කොටසේ පළමුවන ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 75%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 46% ක් ද
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 31% ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 18% ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 5% ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ට වැඩියෙන් ලබා ගත් පිරිස 5%ක් වන අතර ලකුණු 6ට අඩුවෙන් ලබා ගත් පිරිස 46%කි. අපේක්ෂකන්ගෙන් 77%ක අති බහුතරයක් ලබා ගෙන ඇත්තේ 00 - 10 දක්වා වූ ලකුණකි.



මෙම ප්‍රශ්නය කොටස් රහිත තනි ප්‍රශ්නයක් වන අතර එහි පහසුතාව 34%කි.

දේශපාලන විද්‍යාව II ප්‍රශ්න පත්‍රයේ B කොටසේ පළමු වන ප්‍රශ්නය ලකුණු 20ක් හිමි තනි ප්‍රශ්නයකි. ලකුණු 10ට වැඩියෙන් ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 23%කි. එයින් ලකුණු 16 - 20 තෙක් ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 5%කි. මෙම ප්‍රශ්නයේ අරමුණ රාජ්‍යයේ උත්තරීතර බව හඳුනා ගැනීම පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය මැනීමයි. එහි දී මනුෂ්‍ය සමාජයක් තුළ මනුෂ්‍යයන් විසින් සංවිධානය කර ඇති සමාජ සංවිධානවල ස්වරූපය හඳුනා ගැනීම, එම සංවිධාන අතුරින් රාජ්‍යය උත්තරීතර සංවිධානයක් ලෙස සලකන්නේ ඇයි ? යන කරුණු සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීම සිදුකර යි.

දේශපාලන විද්‍යාවේ ප්‍රධාන ම මාතෘකාව වන්නේ රාජ්‍යය යි. පෙර වර්ෂවල රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඉදිරිපත් කර තිබුණ ද විභාග අපේක්ෂකයන්ගෙන් 77%ක් ම මෙම ප්‍රශ්නය සඳහා ලබා ඇත්තේ ලකුණු 11ට අඩුවෙනි. සාධන මට්ටම අඩුවීම වැළැක්වීම සඳහා ගත හැකි පියවරක් වන්නේ, රාජ්‍යයේ ස්වභාවය හඳුනා ගැනීම ආශ්‍රයෙන් ඉදිරිපත් කළ හැකි විවිධ ප්‍රශ්න සකසා නිශ්චිත කාලයක් තුළ පිළිතුරු සැපයීමට සිසුන් පුහුණු කිරීම යි.

මේ පිළිබඳ ව පහත සඳහන් නිරීක්ෂණ ද ඉදිරිපත් කළ හැකි ය. අපේක්ෂකයන්ගෙන් 75%ක ඉහළ ප්‍රතිශතයක් මෙම ප්‍රශ්නය තෝරා ගෙන තිබුණ ද ඔවුන් ප්‍රශ්නය නිසි ලෙස අවබෝධ කර ගෙන පිළිතුරු සපයා නැත. එසේ ම පෙර වර්ෂවල දී රාජ්‍යය යන තේමාව යටතේ විමසා තිබූ වෙනස් ස්වරූපයේ ප්‍රශ්නවලට අදාළ විෂය කරුණු ද මෙවර ප්‍රශ්නයට අදාළ ගැළපීම් නොකර ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නය මනා ලෙස කියවා එහි විෂය පථය අවබෝධ කර ගෙන සම්පිණ්ඩනය කර ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කළ යුතු ය.

2 ප්‍රශ්නය

2. පහත දැක්වෙන සංකල්ප අතුරෙන් ඕනෑම **දෙකක්** ගැන සාකච්ඡා කරන්න.

(i) ආණ්ඩුවේ ස්වභාවය
(ii) ආණ්ඩුවේ කාර්යයන්
(iii) ආණ්ඩු ක්‍රම වර්ගීකරණය

(i) ආණ්ඩුවේ ස්වභාවය

අභිමතාර්ථය : ආණ්ඩුව වූ කළී මිනිසුන් විසින් පිහිටුවා ගෙන තිබෙන තවත් සුවිශේෂී දේශපාලන සංවිධානයක් වේ. අනෙක් සමාජ සංවිධාන සමග සළකා බැලීමේදී ආණ්ඩුව නැමැති සංවිධානය සළකනු ලබන්නේද අසමසම සංවිධානයක් ලෙසය. එයට හේතුව රාජ්‍යය සතු පරමාධිකාරී බලය ක්‍රියාවට නැංවීමේ බලය ලත් එකම සංවිධානය ආණ්ඩුව වීමය. එබැවින් අනෙක් සෑම සමාජ සංවිධානයක්ම ආණ්ඩුවට යටත් වන අතර ඒවා ක්‍රියාත්මක විය යුත්තේ ආණ්ඩුවේ අණට සහ මෙහෙයවීමට යටත්වය. ආණ්ඩුව සතු මෙම සුවිශේෂී තත්ත්වය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීම මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වේ.

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු

(1) ආණ්ඩුව හඳුනා ගැනීම **(ලකුණු 04)**

(2) ආණ්ඩුව සුවිශේෂී සංවිධානයක් වන්නේ ඇයි? **(ලකුණු 04)**

(3) නිගමනය **(ලකුණු 04)**

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- රාජ්‍යයේ කැමැත්ත ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නැංවීම සඳහා රාජ්‍යයක් තුළ ජීවත් වන ජනතාව විසින් පිහිටුවා ගෙන ඇති දේශපාලන සංවිධානය ආණ්ඩුව ලෙස හැඳින්විය හැක.
- මේ අනුව රාජ්‍යයක පැවැත්ම සඳහා අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු එක් සංයුතික සාධකයක් ලෙස ආණ්ඩුව සැළකේ. එසේ වුවද රාජ්‍යය සමග සැසඳීමේදී ආණ්ඩුව කුඩා සංවිධානයක් වේ. එමෙන්ම න්‍යායාත්මකව සළකා බලන විට රාජ්‍යයේ භූමි ප්‍රදේශය තුළ ජීවත් වන සියලුම මිනිසුන් ආණ්ඩුවේ සාමාජිකයින් නොවනවාක් මෙන්ම රාජ්‍යයේ පැවැත්ම සඳහා අවශ්‍යයැයි සළකන නිශ්චිත භූමි ප්‍රදේශයක් තිබීම යන කරුණද ආණ්ඩුව සම්බන්ධයෙන් එතරම් අදාළ නොවේ. හේතුව රාජ්‍යයට අයත් දේශසීමා වලින් බැහැරව වුවද එම රාජ්‍යය වෙනුවෙන් ආණ්ඩුවට සමහර අවස්ථා වලදී ක්‍රියාත්මක වීමට හැකි වීමය.
- රාජ්‍යයක ස්වභාවය කුමක්ද යන්න තීරණය වන්නේ ආණ්ඩුවේ ස්වභාවය අනුවය. ඒ කෙරෙහි බලපාන්නේ ආණ්ඩුව විසින් අනුගමනය කරන දේශපාලන, ආර්ථික හා සමාජ දර්ශනයයි. එම දර්ශනය තීරණය වීම සම්බන්ධයෙන් වැදගත් වන කරුණු හතරක් තිබේ. එම කරුණු හතර වන්නේ, (1). රාජ්‍යයේ බල අධිකාරිය රඳ පවතින්නේ කවුරුන් අතද යන්න, (2). එම බල අධිකාරිය කොපමණ ප්‍රමාණයකින් භාවිතයට ගන්නවාද යන්න, (3). කුමන ආකාර බල ආයතන ඒ සඳහා යොදා ගන්නවාද යන්න සහ (4). කුමන ආකාර නීතිරීති සහ ක්‍රියාමාර්ග ඒ සඳහා යොදා ගන්නවාද යන්නයි. මෙම කරුණු හතරේ ඒකාබද්ධ ප්‍රතිඵලය ලෙස ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන රාජ්‍ය ප්‍රතිපත්ති වල ස්වභාවය තීරණය වේ.
- ආණ්ඩුව පිළිබඳව පොදු අර්ථකථනයක් දැකිය නොහැක. සමහරුන් ප්‍රකාශ කරන ආකාරයට ආණ්ඩුව යනු මිනිස් සමාජයක් තුළ මිනිසුන්ගේ පැවැත්ම හා සම්බන්ධ කාර්යයන් බලධාරී පදනමක් මත ක්‍රියාවට නංවන ආයතනය ආණ්ඩුව වේ. තවත් සමහරුන් ආණ්ඩුව හඳුන්වා දී ඇත්තේ මිනිස් සමාජය පාලනය කරන හා පරිපාලනය කරන ආයතනය ලෙසයි. තවත් අය ආණ්ඩුව අර්ථකථනය කර තිබෙන්නේ මිනිස් සමාජය පාලනය කරන පුද්ගල කණ්ඩායම ලෙසයි. රාජ්‍ය පාලනය ක්‍රියාවට නංවන විධික්‍රමය ආණ්ඩුව ලෙසද අර්ථකථනය කර ඇත.

- මේ සෑම අර්ථයකින්ම ප්‍රකාශ වන්නේ එකම අදහසක්ය. එනම් දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජය පාලනය කරන දේශපාලන යාන්ත්‍රණය ආණ්ඩුව ලෙස සැළකෙන බවය.
- ආණ්ඩුව මිනිසුන් විසින් පිහිටුවා ගෙන ඇති සමාජ සංවිධාන අතුරින් එකක් වූවද එය අනෙක් සමාජ සංවිධාන ඉක්මවා ගිය සුවිශේෂී සමාජ සංවිධානයක් ලෙස සළකනු ලැබේ. ඒ කෙරෙහි බලපාන හේතු සාධක කිහිපයක් පෙන්වා දිය හැක.
  1. සාමාජිකයින් වූවද නොවූවද රාජ්‍යය තුළ ජීවත් වන සියලුම පුරවැසියන් කෙරෙහි බලාධිකාරී බලය යෙදවිය හැකි එකම සංවිධානය වීම.
  2. බලාධිකාරී බලය පදනම් කරගෙන ඒකීය නීති පැනවීමේ හැකියාව ඇති එකම සංවිධානය වීම.
  3. පුරවැසියන්ගේ ජීවිතය හා මරණය සම්බන්ධයෙන් අවසාන තීරණ ගැනීමේ නීත්‍යානුකූල ඒකාධිකාරීබලය හිමි එකම සංවිධානය වීම.
  4. පරමාධිකාරී බලය යෙදවිය හැකි එකම සමාජ සංවිධානය ආණ්ඩුව වීම.

නිගමනය : **ඉහත දැක්වූ කරුණු වලින් පෙනී යන්නේ ආණ්ඩුව වූ කළී මිනිසුන් විසින් පිහිටුවා ගෙන තිබෙන සමාජ සංවිධාන අතුරින් එකක් වන බවය. එසේවූවද එය දේශපාලන සංවිධානයක් වන අතර රාජ්‍යය වෙනුවෙන් රාජ්‍යයේ පරමාධිකාරී බලය ක්‍රියාවට නංවන එකම ආයතනය වේ. එබැවින් ආණ්ඩුව අනෙක් සමාජ සංවිධාන ඉක්මවා ගිය සුවිශේෂී සමාජ සංවිධානයක් බවට පත් වේ. ඉහත දැක්වූ කරුණු වලින් පෙනී යන අනෙක් කරුණ වන්නේ රාජ්‍යයේ ස්වභාවය තීරණය වන්නේ ආණ්ඩුවේ ස්වභාවය මත බවය. ආණ්ඩුවේ ස්වභාවය තීරණය වන්නේ එය අනුගමනය කරන දේශපාලන, ආර්ථික හා සමාජ දර්ශනය සහ එය ක්‍රියාවට නැංවීම සඳහා භාවිතයට ගැණෙන ආණ්ඩුක්‍රම යාන්ත්‍රණයේ ස්වරූපය අනුව බව ය.**

(ii) ආණ්ඩුවේ කාර්යයන්

අභිමතාර්ථය : **මිනිසුන් විසින් රාජ්‍යය සංවිධානය කරනු ලැබූයේ ප්‍රීතිමත් සහ තෘප්තිමත් ජීවිතයක් ගතකිරීමට බව ඇරිස්ටෝටල් ප්‍රකාශ කළේය. රාජ්‍යය තුළ මෙම කාර්යභාරය පැවරී ඇත්තේ ආණ්ඩුවටය. මේ අනුව ආණ්ඩුව විසින් කළයුතු කාර්යභාරය අතිශයින්ම පුළුල් වේ. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ රාජ්‍යය තුළ ජීවත් වන ජනතාවට ප්‍රීතිමත් සහ තෘප්තිමත් ජීවිතයක් ගතකිරීම සඳහා ආණ්ඩුව විසින් කුමක් කළ යුතුද යන්න පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීම ය.**

පිළිතුරෙහි අන්තර්ගත වියයුතු මූලික කරුණු

(1) ආණ්ඩුවේ කාර්යයන් හඳුනා ගැනීම **(ලකුණු 06)**

(2) කාර්යයන් ක්‍රියාවට නංවන ආකාරය **(ලකුණු 02)**

(3) නිගමනය **(ලකුණු 02)**

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- ආණ්ඩුව වූ කළී රාජ්‍යයේ අපේක්ෂාවන් ක්‍රියාවට නංවන එහි ප්‍රායෝගික අංශය ලෙස සැළකේ. ඒ අනුව රාජ්‍යය බිහිකර ගැනීමෙන් මිනිසුන් බලාපොරොත්තු වූ කාර්යයන් ඉටු කිරීම ආණ්ඩුවේ වගකීම වේ.
- ආණ්ඩුවේ කාර්යයන් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක.
  1. අභ්‍යන්තර කාර්යයන් සහ
  2. බාහිර කාර්යයන් වශයෙනි.

- අභ්‍යන්තර කාර්යයන්

(අ). සමාජ ස්ථාවරභාවය ආරක්ෂා කොට පවත්වා ගෙනයාම

මෙයින් අදහස් කරන්නේ රට තුළ නීතිය හා සාමය පවත්වා ගෙන යාමය. මේ සඳහා ආණ්ඩුව ක්‍රියා කරන්නේ හමුදාව, පොලීසිය, අධිකරණය, බන්ධනාගාර සහ රාජ්‍ය සේවාව යනාදිය ප්‍රයෝජනයට ගනිමිනි.

(ආ). ආර්ථිකය කළමණාකරනය කිරීම

ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සුපරීක්ෂාකාරී වීම, ආර්ථික වෘද්ධිය වේගවත් කිරීම සඳහා ක්‍රියාකිරීම, ආර්ථික ප්‍රවණතාවන් ස්ථාවර කිරීම, ආර්ථිකයේ වැදගත් අංශ පාලනය කිරීම, යටිතල පහසුකම් සැපයීම, ආයාත-නිර්යාත පාලනය, රාජ්‍යය ව්‍යවසාය සංවිධානය කිරීම සහ කළමනාකරණය කිරීම යනාදී කාර්යයන් මෙයට අයත් වේ.

(ඇ). සමාජ සුභසාධන කාර්යයන්

ආණ්ඩුවක් සතු තවත් මූලික කාර්යයක් ලෙස සමාජ සුභසාධනය හැඳින්විය හැකි ය. නිර්බාධවාදී ප්‍රතිපත්තිය බිඳවැටී සමාජ සුභසාධනවාදය වර්ධනය වීමත් සමඟ සමාජ සුභසාධනය රජයේ වගකීමක් බවට පත්විය. වියපත් පුද්ගලයින්, අබල-දුබලතා සහිත පුද්ගලයින්, සේවා වියුක්තිකයින්, අසරණයින් වැනි සමාජ අවවරප්‍රසාදිත ජන කොටස් වලට ආධාර කිරීම, සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රම පවත්වා ගෙනයාම, නිවාස පහසුකම් සැලසීම, සමාජ රක්ෂණය, රැකියා අවස්ථා සැලසීම සහ විශේෂ සමාජ කොටස් එනම් යුද්ධ ආබාධිතයින් හා සරණාගතයින් වැනි අයට ආධාර කිරීම, මත්ද්‍රව්‍ය භාවිතය පාලනය කිරීම වැනි කාර්යයන් මෙයට අයත් වේ.

(ඈ). අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

පුරවැසියන් සතු සිවිල්, දේශපාලන හා සමාජීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම ආණ්ඩුවට පැවරේ. එමෙන්ම අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට යාන්ත්‍රණයක් සකස් කිරීම මෙන්ම අයිතිවාසිකම් භුක්ති විඳිය හැකි සාමකාමී පරිසරයක් ගොඩනැඟීම ද ආණ්ඩුවේ වගකීමකි.

(ඉ). සමාජ කළමණාකරනය

ගැටුම් කළමනාකරණය කිරීම සහ ගැටුම් විසඳීම, කම්කරු ආරවුල් සමථනය කිරීම, හදිසි ආපදා සහන සැලසීම වැනි කාර්යයන් මෙයට අයත් වේ.

(ඊ). පරිසර කළමණාකරණය

ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම, ජාතික උද්‍යාන සහ රාජ්‍යයේ ඉඩම් කළමණාකරණය, පරිසර දූෂණය වැලැක්වීම, සෞඛ්‍යයට අහිතකර අපද්‍රව්‍ය බැහැර කිරීම කළමණාකරණය කිරීම, යනාදී කාර්යයන් මෙයට අයත් වේ.

(උ). අධ්‍යාපන සහ සංස්කෘතික කාර්යයන්

අධ්‍යාපනය පවත්වා ගෙනයාම, ජාතික සංකේත පවත්වා ගෙනයාම සහ සංස්කෘතික කාර්යයන් යනාදිය මෙයට අයත් වේ.

ආණ්ඩුවේ බාහිර කාර්යයන්

විදේශ ප්‍රතිපත්තිය කළමණාකරණය කිරීම ආණ්ඩුවක ප්‍රධානතම බාහිර කාර්යය ලෙස සැළකේ. විදේශ ප්‍රතිපත්තියේ මූලික අරමුණ වන්නේ ජාතික අභිලාෂ ආරක්ෂා කොට පවත්වා ගෙනයාම සහ ප්‍රවර්ධනය කිරීමය. ප්‍රධාන ජාතික අභිලාෂ පහත සඳහන් පරිදි වේ.

1. **ජාතික ආරක්ෂාව තහවුරු කොට පවත්වා ගෙනයාම**
   මෙයින් අදහස් කරන්නේ ජාතික නිදහස, දේශසීමා ඒකාග්‍රතාව සහ භූමියේ අඛණ්ඩ පැවැත්ම ආරක්ෂා කොට පවත්වා ගෙන යාමය.
2. **ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සහ වර්ධනය කිරීම**
   අන්තර් ජාතික වෙළඳාම, අන්තර් ජාතික ආයෝජන ලබා ගැනීම හා කළමණාකරණය කිරීම, ණය හා වෙනත් අධාර ලබා ගැනීම යනාදිය මෙයට අයත් වේ.
3. **ජාතික මතවාදය ආරක්ෂා කොට පවත්වා ගෙනයාම**
   මෙයින් අදහස් කරන්නේ රාජ්‍යය විශ්වාස කරන ආර්ථික හා දේශපාලන දර්ශනය ආරක්ෂා කොට පවත්වා ගෙන යාමය.
4. **ජාතික අභිමානය ආරක්ෂා කොට පවත්වා ගෙනයාම**
   රටේ ගෞරවය සහ අභිමානය අන්තර්ජාතික වශයෙන් ආරක්ෂා කොට පවත්වා ගෙනයාම මෙයින් අදහස් වේ.

නිගමනය : ඉහතින් දැක්වූයේ ආණ්ඩුවක් විසින් ඉටුකරන කාර්යයන්ගේ දළ සටහනක්ය. ඒ දෙස බැලීමේදී පෙනී යන්නේ ආණ්ඩුවක් විසින් කරන කාර්යයන් පිළිබඳව නිශ්චිත සීමාවක් දැක්විය නොහැකි බවය. ආණ්ඩුවේ කාර්යයන් පිළිබඳව සාකච්ඡා කිරීමේදී පෙනීයන මූලික ලක්ෂණ දෙකක් තිබේ. එයින් එකක් වන්නේ ආණ්ඩුව විසින් කරන කාර්යයන් රටෙන් රටට වෙනස් වීමය. අනෙක් ලක්ෂණය වන්නේ එම කාර්යයන් කාලයෙන් කාලයට වෙනස් වීමය. අවසාන වශයෙන් කිවහැක්කේ ආණ්ඩුව අනුගමනය කරන දේශපාලන හා ආර්ථික දර්ශනය අනුව ද ආණ්ඩුවේ කාර්යයන්හි ස්වභාවය වෙනස් වන බවය.

(iii). ආණ්ඩුක්‍රම වර්ගීකරණය

අභිමතාර්ථය :ආණ්ඩු සම්බන්ධයෙන් වර්තමානයේ මෙන්ම අතීතය තුළද දැකිය හැකි ලක්ෂණය වන්නේ විවිධ ආණ්ඩුක්‍රම ලෝක රාජ්‍ය පද්ධතිය තුළ පවතින ආකාරයයි. ආණ්ඩු සම්බන්ධයෙන් මීළඟට දැකිය හැකි ලක්ෂණය වන්නේ එම ආණ්ඩු විවිධ නිර්ණායක යොදා ගනිමින් වර්ග කර තිබෙන ආකාරයයි. මෙසේ වර්ග කිරීම දේශපාලන විද්‍යාව විෂය අධ්‍යයන විෂයයක් වශයෙන් අධ්‍යයනය කිරීම ආරම්භ වූ දිනයේ සිටම දැකිය හැකි දෙයක් වේ. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ ඉහත දැක්වූ පරිදි ආණ්ඩුක්‍රම වර්ග කර ඇති ආකාරය සහ එසේ වර්ග කිරීම සඳහා භාවිතයට ගෙන තිබෙන නිර්ණායකයන් පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමය.

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු මූලික කරුණු

(1) ආණ්ඩුක්‍රම වර්ගීකරණයේ ඓතිහාසික පදනම **(ලකුණු 02)**

(2) නූතනයේ ආණ්ඩුක්‍රම වර්ග කරන ආකාරය **(ලකුණු 06)**

(3) නිගමනය **(ලකුණු 02)**

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- ආණ්ඩුක්‍රම වර්ග කිරීම, දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම ආරම්භ වූ ග්‍රීක යුගයේ සිටම පැවත එන දෙයක් ලෙස ප්‍රකාශ කළහැක. ලොව ප්‍රථම වරට ආණ්ඩුක්‍රම වර්ගීකරණයක් ඉදිරිපත් කළේ ග්‍රීක යුගයේ ජීවත් වූ දේශපාලන දාර්ශනිකයෙක් වන ප්ලේටෝ විසිනි. ඔහු සමකාලීනව පැවති ආණ්ඩුක්‍රම 1. පරමාදර්ශී ආණ්ඩු,
2. රාජාණ්ඩු,
3. කෲර ආඥාදායක ආණ්ඩු, 4. රදළ ආණ්ඩු, 5. කතිපයාධිකාරී ආණ්ඩු, 6. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු සහ 7. දූෂිත ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු වශයෙන් කොටස් හතකට වර්ග කරනු ලැබීය.
- මෙම ආණ්ඩුක්‍රම අතුරෙන් මුල් ආණ්ඩුක්‍රම හතර හොඳ ආණ්ඩු ලෙසද අවසාන තුන නරක ආණ්ඩු ලෙසද යළිත් වරක් එම ආණ්ඩුක්‍රම හත ප්ලේටෝ විසින් කොටස් දෙකකට වර්ග කරන ලදි.
- ඉන්පසුව ඇරිස්ටෝටල් විසින් (අ).ආණ්ඩුක්‍රමය ක්‍රියාවට නැංවීමට සම්බන්ධ වන පුද්ගල සංඛ්‍යාව සහ (ආ).ආණ්ඩුක්‍රමයේ ස්වභාවය යන නිර්ණායක දෙක පදනම් කරගෙන ආණ්ඩුක්‍රම කොටස් හයකට වර්ග කරන ලදි.
    1. රාජාණ්ඩ
    2. කෲර ආඥාදායක ආණ්ඩ
    3. රදළ ආණ්ඩු
    4. කතිපයාධිකාරී ආණ්ඩු
    5. ප්‍රජාතන්ත්‍රවාදී“ ආණ්ඩු
    6. දූෂිත ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු වශයෙනි.
- අනතුරුව එන රෝම සහ මධ්‍යතන යුගයන්හිදී ද දේශපාලන චින්තකයින් විසින් ආණ්ඩුක්‍රම වර්ග කරන ආකාරය දැකිය හැක. මේ සඳහා ඔවුන් අඩුවැඩි වශයෙන් භාවිතයට ගත්තේ ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් ආණ්ඩුක්‍රම වර්ගීකරණය සඳහා යොදාගත් නිර්ණායකයන්ය. මේ කාල පරිච්ඡේදය තුළදී ආණ්ඩුක්‍රම ප්‍රධාන වශයෙන්ම වර්ගීකරණය කළේ රාජාණ්ඩු, රදල ආණ්ඩු හා සමූහාණ්ඩු ක්‍රම වශයෙනි.
- නව යුගය තුළ මොන්ටෙස්කියු විසින් ආණ්ඩුක්‍රම, **සමූහාණ්ඩු, රාජාණ්ඩු සහ ආඥාදායක** වශයෙන් කොටස් තුනකට වර්ග කරන අතර රූසෝ විසින් **රාජාණ්ඩු, රදල ආණ්ඩු සහ ප්‍රජාතන්ත්‍රවාදී** ආණ්ඩු වශයෙන් ආණ්ඩුක්‍රම වර්ග කරන ආකාරය දැකිය හැකි වේ. බ්ලන්ට්ෂ්ලි විසින් රූසෝගේ වර්ගීකරණයට නව ආණ්ඩුක්‍රමයක් දේවධර්මවාදී ආණ්ඩු නමින් එක් කරන ලදි.

- මෑත කාලය තුළ ආණ්ඩුක්‍රම වර්ගීකරණය කළ දේශපාලන විද්‍යාඥයින් අතුරින් වැදගත් අයෙකු ලෙස ජේ. ඒ. ආර්. මැරියට් හඳුන්වා දිය හැක. ඔහු විසින් ආණ්ඩුක්‍රම කොටස් කිහිපයකට වර්ග කරන ලද්දේ සන්ධිය සහ ඒකීය (බලය මධ්‍යගතවීම හා විමධ්‍යගත වීම අනුව), නම්‍ය සහ අනම්‍ය (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන ආකාරය අනුව) සහ පාර්ලිමේන්තු සහ ජනාධිපති (විධායක හා ව්‍යවස්ථාදායක සම්බන්ධතා අනුව) වශයෙන් ප්‍රධාන කොටස් තුනකටය. මෙයට අමතරව ඔහු විසින් තවත් ආණ්ඩුක්‍රමයක් ඉදිරිපත් කරන ලද්දේ ආඥාදායක ආණ්ඩු වශයෙනි. මේ සඳහා පදනම ලෙස යොදා ගත්තේ විධායකය හා ව්‍යවස්ථාදායකය සතු බලතල වල ප්‍රමාණයයි. ව්‍යවස්ථාදායකය ඉක්මවා ගිය අධි බලයක් විධායකය භුක්ති විඳින්නේ නම් එවැනි ආණ්ඩු ඔහු විසින් හඳුන්වන ලද්දේ ආඥාදායක ආණ්ඩු ලෙසිනි.
- මෑත කාලයේ ආණ්ඩුක්‍රම වර්ගීකරණය සම්බන්ධයෙන් වැදගත් සැළැස්මක් ඉදිරිපත් කළ දේශපාලන විද්‍යාඥයෙකු ලෙස ස්ටීවන් ලීකොක් හඳුන්වා දිය හැක. ඔහු ඉදිරිපත් කළ සැළැස්ම පහත සඳහන් පරිදි වේ.



- වර්තමානයේ ආණ්ඩුක්‍රම වර්ගීකරණය සඳහා යොදා ගැනෙන ප්‍රධාන නිර්ණායක තුනක් හඳුනා ගතහැක. ඒවා වන්නේ;
  1. ආණ්ඩු පිළිගත් දේශපාලන හා ආර්ථික මතවාද අනුව
  2. බලය මධ්‍යගත වීම හා විමධ්‍යගත වීම අනුව
  3. ආණ්ඩුවේ විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව

1. දේශපාලන දර්ශනය අනුව ආණ්ඩුක්‍රම වර්ගීකරණ

- මේ යටතේ පහත දැක්වෙන ආණ්ඩුක්‍රම හඳුනා ගතහැක.
  I. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී
  II. සමාජවාදී
  III. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී

2. බලය මධ්‍යගත වීම හා විමධ්‍යගත වීම අනුව
  I. ඒකීය
  II. සන්ධිය
  III. සහසන්ධීය

3. විධායක බලය ක්‍රියාවට නංවන ආකාරය අනුව
  I. කැබිනට්/පාර්ලිමේන්තු
  II. ජනාධිපති
  III. අර්ධ ජනාධිපති
  IV. ඒකතන්ත්‍ර

නිගමනය : ඉහත දක්වා ඇත්තේ ආණ්ඩුක්‍රම වර්ගීකරණය ඓතිහාසික වශයෙන් පටන් ගෙන අද දක්වා ඉදිරියට ගමන් කර ඇති ආකාරයයි. එම ගමන් මාර්ගය දෙස බලන විට පෙනී යන්නේ කාලයෙන් කාලයට පැවති ආණ්ඩුක්‍රම වෙනස් වී තිබෙන ආකාරය සහ ඒ අනුව වර්ගීකරණ විධික්‍රම ද වෙනස් වී තිබෙන ආකාරයයි.

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



අපේක්ෂකයන්ගෙන් 53%ක් 2 ප්‍රශ්නය තෝරා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 45%ක් ද
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 36%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 16%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 3%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ට වැඩියෙන් ලබා ගත් පිරිස 3%ක් වන අතර, ලකුණු 05 හෝ ඊට අඩුවෙන් හෝ ලබා ගත් පිරිස 45%කි.



මෙම ප්‍රශ්නය කොටස් 3කින් සමන්විත ය. මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂයන්ගෙන් 41%ක් වූ වැඩි ම ප්‍රතිශතයක් (ii) කොටස තෝරා ගෙන ඇත. 20%ක් වූ අවම ප්‍රතිශතයක් (iii) කොටස තෝරා ගෙන ඇත.



39%ක ඉහළ ම පහසුතාව (iii) කොටස සඳහා දක්වා ඇත. අඩු ම පහසුතාව දක්වා ඇත්තේ (i) කොටසට ය. එහි පහසුතාව 31%කි.

මෙම ප්‍රශ්නය කොටස් තුනකින් යුක්ත ය. ඕනෑම කොටස් දෙකක් තෝරා ගෙන පිළිතුරු ලිවීමේ අවස්ථාව අපේක්ෂකයාට ලබා දී ඇත. මෙම ප්‍රශ්නයේ එක් කොටසකට ලකුණු 10 බැගින් කොටස් දෙකට ලකුණු 20ක් හිමි වේ. විභාග අපේක්ෂකයන්ගෙන් 53%ක් මෙම ප්‍රශ්නය තෝරා ගෙන තිබුණ ද ලකුණු 15ට වැඩියෙන් ලබා ගෙන ඇත්තේ 3%ක අවම පිරිසකි. වැඩි ම පිරිස, එනම් 45%ක පිරිසක් 0 - 5 ප්‍රාන්තරයේ ලකුණු ලබා ඇත. ප්‍රශ්නය තෝරා ගත් පිරිසෙන් 81%ක් ලකුණු 00 - 10 ප්‍රාන්තරයේ ලකුණු ලබා ඇත. ඉන් පැහැදිලි වන්නේ ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන්ගෙන් 81%ක් වූ බහුතරයකට ප්‍රශ්නයට හිමි ලකුණින් අඩකට වඩා ලබා ගැනීමට නොහැකි වූ බව යි.

I කොටස

මෙම ප්‍රශ්නයේ පළමුවන කොටස සඳහා 31%ක පහසුතාව දක්වා ඇත. 2 ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන්ගෙන් 39%ක ප්‍රතිශතයක් මෙම කොටසට පිළිතුරු සපයා තිබිණි. ආණ්ඩුව යනු කුමක් දැයි නිවැරදි ව හඳුනා නොගැනීමත්, ආණ්ඩුව, රාජ්‍යයක් තුළ පවතින අනෙකුත් සංවිධාන අතරින් උත්තරීතර සංවිධානය වන බව කරුණු සහිත ව ඉදිරිපත් නොකිරීමත් ඉහළ ලකුණු ලබා නොගැනීමට හේතු වී ඇත.

ආණ්ඩුව යනු කුමක් ද? එහි සුවිශේෂතා කවරේ ද ? යන කරුණු පන්ති කාමරය තුළ විස්තර සහිත ව සාකච්ඡා කරමින් රාජ්‍යය සහ ආණ්ඩුව අතර වෙනස අවබෝධ කර ගැනීමට අවස්ථාව සැලසීම මඟින් සිසුන් තුළ ආණ්ඩුවේ ස්වභාවය ගැන මනා අවබෝධයක් ඇති කළ යුතු යි.

II කොටස

දෙවන කොටස සඳහා 37%ක පහසුතාව දක්වා ඇත. මෙම ප්‍රශ්නයෙන් ආණ්ඩුවේ කාර්යයන් මොනවා ද? යන්න පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කරයි. 2 ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන්ගෙන් 41%ක ප්‍රතිශතයක් මෙම කොටසට පිළිතුරු සපයා තිබිණි. එහෙත් ඉහළ ලකුණු වෙත අපේක්ෂකයන් බහුතරයක් ළඟා වී නැත.

ඒ සඳහා ද මෙම ප්‍රශ්නයේ පළමුවන කොටසට ඇතුළත් කර ඇති ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි ය. ඊට අමතරව ආණ්ඩුවේ කාර්යයන් පිළිබඳ එදිනෙදා ජීවිතයේ දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලබන අත්දැකීම් ආශ්‍රිත ව තේරුම් ගැනීමට ඔවුන්ට මඟ පෙන්වීය යුතු ය.

III කොටස

තුන්වන කොටස සඳහා 39%ක පහසුතාව දක්වා ඇත. 2 ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන්ගෙන් 20%ක ප්‍රතිශතයක් මෙම කොටසට පිළිතුරු සපයා තිබිණි. මෙම ප්‍රශ්නයේ අරමුණ ආණ්ඩුක්‍රම වර්ගීකරණයේ ඓතිහාසික පදනම කුමක් ද? නූතනයේ ආණ්ඩුව වර්ග කරන්නේ කුමන අයුරින් ද? යන්න පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම යි.

ගැලීම් සටහන්, වගු, ප්‍රස්තාර, සංකල්ප සිතියම් ඇසුරින් ක්‍රියාකාරකම් පාදක කර කරුණු, අවධාරණය කරමින් පන්ති කාමරයේ ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යය සිදු කිරීමෙන් අපේක්ෂකයන්ගේ දැනුම වර්ධනය කළ හැකි ය.

3 ප්‍රශ්නය

3. පහත දැක්වෙන සංකල්ප අතුරෙන් ඕනෑ ම දෙකක් සාකච්ඡා කරන්න.

(i) නීතියේ ආධිපත්‍යය
(ii) බලතල වෙන් කිරීම
(iii) ව්‍යවස්ථානුකූලවාදය

(i) නීතියේ ආධිපත්‍යය

අභිමතාර්ථය : **නීතියේ ආධිපත්‍යය දේශපාලන විද්‍යාවේ පැරණිම සංකල්ප අතුරෙන් එකක් වේ. එමගින් අවධාරණය කරන්නේ නීතියේ උත්තරීතරභාවයයි. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ අත්‍යවශ්‍යම අංගයක් ලෙස නීතියේ ආධිපත්‍යය සළකනු ලැබේ. නීතියේ ආධිපත්‍යයෙන් තොරව පවතින පාලනය සළකනු ලබන්නේ අනධිකාරී පාලනයක් ලෙසය. නීතියේ ආධිපත්‍යය සංකල්පයේ මූලිකම ගුණාංගය වන්නේ නීතිය සියලු දෙනාටම ඉහළින් සිටින බවත් සහ නීතිය ඉදිරියේ සියලු දෙනාම එකසමාන වන බවත්ය. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ ඉහත දැක්වූ කරුණු සම්බන්ධයෙන් අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමය.**

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු

(1) නීතියේ ආධිපත්‍යය සංකල්පයේ මූලික ස්වභාවය හඳුනා ගැනීම (ලකුණු 05)
(2) සංකල්පයේ ප්‍රායෝගික භාවිතය (ලකුණු 03)
(3) නිගමනය (ලකුණු 02)

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- නීතියේ ආධිපත්‍යය යන සංකල්පය දේශපාලන විද්‍යාව විෂය තුළ පවතින පැරණි සංකල්පයකි. ප්ලේටෝ විසින් සිය සමූහාණ්ඩුව කෘතියෙන් ඉදිරිපත් කළ පරමාදර්ශී රාජ්‍යයේ නීතියේ පාලනයට යටත් නොවන දාර්ශනික පාලකයාගේ පාලනයට එරෙහිව ඇරිස්ටෝටල් විසින් නීතියේ පාලනයේ යෝග්‍යතාව පිළිබඳ අදහස ඉදිරිපත් කරනු ලැබීය. ග්‍රීක අවධියෙන් පසු එළඹෙන රෝම අවධියේ දී සිසරෝ විසින් ද නීතියේ ආධිපත්‍ය පිළිබඳව අදහස් ඉදිරිපත් කරනු ලැබීය.
- නීතියේ ආධිපත්‍යය පිළිබඳව නූතන මතය ඉදිරිපත් කරන්නේ 17 වන සියවස ආරම්භයේ දී බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමය තුළ රාජාණ්ඩුවාදීන් සහ පාර්ලිමේන්තුවාදීන් අතර පැන නැගුනු බල අරගලය පදනම් කොටගෙන ය. එහිදී පාලකයා රටේ පොදු නීතියට යටත්ව පාලනය මෙහෙය විය යුතු බව පාර්ලිමේන්තුවාදීන්ගේ මතය විය.
- නව යුගය තුළ නීතියේ ආධිපත්‍ය සම්බන්ධයෙන් විධිමත් හා ක්‍රමානුකූල අදහසක් ඉදිරිපත් කළේ බ්‍රිතාන්‍ය ජාතික නීතිවේදියෙකු වූ ඩයිසි විසිනි. ඔහු විසින් 1885 දී ප්‍රකාශයට පත් කෙරුනු Law of the Constitution කෘතිය තුළින් මෙම සංකල්පය ඉදිරිපත් කරනු ලැබීය.
- ඩයිසි නීතියේ ආධිපත්‍යය හා සම්බන්ධ මූලධර්ම තුනක් ඉදිරිපත් කළේ ය.
  I.රාජ්‍ය පාලනයේ දී සාමාන්‍ය නීතිය උත්තරීතර ලෙස සැලකීම
  II.නීතිය ඉදිරියේ සියලු දෙනාම එක හා සමානව සැලකීම
  III.පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කොට පවත්වාගෙන යෑම
- ඩයිසි ඉදිරිපත් කළ නීතියේ ආධිපත්‍ය සංකල්පයේ හරය වන්නේ ආණ්ඩුකරණය නීතියට අනුව පවත්වාගෙන යාමය. මේ අනුව සෑම පුද්ගලයෙකුම (පාලකයා මෙන්ම පාලිතයින් ද) නීතියට යටත් වන අතර ඔවුන් නීතිය ඉදිරියේ එක සමාන වේ. නීතියට ඉහළින් කිසිවෙකුත් නොවන අතර නීතිය ඉදිරියේ කිසිවෙකුටත් විශේෂ වරප්‍රසාද හිමි නොවේ.
- ඩයිසිට අනුව රටක් තුළ පැවතිය හැක්කේ එක් නීති ක්‍රමයක් පමණි. මෙමගින් අදහස් කරන්නේ ව්‍යවස්ථානුකූල නීතිය, ව්‍යවස්ථාදායකය විසින් පනවන නීති සහ අධිකරණ තීන්දු යන කොටස් තුනේ එකතුවෙන් ගොඩනැගී ඇති පොදු නීතියයි. පුරවැසියන්ට දඬුවම් කළ හැක්කේ පොදු නීතිය කඩකළහොත් පමණි.
- කරන ලද වරද විනිශ්චය කළ යුත්තේ රටේ පවතින සාමාන්‍ය උසාවි මගින් ඒ අවස්ථාවේ පවතින

නීතිය පදනම් කොටගෙනය. වරදකරු වුවහොත් නීතියෙන් නියම කරන ලද දඬුවම් පමණක් ලබා දිය යුතු ය. එමෙන්ම අපරාධයන් විනිශ්චය කිරීමට අලුතින් නීති පැනවීමට සහ අලුතෙන් උසාවි පිහිටුවීමට ද නොහැකි ය.

- පුරවැසි අයිතිවාසිකම් නීතියෙන් හිමි වූ දේ නොවන අතර නීතියෙන් කළ යුත්තේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම බව ද මෙමගින් අවධාරණය කෙරේ.

- ඩයිසි නීතියේ ආධිපත්‍ය සංකල්පය ඉදිරිපත් කර තිබෙන්නේ සමකාලීන එංගලන්තයේ ක්‍රියාත්මක වූ සාමාන්‍ය නීතිය පදනම් කොටගෙනය. එබැවින් එම සංකල්පයේ දුර්වලතා රැසක් දැකිය හැකි බව විචාරකයින් විසින් පෙන්වා දේ.
- එක් දුර්වලතාවක් වන්නේ තම න්‍යාය ගොඩ නැගීමේදී ඩයිසි විසින් සමකාලීන යුරෝපය තුළ සාමාන්‍ය නීතියට අමතරව ක්‍රියාත්මක වූ අනෙක් නීති සැළකිල්ලට නොගැනීමය. මේ කාලය වනවිට පරිපාලන නීති මෙන්ම පරිපාලන අධිකරණ ද ප්‍රංශය වැනි රටවල ක්‍රියාත්මක වෙමින් තිබුණි. නමුත් මේවායේ ක්‍රියාකාරිත්වය ගැන ඩයිසි අවධානය යොමු නොකළා පමණක් නොව ඔහුගේ විශ්වාසය වූයේ සාමාන්‍ය නීතියට අමතර ව පවතින වෙනත් ඕනෑම නීතියක් මිනිස් අයිතිවාසිකම් සීමාවීම කෙරෙහි බලපාන බවය. මෙම අදහස වැරදි බව විචාරකයින් පෙන්වා දේ.
- නීතිය ඉදිරියේ සියලු දෙනාම එක සමාන වනවාය යන ඩයිසිගේ දෙවන අදහසද වැරදි බව විචාරකයෝ පෙන්වා දෙති. මෙම අදහස ඉදිරිපත් කිරීමේදී ආර්ථික විෂමතාවන් අනුව සමාජය තුළ පවතින පංති විෂමතාවන් ඩයිසි සැළකිල්ලට ගෙන නොමැති බව විචාරකයෝ පෙන්වා දෙති.
- මිනිසුන්ට අයිතිවාසිකම් හිමිවන්නේ උපතින්ම මිස නීතියෙන් නොවන බවට ඩයිසි ඉදිරිපත් කරන තුන්වන අදහසද වැරදි බව ප්‍රකාශ කරන විචාරකයින් අරගල මගින් මිනිස් අයිතිවාසිකම් දිනා ගැනීමේ තත්ත්වයන් ඩයිසි සැළකිල්ලට ගෙන නොමැති බව තවදුරටත් කියා සිටිති.
- ඩයිසි ගේ සංකල්පය පසුකාලීනව දේශපාලන විද්‍යාඥයින් විසින් මෙන්ම නීතිවේදීන් විසින්ද තවදුරටත් සංවර්ධනය කරන ආකාරය දැකිය හැක. අද නීතියේ ආධිපත්‍යය සංකල්පයෙන් කරුණු රාශියක් අර්ථ ගැන්වේ. නීතියට අනුව රාජ්‍ය පාලනය මෙහෙයවීම හෙවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පදනම් කරගෙන රාජ්‍ය පාලනය මෙහෙයවීම, නීතිය සියලු දෙනාට එක සමාන වීම හා නීතියේ සමාන ආරක්ෂාව සියලු දෙනාට එක සමානව හිමිවීම, මිනිසුන්ගේ පෞද්ගලික සුරක්ෂිතතාව තහවුරු කිරීම, මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කොට පවත්වා ගෙනයාම, මාධ්‍යය නිදහස ආරක්ෂා කිරීම, ආගමික නිදහස ආරක්ෂා කිරීම, පුරවැසියන්ට අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිය තහවුරු කිරීම, නිදහසේ තමන් කැමති දේශපාලන පක්ෂයකට සම්බන්ධ වී දේශපාලනය කිරීමේ අයිතිය තහවුරු කිරීම, නිර්දෝශීභාවයේ පූර්ව නිගමනය යුක්තිය පසිඳලීමේ පදනම ලෙස යොදා ගැනීම සහ නඩු විභාග කිරීම ප්‍රසිද්ධියේ සහ විවෘතව කිරීම, අතීතයට බලපාන ලෙස නීති නොපැනවීම සහ අධිකරණයේ ස්වාධීනත්වය එම කරුණු අතර ප්‍රධාන වේ.

නිගමනය : **ඉහත දැක්වූ කරුණු සමස්තයක් ලෙස ගෙන සළකා බැලීමේදී පෙනී යන්නේ නීතියේ ආධිපත්‍යය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ පදනම වන බවය. වෙනත් ආකාරයකට කියනවානම් නීතියේ ආධිපත්‍යය පැවතිය හැක්කේ ව්‍යවස්ථානුකූල පාලනයක් තුළ විනා ආඥාදායක පාලන ක්‍රමයක් තුළ නොවන බවය. ආඥාදායක පාලනය හා නීතියේ ආධිපත්‍යය කිසිම විටක එකට ගමන් කරන දේවල් නොවේ. එම නිසයි නීතියේ ආධිපත්‍යය සංකල්පය ආණ්ඩු බලය සංවරණය කිරීමේ ඉතාම හොඳ උපකරණයක් ලෙස සළකනු ලබන්නේ.**

(ii) බලතල වෙන් කිරීම

අභිමථාර්තය : **ආණ්ඩු ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් දැකිය හැකි සදාතනික සත්‍යයක් වන්නේ ආණ්ඩුවේ බලය ක්‍රියාවට නැංවීම සඳහා සහභාගි වන පාලක පංතිය ඒ සඳහා ඔවුන් ජනතා ඡන්දයෙන් තේරී පත්වුවද නැතිනම් පාරම්පරිකව තේරී පත් වුවද එසේත් නොමැති නම් වෙනත් ආකාරයකින් තේරී පත් වුවද බලයට පත්වූ පසු රාජ්‍ය බලය අයථා ලෙස භාවිතා කිරීමට නිතැතින්ම පෙළඹෙන බවය. මේ තත්ත්වය වළක්වාලමින් ආණ්ඩු බලය නීතියට අනුකූලව ක්‍රියාවට නංවන්නේ කෙසේද? මේ සඳහා ඇති එකම විධික්‍රමය වන්නේ ආණ්ඩුවේ බලය සංවරණය කිරීමය. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති දේශපාලන න්‍යායන් අතුරෙන් එකක් වන්නේ බලතල**

බේදීමේ සිද්ධාන්තයයි. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ බලතල බේදීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? ආණ්ඩුවේ බලය සංචරණය කිරීමේ සංරෝධකයක් ලෙස එය යොදා ගන්නේ කෙසේද සහ එම න්‍යායේ ප්‍රායෝගික භාවිතය පිළිබඳව පවතින ගැටළු මොනවාද යන්න පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමය.

පිළිතුරෙහි අඩංගු විය යුතු මූලික කරුණු

(1) ආණ්ඩුවේ බලය බෙදා වෙන්කළ යුත්තේ ඇයි? **(ලකුණු 02)**

(2) බලතල බේදීමේ න්‍යායේ අන්තර්ගතය **(ලකුණු 04)**

(3) බලතල බේදීමේ න්‍යායේ වාසි හා අවාසි **(ලකුණු 02)**

(4) නිගමනය **(ලකුණු 02)**

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- සංචරණය හා පාලනය නොකරන ලද ආණ්ඩු බලය නියත ලෙසම ආඥාදායකත්වයක් බිහිවීම කෙරෙහි බලපානු ලැබේ. එබැවින් ආණ්ඩුව ආඥාදායක වීම වැලැක්වීම සඳහා මෙන්ම ජනතාවගේ නිදහස ආරක්ෂා කිරීම සඳහාත් ආණ්ඩුවේ බලය සීමාවන්ට යටත් කළ යුතු බව ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම මූලධර්ම මගින් අවධාරණය කෙරේ. මේ සඳහා භාවිතයට ගතහැකි ඉතාම හොඳ උපකරණයක් ලෙස බලතල බේදීමේ න්‍යාය සැළකේ.
- ආණ්ඩුවේ බලය විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණ වශයෙන් කොටස් කර එකිනෙකට වෙන් වූ ආයතන තුනක් මගින් ක්‍රියාවට නැංවීම දේශපාලන විද්‍යාව තුළ හඳුන්වන්නේ බලතල බේදීම වශයෙන්ය.
- බලතල බේදීමේ න්‍යාය දේශපාලන විද්‍යාවේ හමුවන තවත් පැරණි න්‍යායක් හැටියට හඳුන්වා දිය හැක. මේ සම්බන්ධයෙන් දල අදහසක් ප්‍රථම වරට ඉදිරිපත් කළේ ග්‍රීක යුගයේදී ඇරිස්ටෝටල් විසිනි. ඔහු විසින් ආණ්ඩුවේ කාර්යයන් කරුණු සාකච්ඡා කිරීම, පොදු වැඩ කටයුතු පරිපාලනය කිරීම සහ යුක්තිය පසිඳලීම යනුවෙන් කොටස් තුනකින් සමන්විත වන බවත් එම කාර්යයන් වෙනම ආයතන මගින් ක්‍රියාවට නැංවිය යුතු බවත් ප්‍රකාශ කළේය.
- රෝම යුගයේ ජීවත් වූ පොලිබියස් සහ සිසරෝ විසින් ද ආණ්ඩුවේ බලතල අතර තුලනයක් පිළිබඳව අදහස් ඉදරිපත් කළහ. ඒ හැරුණු විට බොඩෑන් විසින් ද විධායක බලය සහ අධිකරණ බලය වෙනත් පුද්ගලයන්ගෙන් හෝ ආයතන මගින් ක්‍රියාත්මක කළ යුතු බව පෙන්වා දෙන ලදී. එමෙන්ම ඉංග්‍රීසි ජාතිකයන් වූ ක්‍රොම්වෙල් සහ ජෝන් ලොක් විසින් ද ආණ්ඩුවේ කාර්යයන් බෙදා වෙන් කර ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි.
- බලතල බේදීමේ අදහස විධිමත් ලෙස ඉදිරිපත් කරනු ලැබුයේ ප්‍රංශ ජාතික චාල්ස් මොන්ටෙස්කියු විසිනි. ඔහු විසින් 1748 දී රචිත නීතියේ සාරය (The Spirit of Laws) කෘතිය මගින් මෙම සංකල්පය ඉදිරිපත් කළේය.
- බලතල බේදීමේ න්‍යාය ඉදිරිපත් කරමින් මොන්ටෙස්කියු කියා සිටියේ නිරන්තර අත්දැකීම් මගින් අපට පෙන්වා දෙන එක් සත්‍යයක් වන්නේ බලය දරන්නන් විසින් බලය අයථා ලෙස යෙදවීමට පෙළඹී තිබෙන බවයි. ඔහු තවදුරටත් ප්‍රකාශ කරන ආකාරයට "බලය එක්තැන් වීම නියත ලෙසම අනතුරුදායක වේ. එය නියත ලෙසම ආඥාදායකත්වයට මග පාදනු ලැබේ. මෙය වැලැක්විය හැක්කේ ආණ්ඩුවේ බලය විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ වශයෙන් බෙදා වෙන්කොට ක්‍රියාවට නැංවුව හොත් පමණි. බලය පාලනය කළයුතු අතර එය කළ හැක්කේ බලය තවත් බලයකින් පාලනය කිරීමෙන් පමණි."
- මොන්ටෙස්කියු තවදුරටත් දක්වන ආකාරයට "සීමාවන්ට යටත් නොකරන ලද බලයක් යම් අයෙකුට හිමිවේද ඔහු නියත ලෙසම බලය අයථා ලෙස යෙදවීමට පෙළඹේ. යම් අවස්ථාවක ව්‍යවස්ථාදායක සහ විධායක බලතල එක් පුද්ගලයෙකු අත හෝ පුද්ගලයින් කිහිප දෙනෙකුගෙන් සමන්විත එක් ආයතනයක් වෙත ඒකරාශී වේද එවැනි තත්ත්වයක් තුළ නීති සම්පාදනය කරන්නා සහ නීති ක්‍රියාත්මක කරන්නා එකම පුද්ගලයෙකු හෝ එකම ආයතනයක් වන බැවින් ඒකාධිපති ස්වරූපයේ නීති ක්‍රියාත්මක වීම හේතුවෙන් මිනිස් නිදහස අහෝසි වේ. එයාකාරයටම යම්

අවස්ථාවක අධිකරණ බලය ව්‍යවස්ථාදායක බලය සමග එකට එකතු වී පවතින්නේ නම් එහිදී නීති සම්පාදකයා විනිශ්චයකරුවකු වන බැවින් හිතුවක්කාරී පාලනයකට මග පාදනු ඇත. එමෙන්ම අධිකරණය විධායකය සමග එක්තැන් වී තිබේ නම් එහි " විධායකය නියත වශයෙන්ම හිංසාකාරී සහ පීඩාකාරී ආයතනයක් බවට පත් වේ. යම් අවස්ථාවක විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ යන ත්‍රිවිධ බලතල එක් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් මත හෝ ඒකරාශී වන විට එය මිනිස් නිදහසේ අවසානය වනු ඇත."

- මොන්ටෙස්ක්‍යු අවධාරණය කරන්නේ අධිකාරී බලය ක්‍රියාවට නංවන ආණ්ඩුව යම් ආකාරයක සීමාවන්ට යටත් නොකළ හොත් හිතුවක්කාරී, අත්තනෝමතික සහ ආඥාදායක පාලනයක් ඇති වීමට හැකියාවක් පවතින බවත්, එබැවින් ආණ්ඩුවේ ත්‍රිවිධ බලතල එනම් විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ බලතල ක්‍රියාත්මක කිරීම එකිනෙකින් වෙන් වූ ස්වාධීන ආයතන තුනක් මගින් කළයුතු බවත්ය. මෙයට අමතරව ආයතන තුනේ ක්‍රියාකාරිත්වය එකිනෙක ආයතනයේ පෞද්ගලික ක්‍රියාකාරිත්වය මගින් සංවරණය කළයුතු බවද ඔහු තවදුරටත් කියා සිටියේය.
- මොන්ටෙස්ක්‍යුගේ න්‍යාය ආණ්ඩු බලය සංවරණය කිරීම සඳහා යොදාගත හැකි ඉතාම හොඳ සහ කාර්යක්ෂම උපකරණයක් ලෙස පොදුවේ පිළි ගත්තද එහි ප්‍රායෝගික භාවිතය සම්බන්ධ-යන් ගැටලු කිහිපයක්ද පවතින බව විචාරකයෙක් පෙන්වා දෙයි.
- එක් ගැටලුවක් වන්නේ ස්ථාවර සීමා නිර්ණයන් අනුව බලතල කාණ්ඩ තුන එකිනෙකින් වෙන් කිරීමට නොහැකි වීමය. දෙවැන්න වන්නේ ශුද්ධ බල බෙදීමක් කළහොත් ඇතිවිය හැකි ආයතනික හුදකලාභාවය හේතුවෙන් ආණ්ඩු යාන්ත්‍රණය අකාර්යක්ෂම වීමය. තුන්වැන්න වන්නේ විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ යන කාර්යයන් නිශ්චිත අයුරින් එකිනෙකින් වෙන් කිරීමට අපහසු වීමය. සිව්වැන්න වන්නේ බලතල බෙදීම මගින් පමණක්ම මිනිස් නිදහස ආරක්ෂා කිරීමට නොහැකි වීමය.
- මෙම වැරදීම් වලට හේතුව වැරදි පදනමක සිට බලතල බේදීමේ න්‍යාය ඉදිරිපත් කිරීම නිසා බව විචාරකයෙක් පෙන්වා දෙති. මොන්ටෙස්ක්‍යු බලතල බෙදීමේ න්‍යාය ඉදිරිපත් කළේ බ්‍රිතාන්‍ය තුළ කරන ලද සංචාරයක අත්දැකීම් පදනම් කර ගෙනය. එම සංචාරයේදී ඔහුට පෙනී ගියේ මහාද්වීපික යුරෝපා ජනතාවට වඩා සාපේක්ෂ වශයෙන් බ්‍රිතාන්‍ය ජනතාව නිදහස භුක්ති විඳින බවත් එයට හේතුව බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළ ක්‍රියාත්මක වන බලතල බේදීම බවත්ය. නමුත් මෙම තේරුම් ගැනීම වැරදි බව යි විචාරකයින් පෙන්වා දී ඇත්තේ.

න්‍යායේ භාවිතය

- බලතල බෙදීමේ න්‍යාය ඇමෙරිකානු ව්‍යවස්ථා සම්පාදකයින් විසින් තම ආණ්ඩු ක්‍රමයේ මූලික පදනම ලෙස යොදාගනු ලැබීය. ඒ අනුව ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ වශයෙන් බලතල වෙන්කොට ඒවා ක්‍රියාවට නැංවීම කොන්ග්‍රස් මණ්ඩලය, ජනාධිපති සහ ශ්‍රේෂ්ඨාධිකරණය යන ආයතන තුනට පවරා දේ. එයට අමතරව ආයතන විසින් බලතල අවභාවිත කිරීම වැළැක්වීම සඳහා ඉතාම දැඩි සංවරණ හා තුලන මූලධර්ම යාන්ත්‍රණයක්ද ආණ්ඩුක්‍රමයට යා කරවා ඇත.
- ඉන් අනතුරුව ලෝකයේ රාජ්‍යයන් බොහොමයක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේදී බලතල බෙදීමේ සිද්ධාන්තය අඩුවැඩි වශයෙන් භාවිතාවට ගෙන ඇත.

නිගමනය : **කුමන ආකාරයේ විවේචන ඉදිරිපත් වුවද ආණ්ඩුවේ ආඥාදායක පාලනයෙන් ජනතාවගේ නිදහස සහ අයිතිවාසිකම් ආරක්ෂා කරලීම සඳහා භාවිත කළ හැකි ආණ්ඩුක්‍රමික උපක්‍රමයක් ලෙස බලතල බෙදීමේ න්‍යාය සමකාලීන ලෝක දේශපාලනය තුළ පිළිගැනීමට ලක් ව තිබේ.**

(iii) ව්‍යවස්ථානුකූලවාදය

අභිමතාර්ථය: **සාමාන්‍ය ව්‍යවහාරයේදී ව්‍යවස්ථානුකූලවාදය යන්නෙන් අදහස් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පදනම් කරගෙන රාජ්‍ය පාලනය ක්‍රියාවට නැංවීමය. නමුත් ව්‍යවස්ථානුකූලවාදයෙන් අදහස් කරන්නේ එපමණක් ම නොවේ. ව්‍යවස්ථානුකූල පාලනයට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කාලාන්තරයක් තිස්සේ දේශපාලන ක්‍රමයේ නීතිමය පදනම ලෙස පැවතීම, ජනතාවගේ ගෞරවයට හා භක්තියට ලක්වීම, අවසානයේදී ජනතාව අදහන හා විශ්වාස කරන සිවිල් ආගමක තත්ත්වයට පත්වීම යන කරුණුද ව්‍යවස්ථානුකූලවාදය යන්නෙන් අර්ථවත්**

වේ. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ ඉහත දැක්වූ කරුණු පිළිබඳවත් සහ මුල්බැසගත් ව්‍යවස්ථානුකූලවාදයක ඇති ප්‍රයෝජනවත්භාවය පිළිබඳවත් අපේක්ෂකයින්ගේ දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීමය.

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු කරුණු

(i) ව්‍යවස්ථානුකූලවාදයේ මූලික ලක්ෂණ (ලකුණු 06)

(ii) ව්‍යවස්ථානුකූලවාදයේ ප්‍රයෝජනවත්භාවය (ලකුණු 02)

(iii) නිගමනය (ලකුණු 02)

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- සාමාන්‍ය ව්‍යවහාරය අනුව ව්‍යවස්ථානුකූලවාදය යනුවෙන් අදහස් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පදනම් කරගෙන රාජ්‍ය පාලනය පවත්වා ගෙන යාමය. එවැනි පාලන ක්‍රමයක් තුළ ව්‍යවස්ථානුකූල නීතිය උත්තරීතර වන අතර එම හේතුවෙන් ආණ්ඩුක්‍රමය තුළ නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක වේ. එබැවින් ව්‍යවස්ථානුකූලවාදය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සඳහා අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු කොන්දේසියක් ලෙස පිළිගැනේ.

- ව්‍යවස්ථානුකූල පාලනය ව්‍යවස්ථානුකූලවාදයේ අත්‍යවශ්‍යම ලක්ෂණය වුවද ව්‍යවස්ථානුකූලවාදයෙන් අදහස් වන්නේ එම කරුණ පමණක්ම නොවේ. හේතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබූ පමණින්ම රටක ස්ථිරසාර ව්‍යවස්ථානුකූලවාදයක් පවතින බව එක එල්ලේම නිගමනය කිරීමට අපහසු වීමය.

- රටක ස්ථිරසාර ව්‍යවස්ථානුකූලවාදයක් ස්ථාපිත වීම කෙරෙහි බලපාන හේතු සාධක ගණනාවක් තිබේ. ඒවා නම්,
  - (අ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක පැවැත්ම සහ ව්‍යවස්ථානුකූල නීතිය රාජ්‍ය පාලනයේදී උත්තරීතරත්වයේ ලා සැළකීම.
  - (ආ). ව්‍යවස්ථාව කාලීන අවශ්‍යතාවන් අනුව වෙනස් වෙමින් අඛණ්ඩව ජනතාව සමග ඉදිරියට ගමන් කිරීම.
  - (ඇ). ව්‍යවස්ථාව මගින් පදනම සපයන ආණ්ඩුක්‍රමය ජනතා හිතකාමී එකක් වීම.
  - (ඈ). ව්‍යවස්ථාව මගින් නිශ්චිත ව්‍යවස්ථානුකූල දර්ශනයක් සැපයීම. එනම් සමාජ ප්‍රගමනය සඳහා ඉවහල් වන දේශපාලන, ආර්ථික හා සමාජ දර්ශනයක් සැපයීම.
  - (ඉ). ව්‍යවස්ථාව නිතර නිතර වෙනස් නොකිරීම. විශේෂයෙන්ම දේශපාලනඥයින්ගේ පෞද්ගලික ඕනෑ එපාකම් අනුව ව්‍යවස්ථාව වෙනස් නොකිරීම.
  - (ඊ). අධිකරණ විවරණ බලය ක්‍රියාත්මක කිරීම. එනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථකථනය කිරීමේ බලය අධිකරණයට පැවරීම.
  - (උ). පාලිතයින් මෙන්ම පාලකයින්ද එකසේ ව්‍යවස්ථාවට ගරු කිරීම හා පිළිපැදීම.

- රටක ව්‍යවස්ථානුකූවාදය ස්ථාවර ලෙස මුල්බැස ගත්විට දැකිය හැකි ලක්ෂණය වන්නේ ව්‍යවස්ථාව කෙරෙහි ජනතාව තුළ වර්ධනය වන විශ්වාසය හේතුවෙන් ව්‍යවස්ථාවට ගරු කිරීමට පෙළඹීමය. ගරු කිරීම තුළින් ජනතාව තුළ ව්‍යවස්ථානුකූල භක්තිය ඇතිවේ. ව්‍යවස්ථානුකූල භක්තිය හේතු කොටගෙන ව්‍යවස්ථාව පූජනීය දෙයක් ලෙස සැළකීමට ජනතාව පෙළඹෙන අතර එහි අවසාන ප්‍රතිඵලය වන්නේ ව්‍යවස්ථානුකූල භක්තිය සිවිල් ආගමක තත්ත්වයට වර්ධනය වීමය. මේ සම්බන්ධයෙන් දියහැකි හොඳම නිදසුන වන්නේ ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවය.

- ස්ථිරසාර ව්‍යවස්ථානුකූලවාදයක් පවතින විට එමගින් ඇතිවිය හැකි වාසි රාශියක්ම තිබේ. එයින් එකක් වන්නේ ස්ථිරසාර දේශපාලන ක්‍රමයක් ගොඩනගා පවත්වා ගෙන යාමට හැකි වීමය. දෙවැන්න වන්නේ රටේ දේශපාලන ක්‍රමයට සුජාතභාවය හා ස්ථාවරභාවය එමගින් සැපයීමය. තුන්වැන්න වන්නේ දේශපාලන ක්‍රීඩාව එයට අදාල නීතිරීති අනුවම කිරීමේ පුහුණුවක් දේශපාලන ක්‍රීඩකයින්ට ලැබීමය. සිව්වැන්න වන්නේ විප්ලව හෝ කැරලි කෝලාහලවලින් තොරව දේශපාලන බලය හුවමාරු කර ගැනීමට හැකි වීමය. පස්වැන්න වන්නේ ජනතාවගේ නිදහස හා අයිතිවාසිකම් මැනවින් ආරක්ෂා කර ගැනීමට හැකි වීමය.

නිගමනය: ඉහත දක්වන ලද කරුණු වලින් පෙනී යන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ පදනම ව්‍යවස්ථානුකූලවාදය වන බවය. එමෙන්ම එයින් අයත් කරගත හැකි වාසි විශාල ප්‍රමාණයක්ද පවතින බවය. නමුත් රටක ස්ථිරසාර ව්‍යවස්ථානුකූලවාදයක් ගොඩනගා ගැනීමද පහසු දෙයක් නොවේ. ඒ සම්බන්ධයෙන් බලපාන එක් හේතුවක් වන්නේ ව්‍යවස්ථාව නොසළකා හරිමින් බලය ක්‍රියාවට නැංවීමට පාලකයින් පෙළඹීම ය. දෙවන හේතුව වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තුළ සමහරවිට පවතින අපූර්වතාවන්ය. තුන්වන හේතුව වන්නේ සමහරවිට විශේෂ අවශ්‍යතාවන් සඳහා වුවද ව්‍යවස්ථාව වෙනස් කිරීමට නොහැකි වීමය.

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



අපේක්ෂකයන්ගෙන් 43%ක පිරිසක් 3 ප්‍රශ්නය තෝරා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 20කි.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 30%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 9%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ට වැඩියෙන් ලබා ගත් පිරිස 9%ක් වන අතර ලකුණු 06ට අඩුවෙන් ලබා ගත් පිරිස 28%කි. අපේක්ෂකයන්ගෙන් 63%කට 06 - 15 දක්වා ලකුණු ලබා ගැනීමට හැකි වී ඇත.



මෙම ප්‍රශ්නය කොටස් 3කින් සමන්විතය. ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගෙන් 41%ක් වූ වැඩි ම ප්‍රතිශතයක් (ii) කොටස තෝරා ගෙන ඇති අතර 20%ක් වූ අවම ප්‍රතිශතයක් (iii) කොටස තෝරා ගෙන ඇත.



වැඩි ම පහසුතාව (ii) කොටස සඳහා ලැබී ඇත. එහි පහසුතාව 52%ක් වේ. ඉතිරි කොටස්වල පහසුතාව 50%ට අඩු ය. ඉන් (iii) කොටස සඳහා 46%ක අඩු ම පහසුතාව දක්වා ඇත.

මෙම ප්‍රශ්නයේ කොටස් තුනෙන් කොටස් දෙකක් තෝරා ගෙන පිළිතුරු ලිවිය යුතු ය. එක් කොටසකට ලකුණු 10 බැගින් කොටස් දෙකට ලකුණු 20ක් හිමි වේ. අපේක්ෂකයන්ගෙන් 43%ක් මෙම ප්‍රශ්නය තෝරා ගෙන තිබිණි.

I කොටස

මෙම කොටසේ පහසුතාව 48%ක් වේ. තුන්වන ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන්ගෙන් 39%ක ප්‍රතිශතයක් මෙම කොටස තෝරා ගෙන ඇත. නීතියේ ආධිපත්‍යය යන සංකල්පයේ මූලික ස්වභාවය පිළිබඳ අපේක්ෂකයන් සතු දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කෙරේ. මෙම සංකල්පය පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය මධ්‍යස්ථ මට්ටමක පවතින බව ඉහත ප්‍රස්තාරයෙන් පෙනී යයි.

නීතියේ ආධිපත්‍ය සංකල්පයේ මූලික ස්වභාවය හඳුනා ගෙන ඇති බවත් සංකල්පයේ ප්‍රායෝගික භාවිතය මෙන් ම නීතියේ ආධිපත්‍ය ප්‍රජාත්‍රන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ පදනම වන බවත් එය පැවතිය හැක්කේ ව්‍යවස්ථානුකූල පාලනයක් තුළ මිස ආඥාදායක පාලන ක්‍රමයක් තුළ නොවන බවත් අපේක්ෂකයන්ගේ පිළිතුරුවල අන්තර්ගත විය යුතු වුව ද අපේක්ෂකයන් බොහෝ පිරිසකගේ පිළිතුරු සංකල්පයේ මූලික ස්වභාවයට පමණක් සීමා වී ඇත. එලෙස ප්‍රමාණාත්මක ව කරුණු ඉදිරිපත් නොකිරීම ද අඩු ලකුණු ලැබීමට හේතු වී ඇත.

නීතියේ ආධිපත්‍යය යනු ලංකාවේ වත්මන් මහජන දේශපාලන සාකච්ඡා තුළ නිරන්තර අවධානයට යොමු වී ඇති තේමාවකි. එම මහජන සාකච්ඡා සමඟ සම්බන්ධ කරමින්, මෙම මාතෘකාව පිළිබඳ පුලුල් සංවාදයක් පන්ති කාමරය තළ සිදු කර සිසුන්ගේ අවබෝධය පුළුල් කිරීමට පියවර ගත යුතු ය. සාර්ථක පිළිතුරක් ගොඩනැගීම සඳහා අභ්‍යාසකරණයේ යෙදවීම ද ඉතා වැදගත් වේ.

II කොටස

ප්‍රශ්නයේ වැඩි ම පහසුතාව දැක් වූ මෙම කොටසේ පහසුතාව 52%කි. තුන්වන ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන්ගෙන් 41%ක ප්‍රතිශතයක් මෙම කොටසට පිළිතුරු සපයා තිබිණි. පෙර වර්ෂවල ඇගයීමට ලක් කළ ප්‍රශ්නයක් වීමත්, බලතල වෙන් කිරීම පිළිබඳ මෙම ප්‍රශ්නයට අදාළ කරුණු නිරන්තරයෙන් සාකච්ඡා වීමත් මෙම ප්‍රශ්නයේ පහසුතාව ඉහළ යාමට හේතු වී ඇත.

බලතල බෙදා වෙන් කළ යුත්තේ ඇයි ද යන්නත් ආණ්ඩුවේ ආඥාදායක පාලනයෙන් ජනතාවගේ නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා කරලීම සඳහා ලෝක දේශපාලනය තුළ පිළිගැනීමට ලක් ව ඇති ආකාරයත් උදාහරණ සහිත ව පන්ති කාමරය තුළ සාකච්ඡා කිරීමෙන් බලතල වෙන් කිරීම සම්බන්ධයෙන් සිසුන්ට පූර්ණ අවබෝධයක් ලබාදිය හැකි ය. තවද නූතන දේශපාලන තත්ත්වයන් හා සමඟ සම්බන්ධ කරමින් පිළිතුරු සැපයීමෙන් ඉහළ ලකුණු ලබා ගැනීමට හැකිවේ. න්‍යායයට පමණක් සීමා නොවී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සාකච්ඡා තුළ බලය කේන්ද්‍ර ගත වීම සම්බන්ධයෙන් ඇති වූ විවේචන ද ඇසුරු කර ගෙන බලතල බෙදීමේ සංකල්පය පිළිබඳ පිළිතුරු සැපයීමට සිසුන් යොමු විය යුතු ය.

III කොටස

ප්‍රශ්නයේ 46%ක් වූ අඩු ම පහසුතාව මෙම කොටස සඳහා ලැබී ඇත. තුන්වන ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන්ගෙන් අඩු ම ප්‍රතිශතයක් එනම් 20%ක ප්‍රතිශතයක් මෙම කොටසට පිළිතුරු සපයා තිබිණි. ව්‍යවස්ථානුකූලවාදයේ මූලික ලක්ෂණ හා එහි ප්‍රයෝජනවත් භාවය පිළිබඳ සිසුන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ. නමුත් අපේක්ෂකයන් වඩාත් සාර්ථක පිළිතුරක් ගොඩ නැඟීමට අපොහොසත් වී ඇත.

ව්‍යවස්ථානුකූලවාදය පිළිබඳ සංකල්පය පැරණි වුව ද ඒ පිළිබඳ ව අපේක්ෂකයන්ගේ දැනුම සහ අවබෝධය ප්‍රමාණවත් නොවූ බව පෙනී යයි. මෙම මාතෘකාවට අදාළ ව්‍යවස්ථානුකූලවාදයේ මූලික ලක්ෂණ සහ ප්‍රයෝජනවත් භාවය පිළිබඳ ව ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම ඇසුරු කර ගෙන පන්ති කාමරය තුළ සිදුකරනු ලබන හරවත් සාකච්ඡා මගින් සිසු දැනුම වර්ධනය කිරීමට කටයුතු කිරීමෙන් මෙම තත්ත්වය මඟහරවා ගත හැකි ය. මෙම තේමාව ද ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සාකච්ඡාවේ සමකාලීන ව සෘජුව මතු වී තිබෙන බැවින් ඒ පිළිබඳ ව සිසුන්ගේ අවධානය පහසුවෙන් යොමු කළ හැකි ය.

මෙවැනි ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී න්‍යායාත්මක පදනම ප්‍රායෝගික භාවිතය, වාසි අවාසි සහ නිගමන ද සහිත ව පිළිතුරු සැපයීමට අපේක්ෂයන්ට මඟ පෙන්වීම වැදගත් වේ. අදාළ මාතෘකා සඳහා පිළිතුරු ගොඩ නඟන ආකාරයත් ඇතුළත් විය යුතු විෂය කරුණු පිළිබඳ ව අවබෝධයත් ලබා දී ඒවා සාකච්ඡා කරමින් පිළිතුරෙහි අඩුපාඩු සහ ප්‍රබලතා පෙන්වා දීමත් සාර්ථක පිළිතුරු ලැබෙන තෙක් පිළිතුරු සැපයීමට මඟ පෙන්වීමත් වැදගත් වේ. සාර්ථක පිළිතුරු සැපයූ පසු මෙවන් මාතෘකා පිළිබඳ පිළිතුරු සැපයීමට යොමු කරමින් සතතාභ්‍යාසයට යොමු කිරීම මගින් ඉහළ ලකුණු ලබා ගැනීමට මඟ පෑදෙනු ඇත.

4 ප්‍රශ්නය

4. පහත දැක්වෙන ඒවායින් ඕනෑ ම **දෙකක්** විස්තර කරන්න.
   (i) රාජ්‍ය - පුරවැසි සම්බන්ධතාව
   (ii) සිවිල් සමාජය
   (iii) යහපාලනය

- මෙම ප්‍රශ්නයේ අන්තර්ගත වන්නේ සමකාලීන දේශපාලන කතිකාව තුළ සාකච්ඡාවට භාජනය වන ප්‍රධාන ගණයේ මාතෘකා තුනක්ය. ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ මෙම මාතෘකා පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කර බැලීමය. පිළිතුරු ඇගයීමේ දී පහත දැක්වෙන කරුණු වලට අවධානය යොමු කරන්න.

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු වැදගත් කරුණු

(1) මාතෘකාව ගැන අපේක්ෂකයා පෙන්නුම් කරන අර්ථ ග්‍රහණයේ ප්‍රමාණවත් භාවය (ලකුණු 02)
(2) මාතෘකාව පිළිබඳ න්‍යායාත්මක දැනුම (ලකණු 03)
(3) දේශපාලන විද්‍යාත්මක වැදගත්කම (ලකුණු 03)
(4) පිළිතුරෙහි ඇති හරයාත්මක වැදගත්කම (ලකුණු 02)

ආදර්ශ පිළිතුර සාරාංශ වශයෙන් (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

(i) රාජ්‍ය-පුරවැසි සම්බන්ධතාව

- රාජ්‍යය සහ පුරවැසිභාවය යනු අන්‍යොන්‍ය වශයෙන් එකිනෙක මත රඳාපවතින දේශපාලන සංසිද්ධීන් දෙකකි. නූතන රාජ්‍යයෙහි විශේෂයෙන් ප්‍රකාශ වන පරිදි රාජ්‍යයක් සංස්ථාපනය වන්නේ පුරවැසි සමූහයකින් යුතු දේශපාලන ප්‍රජාවක් වශයෙනි. එමෙන්ම පුරවැසි සමූහයක් දේශපාලන ප්‍රජාවක් ලෙස පවතින්නේ ඔවුන් රාජ්‍යයක් තුළ සංවිධානය වී සිටින විටය.
- ඒ අනුව මනුෂ්‍යයන් පුරවැසියන් වන්නේ රාජ්‍යයක් තුළ සහ රාජ්‍යයක් හා සම්බන්ධවය. රාජ්‍යය රාජ්‍යයක් වන්නේ එය දේශපාලන වශයෙන් සංවිධානය වූ පුරවැසි සමූහයකගේ දේශපාලන අධිෂ්ඨානය කැටිකර ගන්නා හෙයිනි.

- ''පුරවැසිභාවය''යන්නට ඇති අර්ථකථන ආශ්‍රයෙන් ද අපට රාජ්‍යය සහ පුරවැසියා අතර සම්බන්ධය දැකිය හැකිය. පුරවැසිභාවය යනු රාජ්‍යයක සාමාජිකත්වයයි. තනි පුද්ගල මනුෂ්‍යයෙකු පුරවැසියෙකු වන්නේ රාජ්‍යයේ සාමාජිකත්වය ලබන නිසාය.

- රාජ්‍යය සහ පුරවැසියා අතර සම්බන්ධය දේශපාලන සම්බන්ධයක් ද වේ. එම දේශපාලන සම්බන්ධතාවයේ ලක්ෂණය නම් අයිතිවාසිකම් සහ වගකීම් සමූහයක් මාධ්‍යය කොටගෙන රාජ්‍යය සහ පුරවැසියන් එකිනෙකා සමඟ ගනුදෙනු කිරීමයි. රාජ්‍යයේ පුරවැසිභාවය ලබන එහි සාමාජිකයින්ට ආරක්ෂාව සැපයීම, ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරිත්වයට අවශ්‍ය අවකාශය සහ ආයතන සැපයීම, පුරවැසියන් අතර ඇති ගැටුම් නිරාකරණය සහ සාධාරණ ලෙස ආරාවුල් විසඳීම රාජ්‍යය සතු වගකීම් ය. ඊට හුවමාරු වශයෙන් පුරවැසියෝ තම පක්ෂපාතිත්වය රාජ්‍යය වෙතට පළකරති, අයබදු ගෙවති, යහපත් පුරවැසියන් ලෙස ක්‍රියා කරති. මේවා රාජ්‍යය සහ පුර වැසියන් පිළිබඳව දේශපාලන න්‍යායෙන් අවධාරණය කෙරේ.

- නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය තුළ රාජ්‍යය සහ පුරවැසියා අතර මෙම සම්බන්ධය තීරණය කිරීමේ මූලික අයිතිවාසිකම් වලින් ඉටුකෙරෙන්නේ තවත් වැදගත් කාර්යයකි. රාජ්‍යය පුරවැසියන්ගේ දේශපාලන පක්ෂපාතිත්වය සහ රාජ්‍යයේ බලයට කීකරු වීම අපේක්ෂා කරන ගමන්ම, පුරවැසියන්ගේ නිදහස සහතික කිරීම රාජ්‍යයේ වගකීමක් ලෙස සැළකේ. මූලික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියක් නූතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල පැවැතිය යුතුයැයි සැළකෙන්නේ එබැවිනි. එය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ දේශපාලන න්‍යායෙන්ද අවධාරණය වේ.

- අවසාන වශයෙන් කිව හැක්කේ රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු රාජ්‍යය සහ පුරවැසියා අතර සම්බන්ධතාව තීරණය කරන පදනම් ලේඛනය බවයි. එ මගින් සමාජය වෙත රාජ්‍යය සතු වගකීම් හා කාර්යභාරයන් ද, පුරවැසියන් රාජ්‍ය සමග ඇති බැඳීමේ නෛතික සහ මූලධර්මික පදනම් ද ප්‍රකාශ වේ.

(ii) සිවිල් සමාජය

- නූතන දේශපාලන න්‍යායට එකතු වී ඇති මෙම සංකල්පයෙන් මූලික වශයෙන් අදහස් වන්නේ, රාජ්‍යයෙන් ස්වාධීනව, තම පොදු අවශ්‍යතා සඳහා සාමූහිකව හෝ කණ්ඩායම් හෝ වශයෙන් ක්‍රියාකිරීමට පුරවැසියන්ට ඇති අවකාශයයි. මෙය නූතන ධනවාදී සමාජයේ ද, ප්‍රජාතන්ත්‍රවාදයේ ද ඇති විශේෂ ලක්ෂණයක් ලෙසද සැළකේ. සිවිල් සමාජය පිළිබඳ දේශපාලන න්‍යායේ ඒකමතිකත්වයක් නැත. හේගල් සහ මාක්ස් ඉදිරිපත් කළ සිවිල් සමාජය පිළිබඳ සම්භාව්‍ය ප්‍රවේශයේ ''සිවිල් සමාජය''යන සංකල්පය යොදා ගනු ලැබුවේ''ධනවාදී වෙළඳපොළ''යන අර්ථයෙනි. එහි දී හේගල් ''සිවිල් සමාජය''දුටුවේ පුද්ගල නිදහසේ අවකාශය ලෙසයි. ඊට පටහැණිව මාක්ස් සිවිල් සමාජය දුටුවේ පුද්ගල ආත්මාර්ථකාමිත්වයේ අවකාශය ලෙසය. එහෙත් පසුකාලයේ " ''සිවිල් සමාජය''යන්නට ඊට බෙහෙවින් වෙනස් අර්ථයක් ලැබිණ. තම පොදු අභිලාෂ ඉටුකර ගැනීමට, ආණ්ඩුවෙන් ද දේශපාලන පක්ෂවලින් ද ස්වාධීනව පුරවැසියන් පිහිටුවන සංවිධාන සහ එම සංවිධාන පිහිටුවා ගැනීමට පුරවැසියන් සතු සමාජ අවකාශය හැඳින්වීමටත් එම සංකල්පය භාවිතා කෙරිණ. ඇමෙරිකාවේ 'ප්‍රජාතන්ත්‍රවාදය' යන කෘතිය ලියූ ඇලෙක්සි ද තොක්විල් නම් දේශපාලන චින්තකයා මෙම නව අර්ථයේ පුරෝගාමිකයෙකි.''සිවිල්''යන වචනයේ ඇති''පුරවැසි''යන අර්ථය මෙම නව අර්ථකථනයෙන් අවධාරණය වේ. පුරවැසි සහභාගිත්වය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට වැදගත් වන්නේය යන අදහස එයින් අවධාරණය වේ.

- සිවිල් සමාජ ව්‍යාපාර, දේශපාලන පක්ෂවලට සමාන්තර දේශපාලන ආයතනික ප්‍රකාශන ලෙස ද නූතන ප්‍රජාතන්ත්‍රවාදී න්‍යාය තුළ සැළකේ. දේශපාලන පක්ෂවල න්‍යාය පත්‍රයට ඇතුල් කර නොගන්නා මහජන ඉල්ලීම් සහ ප්‍රතිපත්ති යන කාරණා සිවිල් සමාජ ව්‍යාපාරවල න්‍යාය පත්‍රවලින් අවධාරණය කිරීම එයට හේතුවයි.

- නූතන ප්‍රජාතන්ත්‍රවාදය තුළ සිවිල් සමාජයට විශේෂ වැදගත්කමක් ලැබේ. පුරවැසියෝ සිය පොදු අරමුණු සඳහා විවිධ සංවිධාන පිහිටුවා ගනිති. එමෙන්ම තම අරමුණු දිනා ගැනීමට සමාජ ව්‍යාපාර ගොඩ නගති. ස්වේච්ඡා සමිති, වෘත්තීය සමිති, කම්කරු ව්‍යාපාර, ගොවි ව්‍යාපාර, ස්ත්‍රී ව්‍යාපාර හා ශිෂ්‍ය ව්‍යාපාර මේවාට නිදසුන්ය. මෙවැනි සිවිල් සමාජ ව්‍යාපාර පැවතීමත්, ඒවා සක්‍රීයව පැවතීමත්, පුරවැසි දේශපාලන සහභාගිත්වයේ මාධ්‍යයක් ද වේ. එබැවින් ''සිවිල් සමාජය''යන්න නූතන ප්‍රජාතන්ත්‍රවාදයට ද, ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ න්‍යායට ද වැදගත් වේ.

(iii) යහපාලනය

- මෙය සමකාලීන ලංකාවේ දේශපාලන විවාදයට එකතු වී ඇති සංකල්පයකි. 2015 පැවති ජනාධිපති සහ පාර්ලිමේන්තු මැතිවරණවල දී, එම සංකල්පය ප්‍රධාන දේශපාලන සටන් පාඨයක් ලෙස ද මතු විය.
- 'යහපාලනය'යන සංකල්පය තුළ ආණ්ඩුකරණය පිළිබඳ අදහස් කිහිපයක්ම ගැබ් වී තිබේ. ඒවා නම් දූෂණයෙන් තොර ආණ්ඩුකරණය, මර්දනයෙන් සහ භීෂණයෙන් තොර ආණ්ඩුකරණය, නීතියේ ආධිපත්‍යයට සහ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට අනුව සිදුවන ආණ්ඩුකරණය සහ විනිවිදභාවයෙන් යුතු මහජනතාවට වගකියන ආණ්ඩුකරණය යන මේවාය.

- දේශපාලන සංකල්පයක් ලෙස''යහපාලනය''යන්න, ලංකාව වැනි රටවල පසුගිය කාලයේ සිදු වූ''ප්‍රජාතන්ත්‍රවාදයේ පරිහාණිය''පිළිබඳ පසුබිම තුළ මතු වූවකි. ආණ්ඩු බලය සහ දූෂණය එකට බැඳීම, ආණ්ඩුව මර්දනකාරී වීම, නීතියේ පාලනය බිඳ වැටීම යන සාධක නිසා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිරිහීමට පත්වීමත්, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණ ආයතන දුර්වල වීමත්, පුරවැසියන් අතර දේශපාලන කලකිරීම පැතිරීමත් දක්නට ලැබිණ. මෙම පසුබිම තුළ''ප්‍රජාතන්ත්‍රවාදය යළි ශක්තිමත් කිරීම''යන ඉලක්කය ''යහපාලනය'' යන සංකල්පයේ තිබිණ.
- දූෂණය, බලය අවභාවිත කිරීම සහ දේශපාලනඥයින් මහජනතාවට වගනොවීම, වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමවල ඇති පරිහාණියේ ලක්ෂණයි. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණ සාරධර්ම වලට අලුත් ප්‍රවේශයක් අවශ්‍ය වී තිබිණ."යහපාලනය" පිළිබඳ සංකල්පය ලංකාවේ ප්‍රභවය ලැබුවේ එම පරිහානිය ආණ්ඩුකරණය සමග අත්වැල් බැඳ ගැනීමේ පසුබිම තුළය. එම නිසාම මෙම සංකල්පය දේශීය වශයෙන් ප්‍රභවය ලැබූ දේශපාලන සංකල්පයක් ලෙසද සැළකිය හැකිය. එය එහි නව ලිබරල්වාදී අර්ථයෙන් වෙනස් වන්නේ එබැවිනි.
- "යහපාලනය" යන්නෙහි නව ලිබරල්වාදී අර්ථය වන්නේ, විවෘතතාවය විනිවිදතාවය සහ වගවීම යන ලක්ෂණවලින් යුත් ආණ්ඩුකරණයයි. ඊට වෙනස්ව ලංකාවේ දේශපාලන කතිකාව තුළ "යහපාලනය" යන්න ආණ්ඩුකරණයේ ප්‍රජාතන්ත්‍රීකරණය පිළිබඳ ඉලක්කය සමග සෘජුව බැඳුනකි.
- "යහපාලනය" පිළිබඳ කතිකාව දැන් ලංකාවේ දුර්වල වී තිබේ. එයට ප්‍රධාන හේතුව, යහපාලන මූලධර්ම ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව අසමත් වීමයි. දේශපාලන පොරොන්දුවක් වශයෙන් "යහපාලනය" යන අදහස කොතරම් වැදගත් වුවද, දේශපාලන භාවිතයේ දී එය දුෂ්කර අරමුණක් වී තිබෙන බව එමගින් පෙනේ.

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



B කොටසේ අඩු ම තෝරා ගැනීමත් සහිත ප්‍රශ්නය මෙයයි. අපේක්ෂකයන්ගෙන් 39%ක් මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇත. මෙම ප්‍රශ්නය කොටස් තුනකින් සමන්විත වන අතර ඕනෑ ම කොටස් දෙකකට පිළිතුරු සැපයිය හැකි ය. එක් කොටසකට හිමි වන ලකුණු සංඛ්‍යාව 10කි. මෙම ප්‍රශ්නයට මුළු ලකුණු 20ක් හිමි වේ.

ඉන්	ලකුණු 00 - 05	ප්‍රාන්තරයේ	40%ක්	ද
	ලකුණු 06 - 10	ප්‍රාන්තරයේ	28%ක්	ද
	ලකුණු 11 - 15	ප්‍රාන්තරයේ	24%ක්	ද
	ලකුණු 16 - 20	ප්‍රාන්තරයේ	08%ක්	ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ට වැඩියෙන් ලබා ගත් පිරිස 8%ක් වන අතර ලකුණු 06ට අඩුවෙන් ලබා ගත් පිරිස 40%කි. එමෙන් ම අපේක්ෂකයන්ගෙන් 52%ක පිරිසකට 06 - 15 අතර ලකුණු ලබා ගැනීමට හැකි වී තිබේ.



මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගෙන් 38%ක් වූ වැඩි ම ප්‍රතිශතයක් (iii) කොටස තෝරා ගෙන ඇති අතර 26%ක් වූ අවම ප්‍රතිශතයක් (i) කොටස තෝරා ගෙන ඇත.



මෙම ප්‍රශ්නයට අදාළ කොටස් තුනෙන් (ii) හා (iii) කොටස් සඳහා 47% ක වැඩි ම පහසුතාව දක්වා ඇත.

I කොටස

මෙම කොටස ප්‍රශ්නයේ තෝරා ගැනීම සහ පහසුතාව අඩු ම කොටස යි. එහි පහසුතාව 40%කි. මෙම ප්‍රශ්නයෙන් රාජ්‍යය හා පුරවැසියා අතර ඇති සම්බන්ධතාව පිළිබඳ අපේක්ෂකයන් සතු දැනුම දේශපාලන විද්‍යාත්මක ව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව පරීක්ෂා කරයි. අපේක්ෂකයන්ට මෙම කොටසට සාර්ථක පිළිතුරු ගොඩ නැඟීමට අපහසු වී ඇත.

රාජ්‍යය හා පුරවැසියා අතර කෙබඳු සම්බන්ධතාවක් පවතින්නේ ද යන්න පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම වර්ධනය කිරීමට කටයුතු කිරීමෙන් මෙම තත්ත්වය මඟහරවා ගත හැකි ය. රාජ්‍යය හා පුරවැසියා අතර පවත්නා සම්බන්ධතාව සෑම කෙනෙකු ම දෛනික ජීවිතයේ දී අත්දකින හා නිරීක්ෂණය කරන සංසිද්ධියකි. මේ පිළිබඳ පන්ති කාමරයේ දී සාකච්ඡා කිරීම මගින් ගුරුවරුවන්ගේ ද සිසුන්ගේ ද අවබෝධය පුළුල් කර ගැනීමට උත්සාහ ගත යුතු ය.

II කොටස

මෙම කොටසට 47%ක පහසුතාව දක්වා ඇත. නූතන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය තුළ වැදගත් කාර්යයක් ඉටුකරන සමාජ බලවේගයක් ලෙස, සිවිල් සමාජයේ වැදගත්කම අවධාරණය කිරීම සඳහා අපේක්ෂකයන්ට ඇති දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ.

සිවිල් සමාජය පැරණි එහෙත් නූතන අර්ථයක් ලබා ඇති සංකල්පයකි. අපේක්ෂකයන්ට මෙම සංකල්පය පිළිබඳ ව ඇති අවබෝධය ප්‍රමාණවත් නොවන බව පෙනී යයි. පෙර වර්ෂයක අසන ලද ප්‍රශ්නයක් වුව ද අපේක්ෂකයන්ට සාර්ථක ව පිළිතුරු සැපයීමට නොහැකි වී ඇත.

සිවිල් සමාජය සම්මුතිවාදය යටතේ සාකච්ඡා කළ ද නූතනයේ ඉන් ඉදිරියට ගියා වූ සිවිල් සමාජ සංකල්පය කෙරෙහි අවධානයක් යොමු නොකිරීම හා අධ්‍යයනය නොකිරීම අඩු ලකුණු ලැබීමට හේතු වී ඇත. පෙර වර්ෂවල දේශපාලන විද්‍යාව විෂයයේ ලකුණු දීමේ පටිපාටි අධ්‍යයනය කිරීමෙන් තවදුරටත් විෂය දැනුම ඒකරාශි කර ගත හැකි වේ. කාලීන දේශපාලන දැනුම කෙරෙහි ගුරු සිසු දෙපිරිස ම අවබෝධයෙන් සිටීමේ අවශ්‍යතාව මෙහි දී අවධාරණය වේ.

මාතෘකාවට අදාළ ව සිවිල් සමාජයේ වගකීම හා ක්‍රියාකාරිත්වය පිළිබඳ සමකාලීන ලෝකයේ මෙන් ම ලංකාවේ ද නිදසුන් යොදා ගනිමින් දැනුම වර්ධනය කිරීමට කටයුතු කිරීමෙන් මෙම තත්ත්වය මඟ හරවා ගත හැකි ය.

III කොටස

මෙම ප්‍රශ්නය සඳහා ද 47%ක පහසුතාව ලැබී ඇත. පෙර වර්ෂවල ඇගයීමට ලක්කළ ප්‍රශ්නයක් වීම, ජනමාධ්‍ය තුළ මෙම ප්‍රශ්නයට අදාළ කරුණු නිරන්තරයෙන් සාකච්ඡා කිරීම හා එම කරුණු ශිෂ්‍ය ප්‍රජාවට සම්ප්‍රේෂණය වීම මෙම කොටසේ පහසුතාව මධ්‍යස්ථ මට්ටමක පැවතීමට හේතු වී ඇත. මෙම කොටසේ දී අපේක්ෂකයන් දක්වා ඇති දුර්වලතාව වන්නේ යහපාලන සංකල්පයේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය දේශපාලන සමාජයට බද්ධ කර නිදසුන් මඟින් පැහැදිලි කර නො තිබීමයි.

ලංකාවේ සමකාලීන දේශපාලන විවාදයට එකතු වී ඇති මෙවැනි සංකල්ප පිළිබඳ හරවත් සාකච්ඡා මෙන් ම විවාද පන්ති කාමරය තුළ සිදු කිරීමෙන් මෙවැනි ප්‍රශ්න සඳහා සාර්ථක පිළිතුරු සැපයීමට අවශ්‍ය දැනුම සිසුන්ට ලැබෙනු ඇත. පෙර වර්ෂවල ලකුණු දීමේ පටිපාටි අධ්‍යයනය කිරීමේ වැදගත්කම මෙහි දී ද අවධාරණය වේ.

C කොටස

5 ප්‍රශ්නය

5. "ශ්‍රී ලංකාවේ දේශපාලනය, ආර්ථික හා සමාජ පරිවර්තනය සඳහා කෝල්බෘක්-කැමරන් ප්‍රතිසංස්කරණවල දායකත්වය සාකච්ඡා කරන්න.

අභිමතාරථය : 1833 කෝල්බෘක්-කැමරන් ප්‍රතිසංස්කරණ සළකනු ලබන්නේ ශ්‍රී ලංකාව දේශපාලන වශයෙන් රාජාණ්ඩු පාලන ක්‍රමයකින් නූතන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සහිත රාජ්‍යයකටත්, ආර්ථික වශයෙන් වැඩවසම්වාදී රාජ්‍යය ක්‍රමයකින් ධනවාදී රාජ්‍ය ක්‍රමයකටත් සහ සමාජයීය වශයෙන් නවීකරණය නොවූ පසුගාමී තත්ත්වයක පැවති රාජ්‍යයක් නවීකරණය වූ නූතන රාජ්‍යයක් බවටත් පරිවර්තනය වීම කෙරෙහි ආරම්භක පදනම දැමූ අතිශය වැදගත් දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිසංස්කරණයක් ලෙසය. මෙම ප්‍රශ්නයේ අරමුණ වන්නේ මෙම කරුණ සම්බන්ධයෙන් අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමය.

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු මූලික කරුණු

(1) කෝල්බෘක්=කැමරන් ප්‍රතිසංස්කරණ යෝජනා හඳුනා ගැනීම **(ලකුණු 06)**

(2) එම යෝජනාවල ප්‍රතිඵල **(ලකුණු 12)**

(3) නිගමනය **(ලකුණු 02)**

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- 1829 වර්ෂයේදී බ්‍රිතාන්‍ය යටත් විජිත කාර්යාලය විසින් යටත් විජිතයේ තත්ත්වය පිළිබඳව පරීක්ෂා කර බලා වාර්තා කිරීම පිණිස ඩබ්ලිව්. එම්. ජී. කෝල්බෘක් සහ සී. එච්. කැමරන් දෙදෙනාගෙන් සමන්විත කොමිෂන් සභාවක් පත් කෙරේ.
- කොමිෂන් සභාව විසින් ස්වකීය වාර්තාව 1833 වර්ෂයේදී ඉදිරිපත් කරනු ලැබීය. වාර්තාව මගින් ලංකාව සාම්ප්‍රදායිකත්වයෙන් මුදවා ගෙන නව රාජ්‍යයක් බවට ක්‍රමානුකූලව පරිවර්තනය කිරීම ඉලක්ක කරගෙන යෝජනා රාශියක් ඉදිරිපත් කරන ලදි. එම අරමුණු සහ යෝජනා පහත දැක්වේ.

1. ආණ්ඩුකරණය ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණ හා ඒ පිළිබඳ අදාළ යෝජනා
   (අ). ආණ්ඩුකාරවරයා සතුව පැවති සමහර හිතුවක්කාරී හා අත්තනෝමතික බලතල ඉවත් කිරීම
   (ආ). ආණ්ඩුකාරවරයාට සහාය වීම පිණිස විධායක සහ ව්‍යවස්ථාදායක සභා පිහිටුවීම
2. පරිපාලන ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීම පිළිබඳ අදාළ යෝජනා
   (අ). මුහුදුබඩ සහ උඩරට පළාත් ඒකාබද්ධ කිරීම
   (ආ). මහජනතාවගේ වැඩකටයුතු මෙන්ම ව්‍යාපාරික සහ වෙනත් වාණිජ ගනුදෙනු කිරීම පහසු කිරීම උදෙසා පළාත් ප්‍රමාණය 16 සිට 05 දක්වා අඩු කිරීම
   (ඇ). සිවිල් සේවකයින්ගේ වැටුප් සැළකිය යුතු ප්‍රමාණයකින් අඩුකිරීම සහ ඔවුන්ගේ රාජකාරී වැඩකටයුතු අඩුකිරීම, එසේ කිරීම හේතුවෙන් වන හානිය වන්දි පූර්ණ කිරීම සඳහා සිවිල් සේවකයින්ට ඉඩම් ලබාදීම සහ එමගින් සිවිල් සේවකයින් වාණිජ කෘෂිකර්මයට පෙළඹවීම
   (ඈ). ඉංග්‍රීසි අධ්‍යාපනය ආරම්භ කිරීම හරහා ලාංකිකයින්ට සිවිල් සේවයට ඇතුල් වීමට දොර විවෘත කිරීම
3. ආර්ථික ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ යෝජනා
   (අ). රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම
   (ආ). වැඩවසම් ක්‍රමය හෙවත් රාජකාරී ක්‍රමය අහෝසි කිරීම
   (ඇ). ස්වදේශිකයින්ට සහ විදේශිකයින්ට ආයෝජන ඉඩ ප්‍රස්තා පුළුල් කිරීම පිණිස තැන්පතු බැංකුවක් ආරම්භ කිරීම
   (ඈ). මහාපරිමාණ වාණිජ වතුවගාවට පදනම දැමීම
   (ඉ). යුරෝපියන්ට කොළඹින් පිට ඉඩම් ගැනීමට පනවා තිබූ තහංචි ඉවත් කිරීම

4. අධිකරණ ක්‍රමය ප්‍රතිසංස්කරණ කිරීමේ යෝජනා

(අ) මුහුදුබඩ සහ උඩරට පළාත්වල පිහිටුවා තිබූ විවිධ අධිකරණ අහෝසි කිරීම සහ ලංකාව සඳහා ඒකීය අධිකරණ ක්‍රමයක් පිහිටුවීම.

(ආ) ආණ්ඩුකාරයාගේ පාලනයෙන් සිවිල් උසාවි නිදහස් කිරීම මගින් අධිකරණය විධායකයෙන් වෙන්කිරීම.

(ඇ) යුක්තිය පසිඳලීම සඳහා අග්‍රවිනිශ්චයකරු සහ කණිෂ්ඨ විනිශ්චයකරුවන් දෙදෙනෙකුගෙන් යුත් ශ්‍රේෂ්ඨාධිකරණයක් පිහිටුවීම සහ සියලුම අධිකරණ කාර්යයන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අධීක්ෂණය යටතේ ක්‍රියාවට නැංවීමට ප්‍රතිපාදන යෙදීම, යුරෝපීයන් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වෙනම ක්‍රියාත්මක කළ සිවිල් නඩු විනිශ්චය කිරීමේ ක්‍රියාපටිපාටිය අහෝසි කිරීම සහ සිවිල් සහ අපරාධ යන නඩු දෙවර්ගයම විනිශ්චය කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දීම.

(ඈ) සිවිල් සහ අපරාධ අධිකරණ බලය සහිතව සෑම දිස්ත්‍රික්කයකම ප්‍රධාන නගරය තුළ දිස්ත්‍රික් උසාවි පිහිටුවීම.

(ඉ) නඩු විනිශ්චය කිරීමේදී ලාංකික තක්සේරුකරුවන්ගේ සහාය ලබා ගැනීම.

- කෝල්බෘක් - කැමරන් ප්‍රතිසංස්කරණ යෝජනාවල පසුකාලීන ප්‍රතිඵල (යහපත්)

1. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පදනම් කරගත් ආණ්ඩුකරණය ලංකාව තුළ වර්ධනය වීමේ ප්‍රාථමික පදනම වැටීම.
2. නිදහස් ශ්‍රම වෙළඳපොලක් නිර්මාණය වීම.
3. මහාපරිමාණ වාණිජ වතු වගාව ආරම්භ වීම.
4. නිදහස් වෙළඳපොල ආර්ථිකයක් බිහිවීමට පදනම වැටීම.
5. පෞද්ගලික ව්‍යවසාය පන්තියක් බිහිවීමේ පදනම වැටීම.
6. ආයාත නිර්යාත ආර්ථික ක්‍රමයේ වර්ධනයට පදනම වැටීම.
7. බටහිර අධ්‍යාපන ක්‍රමය ආරම්භ වීමේ පදනම වැටීම.
8. සමාජ සජීවීකරණ ක්‍රියාදාමය ආරම්භ වීම හේතුවෙන් මිනිසුන්ගේ පෞද්ගලිකත්වය වර්ධනය වීම.
9. වැඩවසම්වාදය බිඳ වැටීම හේතුවෙන් ඒ හා බැඳී පැවති කුල ක්‍රමය අඩපන වීම.
10. නිදහස් හා ස්වාධීන සිවිල් සේවාවක් වර්ධනය වීම කෙරෙහි ආරම්භක පදනම වැටීම.
11. නිදහස් හා ස්වාධීන අධිකරණ සේවාවක් වර්ධනය වීම කෙරෙහි ආරම්භක පදනම වැටීම.
12. ඒකීය පාලන ක්‍රමයක් බිහිවීම හේතුවෙන් ප්‍රාදේශීය රදල නායකයින් භුක්ති විඳි අධිසමාජ බලය නැතිවී යාම.

- අයහපත් ප්‍රතිඵල

1. දේශීය කෘෂිකර්මය කඩා වැටීම.
2. පිරිවෙන් අධ්‍යාපනය බිඳ වැටීම.
3. වතුවගාවට ඉඩම් අයත් කර ගැනීම හේතුවෙන් ඇතිවන උඩරට ඉඩම් ප්‍රශ්නය.
4. වතු වගාව සඳහා ඉන්දියාවෙන් ආනයනය කළ ශ්‍රමය හේතුවෙන් ඇතිවන නොරටුන් පිළිබඳ ප්‍රශ්නය.
5. ඉංග්‍රිසි භාෂාව උගත් සහ නූගත් වශයෙන් සමාජය නව පංති දෙකකට බේදීයාම සහ ඉංග්‍රීසි උගත් පන්තිය සමාජය තුළ නව වරප්‍රසාදිත සමාජ පංතියක් ලෙස මුල්බැස ගැනීම.
6. වාර්ගික නියෝජනය හඳුන්වා දීම හේතුවෙන් ජනතාව වාර්ගික වශයෙන් බේදීයාම.

- නිගමනය

ඉහත දැක්වූ අඩුපාඩු තිබුනද සමස්තයක් ලෙස ගත්විට ලාංකික සමාජය ආඥාදායක හා අත්තනෝමතික රාජාණ්ඩු පාලන ක්‍රමයකින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකටත්, වැඩවසම්වාදී ආර්ථික ක්‍රමයකින් ධනවාදී ආර්ථික ක්‍රමයකටත් සහ පසුගාමී සමාජ ක්‍රමයකින් නවීකරණය වූ සමාජ ක්‍රමයකටත් පරිවර්තනය වීම සම්බන්ධයෙන් ආරම්භක පදනම ඇති වූයේ කෝල්බෘක් කැමරන් ප්‍රතිසංස්කරණ වලින් බව අවසාන වශයෙන් සඳහන් කළහැක.

5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



C කොටසේ ඉහළ ම තෝරා ගැනීම සහිත 5 ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 78%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 29%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 30%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 16%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ට වැඩියෙන් ලබා ගත් පිරිස 16%ක් වන අතර ලකුණු 6ට අඩුවෙන් ලබා ගත් පිරිස 25%කි. එමෙන් ම අපේක්ෂකයන්ගෙන් 59%කට 06 - 15 අතර ලකුණු ලබා ගැනීමට හැකි වී තිබේ. සෙසු ප්‍රශ්නවලට සාපේක්ෂ ව මෙම ප්‍රශ්නයට සතුටුදායක ලකුණක් ලබා ගැනීමට අපේක්ෂකයන්ට හැකියාව ලැබී ඇත.



මෙම ප්‍රශ්නයට 43%ක පහසුතාව දක්වා ඇත.

දේශපාලන විද්‍යාව II ප්‍රශ්න පත්‍රයේ C කොටසේ දැක්වෙන 5 ප්‍රශ්නයේ අරමුණ වූයේ කෝල්බෘක් - කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික හා සමාජයීය වශයෙන් නවීකරණය වීම කෙරෙහි කරන ලද බලපෑම පිළිබඳ ව විභාග අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීමයි.

කෝල්බෘක් - කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හා එමගින් ශ්‍රී ලංකාව අත් කරගත් ප්‍රතිඵල පිළිබඳ ව පෙර වර්ෂවල අවස්ථා කිහිපයක දී ම ඇගයීමට ලක් කර තිබූ බැවින් මෙම ප්‍රශ්නය විභාග අපේක්ෂකයන්ට ඉතා පහසු ප්‍රශ්නයක් විය යුතු ව තිබිණි. එසේ වුව ද මෙම ප්‍රශ්නය සඳහා පහසුතාව 43%ක් වූ අතර, අපේක්ෂකයන්ගෙන් 25%ක් ලබා ගත් ලකුණු ප්‍රමාණය 0 - 5 ප්‍රාන්තරයට අයත් ය. විභාග අපේක්ෂකයන්ගෙන් හරි අඩකටත් වඩා, එනම් 54%ක් ම, 10ට අඩුවෙන් ලකුණු ලබා ඇත. මෙයින් පැහැදිලි වන්නේ කෝල්බෘක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාවේ දේශපාලන, ආර්ථික හා සමාජයීය වශයෙන් සිදු වූ පරිවර්තන පිළිබඳ අපේක්ෂකයන් සතු අවබෝධය ප්‍රමාණවත් නොවන බව යි.

මෙම තත්ත්වය වළකා ගැනීම සඳහා මෙම ප්‍රතිසංස්කරණ පිළිබඳ පන්ති කාමරය තුළ විධිමත් විශ්ලේෂණයක් කිරීම, අදාළ පොත පත පරිශීලනය කරවීම, පසුගිය විභාගවල දේශපාලන විද්‍යාව විෂය පිළිබඳ ලකුණු දීමේ පටිපාටි පරිහරණයට සිසුන් උනන්දු කරවීම ආදී පියවර ගත හැකි වේ. එසේ ම වඩාත් වැදගත් වන්නේ තමන් සතු දැනුම ක්‍රමානුකූල ව සම්පිණ්ඩනය කර පරිපූර්ණ පිළිතුරක් නියමිත කාලසීමාව ඇතුළත ගොඩනැඟීමට සිසුන්ට අභ්‍යාස කරවීමයි.

6 ප්‍රශ්නය

6. "ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ නව යුගයක් ඩොනමෝර් ප්‍රතිසංස්කරණය මගින් සනිටුහන් කළේ ය" සාකච්ඡා කරන්න.

අභිමතාර්ථය: ශ්‍රී ලංකාවට ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පදනම් කරගත් ආණ්ඩු පාලන ක්‍රමය හඳුන්වා දුන්නේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයින් විසිනි. මෙහි ආරම්භක අවස්ථාව 1833 කෝලබෘක්-කැමරන් ප්‍රතිසංස්කරණ මගින් සනිටුහන් කළේය. අනතුරුව ඇතිකරන ලද 1911 සහ 1924 ප්‍රතිසංස්කරණ මගින් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය තවදුරටත් ශක්තිමත් කරනු ලැබීය. මෙම ක්‍රියාදාමයේ ඉතාම වැදගත් සන්ධිස්ථානයක් ලෙස 1931 ක්‍රියාවට නැංවූ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හඳුන්වා දියහැක. මෙම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් ප්‍රථම වරට ජනතාවට සර්වජන ඡන්ද බලය හිමිවිය. එමෙන්ම ලාංකිකයින්ට පුළුල් පදනමක් මත විධායක හා ව්‍යවස්ථාදායක කාර්යයන්ට සහභාගි වීමට ඉඩප්‍රස්ථාව ලැබෙන්නේද මෙම ප්‍රතිසංස්කරණ මගිනි. මෙම ප්‍රශ්නයේ අරමුණ වන්නේ ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ඉහත දැක්වූ ක්‍රියාදාමය පෝෂණය කිරීමට දැක්වූ දායකත්වය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමය.

පිළිතුරෙහි අඩංගු විය යුතු මූලික කරුණු

(1) ඩොනමෝර් යෝජනා (ලකුණු 06)
(2) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ වර්ධනයට වූ බලපෑම (ලකුණු 12)
(3) නිගමනය (ලකුණු 02)

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය ලංකාව තුළ මුල්බැස ගැනීම කෙරෙහි බලපෑ යටත් විජිත ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා අතුරෙන් ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයට හිමිවන්නේ අතිවිශේෂ ස්ථානයක් බව නිසැකවම කිවහැක.

- මෙම තත්ත්වය තේරුම් ගැනීමට නම් ප්‍රථමයෙන්ම උක්ත මාතෘකාව කෙරෙහි බලපෑ ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනා මොනවාද යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතුය. එම යෝජනා පහත දැක්වේ.
  1. සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම
  2. වාර්ගික නියෝජනය අහෝසි කිරීම
  3. ප්‍රාදේශීය නියෝජනය පුළුල් කිරීම
  4. 7/10 ක විධායක බලතල පවරා දීම
  5. විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දීම
  6. අමාත්‍ය මණ්ඩලය හඳුන්වා දීම
  7. රාජ්‍ය මන්ත්‍රණ සභාව හඳුන්වා දීම

- ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය යනුවෙන් අදහස් කරන්නේ ජනතාව විසින් ජනතාවගේ යහපත අරමුණු කොටගෙන ක්‍රියාවට නංවන ආණ්ඩුක්‍රමයක් වේ නම් එවැනි ආණ්ඩුක්‍රමයකට බොහෝ සෙයින් ආසන්න ආණ්ඩුක්‍රමයක් ලංකාව තුළ ආරම්භ වීම කෙරෙහි ඉහත දක්වන ලද යෝජනා බෙහෙවින්ම බලපෑ බව නිසැකව ම ප්‍රකාශ කළහැක.

- මෙම යෝජනා මගින් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය වර්ධනය වීමට දායක වූ ආකාරය පහත සඳහන් පරිදි වේ.

(අ) මැතිවරණ ක්‍රියාදාමය හරහා පාලකයින් පත්කර ගැනීමට හා වෙනස් කිරීමට ජනතාව හුරු පුරුදු වීම.

(ආ) දේශපාලනඥයින් ජනතාවට වගකීම පිළිබඳව හුරු පුරුදු වීම

(ඇ) ජනතාවගේ දේශපාලන සහභාගිත්වය වර්ධනය වීම

(ඈ) ජනතාවගේ දේශපාලන සමාජානුයෝජනය වීමේ ක්‍රියාදාමය වේගවත් වීම සහ එම හේතුවෙන් ජනතාව දේශපාලන වශයෙන් සවිබලමත් වීම, වර්ධනය වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ජනතාවට දේශපාලනඥයින්ට බලපෑම් කළහැකි ප්‍රමාණය ඉහළ යාම.

(ඉ) ආණ්ඩුකරණය සම්බන්ධයෙන් කෙරෙන වගකීම පිළිබඳව දේශපාලනඥයින් හුරු පුරුදු වීම.

(ඊ) විධායක හා ව්‍යවස්ථාදායක කාර්යයන් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් ලාංකික දේශපාලනඥයින් පුරුදු පුහුණු වීම.

(උ) කැබිනට් ආණ්ඩුක්‍රමයකට දේශපාලනඥයින් හුරු පුරුදු වීම

(ඌ) දේශපාලන පක්ෂ ආරම්භ වීමේ පදනම වැටීම

(ඔ) වාර්ගික මානසිකත්වය සමනය වීම කෙරෙහි බලපෑම

- ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ වර්ධනය කෙරෙහි ඩොනමෝර් යෝජනා වලින් ඇති වූ අහිතකර ප්‍රතිඵල කිහිපයක්ද හඳුනා ගතහැක. මෙයින් එකක් වන්නේ විධායක හා ව්‍යවස්ථාදායක කාර්යයන් පිළිබඳව පූර්ණබලයක් ලාංකිකයින්ට පවරා නොදීමය. දෙවන දුර්වලතාව වූයේ සමහර අවස්ථාවන්හිදී ආණ්ඩුකාරයා හා රාජ්‍ය නිලධාරීන් තිදෙනාගේ අනවශ්‍ය මැදිහත් වීම හේතුවෙන් සමහර ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණ සම්ප්‍රදායන් වර්ධනය වීම අඩපණ වීමය. තුන්වැන්න වූයේ සාමූහික වගකීමේ ආණ්ඩුකරණයට ලාංකික දේශපාලනඥයින් හුරු පුරුදු වීම අඩපණ වීමය.

නිගමනය : **ඉහත සඳහන් අඩුපාඩු තිබුණද මෙරට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය වර්ධනය වීම හා මුල්බැස ගැනීම සම්බන්ධයෙන් ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් සිදුවූ දායකත්වය විශිෂ්ට වන බව අවසාන වශයෙන් කිවහැක.**

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



අපේක්ෂකයන්ගෙන් 58%ක් මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 30%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ට වැඩියෙන් ලබා ගත් පිරිස 11%ක් වන අතර ලකුණු 6ට අඩුවෙන් ලබා ගත් පිරිස 33%කි. එමෙන් ම අපේක්ෂකයන්ගෙන් 56%ක් 06 - 15 දක්වා ලකුණු ලබා ගෙන ඇත.



මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 42%කි.

මෙම ප්‍රශ්නයේ අරමුණ වූයේ ඩොනමෝර් යෝජනා මොනවා ද? සහ එම යෝජනා ක්‍රියාත්මක වීමෙන් මෙරට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට නැඹුරු වූ ආකාරය පිළිබඳ අපේක්ෂකයන් තුළ පවතින දැනුම පරීක්ෂා කිරීම පමණක් ම නොවේ. ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනයට ඩොනමෝර් යෝජනා කළ දායකත්වය පිළිබඳ විචාරාත්මක ඇගයීමක් ඉදිරිපත් කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම ද මෙහි අරමුණකි. ප්‍රශ්නයේ පහසුතාව 42%කි.

බොහෝ අපේක්ෂකයන් ඩොනමෝර් යෝජනා පැහැදිලි කර තිබුණ ද එම යෝජනා ක්‍රියාත්මක වීමෙන් මෙරට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට සිදු වූ බලපෑම පිළිබඳ ව පැහැදිලි කර නො තිබුණි.

සෑම වසරක ම ඇගයීම සඳහා ඉදිරිපත් කරන මාතෘකාවක් වුව ද ඉහළ ලකුණු ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් දැනුමක් සිසුන් වෙත නොතිබූ බව ඉන් පැහැදිලි වේ.

පන්ති කාමරය තුළ ඩොනමෝර් යෝජනා හා ඒවා ක්‍රියාත්මක වීමෙන් මෙරට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ වර්ධනයට ඇති වූ බලපෑම උදාහරණ සහිත ව සාකච්ඡා කිරීමෙන් මේ පිළිබඳ ව විභාග අපේක්ෂකයන්ගේ දැනුම වර්ධනය කළ හැකි ය. අපේක්ෂකයන්ගේ **'විචාරාත්මක කුසලතාව'** පරීක්ෂා කරන ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම පිළිබඳ සිසුන්ට විශේෂ පුහුණුවක් ලබා දීම ද කළ යුතු වේ.

ප්‍රශ්නය දුටු සැනින් පිළිතුර ලෙස තමා පාඩම් කරන ලද සියලු කරුණු ලියනු වෙනුවට ප්‍රශ්නය සම්පූර්ණයෙන් කියවා අවබෝධ කරගෙන පිළිතුර ගොඩනැගිය යුතු ආකාරය පිළිබඳ සැලසුම් කර අදාළ ගැළපීම් ද සිදු කර පිළිතුරු සැපයීමට සිසුන් පුහුණු කිරීමෙන් ඉහළ ලකුණු ලබා ගැනීමට හැකිවනු ඇත. එසේ ම මෙම මාතෘකාවට අදාළ අමතර කියවීම් පොත්පත් අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව තහවුරු වන බැවින් ඒ සඳහා සිසුන් ව යොමු කිරීමට ගුරුවරුන් වගබලා ගත යුතුය.

7 ප්‍රශ්නය

7. පහත දැක්වෙන ඒවායින් **ඕනෑම දෙකක්** පිළිබඳ ව සාකච්ඡා කරන්න.

(i) සෝල්බරි ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය
(ii) 1972 ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකය
(iii) සෝබරි ව්‍යවස්ථාව හා 1972 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය

(i). සෝල්බරි ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය

අභිමථාර්තය : කැබිනට් ආණ්ඩුක්‍රමයක එක් මූලික ලක්ෂණයක් වන්නේ දේශපාලන විධායකය නාමික හා සත්‍ය වශයෙන් කොටස් දෙකකින් යුක්ත වීමය. මේ අනුව 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ දේශපාලන විධායකයද නාමික විධායකය හා සත්‍ය විධායකය යන කොටස් දෙකෙන් සමන්විත වූ අතර නාමික විධායකය හැඳින්වූයේ අග්‍රාණ්ඩුකාරවරයා යන නිල නාමයෙනි. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ එම නාමික විධායකය පත්කළ ආකාරය, තනතුරෙන් ඉවත් කරන ආකාරය, තනතුරට හිමිව තිබූ බලතල, කාර්යයන් සහ තත්ත්වය පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීමය.

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු මූලික කරුණු

(1) පත් කරන සහ ඉවත් කරන ආකාර (ලකුණු 02)
(2) බලතල, කාර්යයන් හා තත්ත්වය (ලකුණු 05)
(3) අග්‍රාණ්ඩුකාර ධුරය පිළිබඳ ලංකාවේ අත්දැකීම් (ලකුණු 01)
(4) නිගමනය (ලකුණු 02)

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- කැබිනට් ආණ්ඩුක්‍රමයේ එක් ප්‍රධාන ලක්ෂණයක් වන්නේ දේශපාලන විධායකය නාමික සහ සත්‍ය යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වීමය. 1947 දී බ්‍රිතාන්‍ය යටත් විජිත පාලකයින් විසින් ශ්‍රී ලංකාවට කැබිනට් ආණ්ඩුක්‍රමය හඳුන්වා දුන් අතර එම ආණ්ඩුක්‍රමයේ නාමික විධායකය හිමිවූයේ බ්‍රිතාන්‍ය කිරීටයටය. හේතුව වූයේ ශ්‍රී ලංකාවට හිමිවූයේ ඩොමීනියන් තත්ත්වයේ නිදහසක් පමණක් වීමත් ඒ අනුව බ්‍රිතාන්‍ය කිරීටය ලංකා ආණ්ඩුක්‍රමයේ නිල නායකත්වය ඒ වනතුරුත් දැරීමත්ය.

- එසේ වූවද කිරීටය දරන පුද්ගලයා ලංකාවේ වාසය නොකළ බැවිනුත්, ලංකාව හා බ්‍රිතාන්‍ය අතර පවතින දුරස්තභාවය නිසාත් ලංකාණ්ඩුක්‍රමය තුළ බ්‍රිතාන්‍ය කිරීටය නියෝජනය කිරීම සඳහා නියෝජිතයෙකු පත් කරන අතර සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළ නාමික විධායකය ලෙස හැඳින්වූයේ මෙම නියෝජිතයාය. ඔහු අග්‍රාණ්ඩුකාරවරයා යන නිල නාමයෙන් හැඳින්විය.
- නාමික විධායකය සම්බන්ධයෙන් අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන සහ ක්‍රියාත්මක වූ සම්ප්‍රදායන් පහත සඳහන් පරිදි විය.
  (අ). ලංකාවේ අගමැතිවරයාගේ උපදෙස් පරිදි බ්‍රිතාන්‍ය කිරීටය විසින් පත් කිරීම.
  (ආ). ධුර කාලය ව්‍යවස්ථාවේ සඳහන් වූයේ නැත. එසේ වුවද වසර පහෙන් පහට අලුතින් පත් කිරීමේ සම්ප්‍රදාය අනුගමනය කරන ලදි.
  (ඇ). එකම පුද්ගලයා තනතුරට පත්කිරීමේ වාර ගණන පිළිබඳව සීමාවක් නොවීය.
  (ඈ). ලංකාවේ අගමැතිවරයාගේ උපදෙස් මත බ්‍රිතාන්‍ය කිරීටය විසින් තනතුරෙන් ඉවත් කළ හැකි විය.
- ඉහත දැක්වූ කරුණු වලින් පෙනී යන්නේ නාමික විධායකය පත් කිරීම, ධුරයේ රැඳී සිටිය හැකි නිල කාලය තීරණය වීම සහ ධුරයෙන් ඉවත් කිරීම යනාදී සියල්ල තීරණය වූයේ ලංකාවේ අගමැතිවරයාගේ අභිමතය අනුව බවයි.

බලතල, කාර්යයන් හා තත්ත්වය

- අග්‍රාණ්ඩුකාරවරයාගේ බලතල හා කාර්යයන් සෝල්බරි ව්‍යවස්ථාවේ සඳහන් කර තිබුණි. ඒ අනුව අග්‍රාණ්ඩුකාරවරයා රාජ්‍යයේ නායකයා, විධායකයේ ප්‍රධානියා සහ සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා විය. මෙයට අමතරව තම කාර්යයන් ඉටු කිරීමේදී අග්‍රාණ්ඩුකාරවරයා බ්‍රිතාන්‍ය සම්ප්‍රදායන් අනුගමනය කළයුතු විය. අග්‍රාණ්ඩුකාරවරයා සතු වූ බලතල හා කාර්යයන් ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ සහ චාරිත්‍රානුකූල යන අංශ හතර යටතේ පහත සඳහන් ආකාරයට දැක්විය හැක.
- ව්‍යවස්ථාදායක බලතල හා කාර්යයන්
  (අ). අගමැතිගේ උපදෙස් මත පාර්ලිමේන්තුව කැඳවීම, කල්තැබීම සහ විසුරුවා හැරීම
  (ආ). පාර්ලිමේන්තුවේ සැසිවාර ආරම්භයේදී රාජාසන කථාව පැවැත්වීම
  (ඇ). මංගල සභා අවස්ථාවන්හිදී පාර්ලිමේන්තුවේ මුලසුන දැරීම
  (ඈ). පාර්ලිමේන්තු පනත්වලට අවසාන අනුමැතිය දීම
  (ඉ). සෙනෙට් සභාව සඳහා නාමකරණයෙන් පත්කළ යුතු සාමාජිකයින් 15 දෙනා පත්කිරීම
  (ඊ). සුළුජන කොටස් වෙනුවෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට නියෝජිතයින් 06 දෙනෙක් නාමකරණයෙන් පත්කිරීම
  (උ). නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට සහ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට ලේකම්වරුන් පත් කිරීම
- විධායක බලතල හා කාර්යයන්
  (අ). අගමැතිවරයා පත්කිරීම. අගමැතිවරයාගේ උපදෙස් මත කැබිනට් මණ්ඩලයේ සෙසු සාමාජිකයින් හා නියෝජ්‍ය ඇමතිවරුන් පත්කිරීම
  (ආ). අමාත්‍යවරුන්ට හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ට අමාත්‍යාංශ, කාර්යයන් සහ වගකීම් පැවරීම
  (ඇ). ත්‍රිවිධ හමුදාපතිවරුන් සහ පොලිස්පති පත්කිරීම
  (ඈ). අමාත්‍යාංශවල ස්ථිර ලේකම්වරු, උසස් රාජ්‍ය නිළධාරීන් සහ කැබිනට් මණ්ඩලයේ ලේකම්වරයා පත්කිරීම
  (ඉ). විදේශ තානාපතිවරුන්, මහකොමසාරිස්වරුන් සහ වෙනත් රාජ්‍ය උපාය නිලධාරීන් පත්කිරීම සහ ඉවත් කිරීම සහ එවැනි විදේශ තානාපතිවරුන්, මහකොමසාරිස්වරුන් සහ වෙනත් රාජ්‍ය උපාය නිළධාරීන් පිළිගැනීම
  (ඊ). රාජ්‍ය මුද්‍රාව පරිහරණය කිරීම
- අධිකරණය හා සම්බන්ධ බලතල හා කාර්යයන්
  (අ). අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ සෙසු විනිශ්චයකරුවන් සහ අපරාධ විනිශ්චය කොමසාරිස්වරුන් පත්කිරීම සහ ඉවත් කිරීම
  (ආ). අධිකරණ සේවා කොමිසමේ සභාපතිවරයා හැර සෙසු සාමාජිකයින් පත්කිරීම
  (ඇ). වරදකරුවන්ට සමාව දීම

- චාරිත්‍රානුකූල කාර්යයන්
  ජාතික උත්සවවලදී මුලසුන ගැනීම, නම්බුනාම ප්‍රදානය කිරීම, ජාතික මට්ටමේ විවෘත කිරීම් වලට සහභාගි වීම යනාදිය.
- අග්‍රාණ්ඩුකාර ධුරය පිළිබඳ ලංකාවේ අත්දැකීම්
  1948 - 1972 කාලය තුළ පුද්ගලයින් සිව් දෙනෙකු අග්‍රාණ්ඩුකාර ධුරය දැරුවේය. කැබිනට් ආණ්ඩුක්‍රමයක නාමික විධායකය අපක්ෂපාතීව කටයුතු කළ යුතු බව අපේක්ෂා කළත් ලංකාවේ එය එසේ සිදුවූයේ නැත. අග්‍රාණ්ඩුකාර ධුරය දැරූ දෙවැන්නා වන සෝල්බරි සාමිවරයා 1951 වර්ෂයේදී අගමැතිවරයා පත් කිරීමේදීත්, තුන්වන අග්‍රාණ්ඩුකාරවරයා වන ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක 1958 හදිසි අවස්ථා තත්ත්වයේදීත්, 1960 මාර්තු මැතිවරණයෙන් පසුව ආණ්ඩුව පත්කිරීම පිළිබඳවත් සහ 1962 හමුදා කුමන්ත්‍රණය යන අවස්ථාවලදීත් ක්‍රියාකළ ආකාරය දේශපාලන මතභේද වලට ලක්විය.
- එසේවූවද අනෙකුත් අවස්ථාවලදී අග්‍රාණ්ඩුකාරවරු ධුරයෙන් අපේක්ෂා කළ පරිදි අපක්ෂපාතීව තම රාජකාරි කටයුතු ඉටුකරන ලදි. විශේෂයෙන්ම 1964-1972 කාලය තුළ එම ධුරය දැරූ විලියම් ගොපල්ලව නාමික විධායක තනතුරින් අපේක්ෂා කළ මධ්‍යස්ථභාවය ආරක්ෂා කරමින් ක්‍රියා කළේය.

නිගමනය : කැබිනට් ආණ්ඩුක්‍රමයක නාමික විධායකය ගෞරවාන්විත ධුරයක් වුවද ලංකාවේ සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ නාමික විධායක ධුරය වූ අග්‍රාණ්ඩුකාරවරයා පත්කල ආකාරය, ඉවත් කිරීමේ ක්‍රමවේදය සහ ධුරයට පවරන ලද බලතල හා කාර්යයන් අනුව නාමික විධායකය සැළකිය හැක්කේ ජාතික නායකයෙකු ලෙස නොව විදේශ රාජ්‍යයක නියෝජිතයෙකු ලෙසය.

(ii) 1972 ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකය

අභිමතාර්ථය: කැබිනට් හෙවත් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක සත්‍ය විධායකය ලෙස හඳුන්වන්නේ අගමැති ප්‍රධාන අමාත්‍ය මණ්ඩලයයි. කැබිනට් ආණ්ඩුක්‍රමයක විධායක බලතල සත්‍ය වශයෙන් භුක්ති විඳින්නේ සහ ක්‍රියාවට නංවන්නේ සත්‍ය විධායකය විසිනි. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කළේ කැබිනට් ආණ්ඩුක්‍රමයක්ය. එහි සත්‍ය විධායකය වූයේ අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයයි. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටවූ සත්‍ය විධායකයේ ස්වරූපය, එය තේරී පත් වූ ආකාරය සහ එය සතු වූ බලතල යනාදී කරුණු සම්බන්ධයෙන් අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමය.

පිළිතුරෙහි අඩංගු විය යුතු මූලික කරුණු

(1) සත්‍ය විධායකය තේරීපත්වූ ආකාරය	**(ලකුණු 02)**
(2) බලතල හා කාර්යයන්	**(ලකුණු 04)**
(3) ව්‍යවස්ථාදායකයට වගකීමේ අවශ්‍යතාවය	**(ලකුණු 01)**
(4) නිල කාලය අවසන් වීම/ඉවත් කිරීම	**(ලකුණු 02)**
(5) නිගමනය	**(ලකුණු 01)**

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සත්‍ය විධායකය අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය වූ අතර එය දේශපාලන විධායකය ලෙසද හැඳින්වින. එසේ හැඳින්වීමට හේතුව වන්නේ දේශපාලන පසුබිමක් මත අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය තේරීපත් වීමය.
- 1972 ව්‍යවස්ථාවට අනුව අගමැති ප්‍රධාන කැබිනට් මණඩලය ව්‍යවස්ථාදායකය වූ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරුන් අතුරෙන් තෝරා පත් කරගත යුතු විය. 1972 ව්‍යවස්ථාවේ අගමැතිවරයා තෝරාපත් කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් වූ අතර ඒ අනුව ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයින්ගේ උපරිම විශ්වාසය දිනා ගන්නා මන්ත්‍රීවරයා අගමැති තනතුරට නාමික විධායකය වූ ජනාධිපතිවරයා විසින් තෝරා පත් කළ යුතු විය.

- කැබිනට් මණ්ඩලයේ සෙසු සාමාජිකයින් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් අගමැතිවරයාගේ නිර්දේශය මත නාමික විධායකය විසින් ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයින් අතුරෙන් පත් කළ යුතු විය. මේ අනුව 1972 ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකය සම්බන්ධයෙන් දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වූයේ එය ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයින්ගෙන් පමණක් සංයුක්ත වීමය.

- නිල කාලය අවසන් වීමට ප්‍රථමයෙන් සත්‍ය විධායකය බලයෙන් පහකිරීමේ විධික්‍රම දෙකක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් විය. එම විධික්‍රම දෙක වූයේ,
  1. අගමැතිවරයාගේ ඉල්ලීම පරිදි නාමික විධායකය විසින් කැබිනට් මණ්ඩලයේ සමාජිකයින් තනි තනිව තනතුරු වලින් ඉවත් කිරීම හෝ අගමැතිවරයාගේ ඉල්ලීම පරිදි නාමික විධායකය විසින් ජාතික රාජ්‍ය සභාව විසුරුවා හැරීම මගින් සමස්ත කැබිනට් මණ්ඩලයම තනතුරුවලින් ඉවත් කිරීමට අගමැතිවරයාට තිබූ බලය.
  2. ජාතික රාජ්‍ය සභාව විසින් මේ යටතේ වාර්ෂික අයවැය ලේඛනයට අනුමැතිය නොදීමෙන්, ජාතික රාජ්‍ය සභාවේ පළමු සැසිවාරයේදී ඉදිරිපත් කරන රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුමැතිය නොදීමෙන් සහ සත්‍ය විධායකයට එරෙහිව විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීම මගින් සත්‍ය විධායකය නිලයෙන් ඉවත් කිරීමේ බලය ජාතික රාජ්‍ය සභාව සතු විය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනරජයේ පාලනය හා මෙහෙයවීම පිළිබඳ වගකීම පැවරී තිබුණේ සත්‍ය විධායකයටය. මේ සම්බන්ධයෙන් සත්‍ය විධායකය ජාතික රාජ්‍ය සභාවට සාමූහිකව වගකීමට හා උත්තර දීමට බැඳී සිටියේය. මෙම බැඳීම මගින් තවත් එක් කරුණක් ගම්‍ය විය. එනම් සත්‍ය විධායකයට ධුරයේ රැඳී සිටීමට හැකිවූයේ ජාතික රාජ්‍ය සභාවේ උපරිම විශ්වාසය තිබෙනතාක් කල් පමණක් ය යන්නය.

- 1972 ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකයේ නායකයා වන අගමැතිවරයාට සුවිශේෂී තත්ත්වයක් හිමිකර දී තිබුණ ආකාරය දැකිය හැක. මේ අනුව අගමැතිවරයා ක්‍රියාකාරී විධායකය ලෙස කටයුතු කළේය. ඔහු කැබිනට් මණ්ඩලයේ මෙන් ම ආණ්ඩුවේද නායකයා විය. එබැවින් රට අභ්‍යන්තර වශයෙන් මෙන් ම බාහිර වශයෙන්ද කුමන දිශාවකට ගමන් කළ යුතු ද යන්න තීරණය කළේ අගමැතිවරයා විසිනි. යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම, ජාතික රාජ්‍ය සභාව කැඳවීම, කල්තැබීම සහ විසුරුවා හැරීම, සත්‍ය විධායකයේ සෙසු අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් පත්කිරීම, ව්‍යවස්ථා අධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත්කිරීම, විදේශ දූතයින් පිළිගැනීම, තානාපතිවරුන්, මහකොමසාරිස්වරුන් හා වෙනත් රාජ්‍ය උපාය නිලධාරීන් පත්කිරීම, වරදකරුවන්ට සමාව දීම යනාදී බලතල නාමික විධායකය විසින් ක්‍රියාවට නංවන බව බාහිර වශයෙන් පෙනී ගියද සත්‍ය වශයෙන්ම ඒ සෑම බලයක්ම ක්‍රියාවට නැංවූයේ අගමැතිවරයා විසිනි.
- 1972 ව්‍යවස්ථාවට අනුව සත්‍ය විධායකය තේරී පත්වූයේ ව්‍යවස්ථාදායකය තුළිනි. එම හේතුවෙන් සත්‍ය විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටියේය. වගකීම කඩකරන විට විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීම මගින් සත්‍ය විධායකය නිලයෙන් ඉවත් කිරීමේ බලය ව්‍යවස්ථාදායකය සතුවිය. අනෙක් අතට ව්‍යවස්ථාදායකය තමන් කැමති ඕනෑම අවස්ථාවක විසුරුවා හැරීමේ බලය සත්‍ය විධායකයේ නායකයා වන අගමැතිවරයා සතුවිය. මෙම කිට්ටු සම්බන්ධතාව මගින් පෙන්නුම් කළේ විධායකය සහ ව්‍යවස්ථාදායකය අනෝන්‍ය වශයෙන් එකක් මත රඳා පවතින බව සහ එකක සහයෝගය නොමැතිව අනෙකට පැවැත්මක් නොමැති බවය.

- 1972 ව්‍යවස්ථාව යටතේ ස්ථිර විධායකය සම්බන්ධයෙන් ද සැළකිය යුතු බලයක් සත්‍ය විධායකයට හිමිව තිබුණි. ස්ථිර විධායකයේ සේවකයින් පත්කිරීම, මාරු කිරීම, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම යන කරුණු සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ බලය හා වගකීම හිමිව තිබුණේ සත්‍ය විධායකයටය.

නිගමනය : ඉහත දැක්වූ කරුණු වලින් පෙනී යන්නේ 1972 ව්‍යවස්ථාව යටතේ සංස්ථාපනය කළ දේශපාලන සංස්ථා අතුරින් සත්‍ය විධායකයට සුවිශේෂී තත්ත්වයක් හිමිවන බවය. සත්‍ය වශයෙන්ම ආණ්ඩුක්‍රමයේ කප්පිත්තා වූයේ සත්‍ය විධායකයයි. ආණ්ඩුක්‍රමය පාලනය කිරීම හා මෙහෙයවීම කරනු ලැබූයේ සත්‍ය විධායකය විසිනි. එමෙන්ම ආණ්ඩුක්‍රමයේ අනෙක් වැදගත් දේශපාලන සංස්ථා දෙක වූ නාමික විධායකය සහ ජාතික රාජ්‍ය සභාව ක්‍රියාත්මක වූයේ සත්‍ය විධායකයේ අණසකට යටත්වය. එපමණක් නොව ස්ථීර විධායකය ක්‍රියාත්මක වූයේ සත්‍ය විධායකයේ අණසකට යටත්වය. මෙයින් පෙනී යන්නේ 1972 ව්‍යවස්ථාව යටතේ ගොඩනැගූ ආණ්ඩුක්‍රමය තුළ සත්‍ය විධායකය කොතරම් බලසම්පන්න ආයතනයක් වූවාද යන්නයි.

(iii) සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය

අභිමතාර්ථය: ආණ්ඩුක්‍රමයක නීති පනවන ආයතනය ව්‍යවස්ථාදායකය ලෙස හඳුන්වනු ලැබේ. නමුත් නීති පැනවීමට අමතරව තවත් කාර්යයන් කිහිපයක්ම නූතනයේ ව්‍යවස්ථාදායක සභා විසින් කරනු ලැබේ. මෙම කරනු ලබන කාර්යයන්හි ස්වභාවය තීරණය වන්නේ ව්‍යවස්ථාදායක සභාවලට පවරා ඇති බලතල අනුවය. ව්‍යවස්ථාදායක සභා ප්‍රමාණයෙන් විශාල ආයතන වන අතර සාමාන්‍යයෙන් සමන්විත වන්නේ ජනතාවගේ ඡන්දයෙන් තෝරා පත් කරන ගිහි නියෝජිතයන්ගෙනි. මෙයින් පෙනී යන්නේ ව්‍යවස්ථාදායක සභාවන්හි ක්‍රියාකාරිත්වය කෙරෙහි ඒවායේ සංයුතිය සහ පවරා ඇති බලතල තීරණාත්මක ලෙස බලපාන බවය. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායක සභාවල තත්ත්වය ඉහත සඳහන් කළ මූලික කරුණු පදනම් කරගෙන තුලනාත්මකව විශ්ලේෂණය කිරීමේ අපේක්ෂකයින්ගේ හැකියාව මැන බැලීමය.

පිළිතුරෙහි අන්තර්ගත වියයුතු මූලික කරුණු

(1) සංවිධාන ව්‍යුහය හා සංයුතිය (ලකුණු 02)
(2) නිලකාලය හා විසුරුවා හැරීම (ලකුණු 02)
(3) බලතල හා කාර්යයන් (ලකුණු 04)
(4) නිගමනය (ලකුණු 02)

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- 1948 සෝල්බරි ව්‍යවස්ථාව සහ 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යන ව්‍යවස්ථා දෙක යටතේම ක්‍රියාත්මක වූයේ කැබිනට් මාදිලියේ ආණ්ඩුක්‍රමයක්ය. එසේවූවද එම ව්‍යවස්ථා දෙක යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායක සභා දෙක සංයුතිය, සංවිධාන ව්‍යුහය සහ බලතල හා කාර්යයන් අනුව එකිනෙකින් බෙහෙවින් වෙනස් විය.
- 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායකය හැඳින්වුයේ පාර්ලිමේන්තුව යන නාමයෙනි. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායකය ජාතික රාජ්‍ය සභාව නමින් හැඳින්විය. 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටවූ පාර්ලිමේන්තුව ද්විමාණ්ඩලික ආයතනයක් විය. එම මණ්ඩල දෙක හැඳින්වූයේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සහ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය වශයෙනි. සාමාන්‍ය ව්‍යවහාරයේදී පහළ මණ්ඩලය සහ ඉහළ මණ්ඩලය යනුවෙන්ද මෙම ආයතන දෙක හඳුන්වන ලදි. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළේ ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයක්ය. මීට ඉහතින්ද සඳහන් කළ පරිදි එය ජාතික රාජ්‍ය සභාව නමින් හැඳින්විය.
- 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පිහිටවූ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සමන්විත වූයේ දෙවර්ග යක මන්ත්‍රීවරුන්ගෙනි. මෙයින් එක් වර්ගයක් වූයේ සරල බහුතර නියෝජන ක්‍රමය අනුව ජනතාවගේ ඡන්දයෙන් තෝරා පත් කරගත් නියෝජිතයින්ය. මෙම මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව සීමා නීර්ණය කිරීමේ කොමිෂන් සභාව විසින් ඡන්ද කොට්ඨාස බෙදන ආකාරය අනුව තීරණය විය. සෑම අවුරුදු 10 ට වරක්ම ගනු ලබන ජනසංගණනය අනුව මෙම බෙදීම කරනු ලැබීය. මේ අනුව සෑම ජනසංගණනයකින් පසුව ම නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ජනතා ඡන්දයෙන් තෝරන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව වෙනස් විය. අනෙක් මන්ත්‍රී වර්ගය වූයේ අග්‍රාණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන් පත්කළ මන්ත්‍රීවරුන්ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව නාමකරණයෙන් පත්කළ යුතු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව 06 ක් විය.

- සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ව්‍යවස්ථාදායකයේ දෙවන මණ්ඩලය වූ සෙනෙට් සභාව සමන්විත වූයේ මන්ත්‍රීවරුන්30දෙනෙකුගෙන්ය. මෙයින් 15දෙනෙකු අගමැතිවරයාගේ උපදෙස්මත අග්‍රාණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන් පත්කළ අතර ඉතිරි 15 දෙනා පාර්ලිමේන්තුව නියෝජනය කළ දේශපාලන පක්ෂ විසින් මාරු කළහැකි තනි ඡන්ද ක්‍රමය අනුව තෝරා පත් කරනු ලැබීය. සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර මුළු සාමාජිකයින්ගෙන් 1/3 ක් සෑම වසර දෙකකට වරක්ම අලුතින් තෝරා පත් කරන ලදි.
- 1972 ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ජාතික රාජ්‍ය සභාව සමන්විත වූයේ ජනතාවගේ ඡන්දයෙන් තෝරා පත් කරගත් නියෝජිතයින්ගෙන් පමණි. නියෝජිතයින් තෝරා පත් කළේ ප්‍රාදේශීය ඡන්ද කොට්ඨාශ පදනම් කරගෙන සරල බහුතර නියෝජන ක්‍රමය යටතේය. ව්‍යවස්ථාවට අනුව වසර 10 ට වරක් පවත්වන ජනසංගණනය පදනම් කරගෙන මන්ත්‍රී ආසන සංඛ්‍යාව යළි බෙදා හැරිය යුතු විය. අවසාන සංගණනය අනුව 1977 දී මන්ත්‍රී ධුර සංඛ්‍යාව 168 ක් විය.
- සෝල්බරි ව්‍යවස්ථාදායකයේ නිල කාලය වසර 5 ක් වූ අතර සහ 1972 ව්‍යවස්ථාදායකයේ නිල කාලය වසර 6 ක් විය. ව්‍යවස්ථාදායක සභා අඩුම වශයෙන් අවුරුද්දකට වරක්වත් රැස්විය යුතු විය. ව්‍යවස්ථා නියමයන්ට අනුව ව්‍යවස්ථාදායක සභා නියමිත නිල කාලයට පෙර විසුරුවා හැරීමට හැකි වූ අතර ඒ සඳහා අවශ්‍ය වූයේ අගමැතිවරයා විසින් එසේ කරන ලෙස නාමික විධායකයෙන් ඉල්ලා සිටීම පමණි.
- පැවරී තිබුන බලතල අනුව බලන විට ව්‍යවස්ථාදායක දෙක එකිනෙකින් බෙහෙවින්ම වෙනස් විය. ව්‍යවස්ථාදායක බලය යනුවෙන් අදහස් කරන්නේ නීති සම්පාදනයට ඇති බලයයි. සෝල්බරි ව්‍යවස්ථාවේ 29(1) වගන්තිය අනුව දිවයිනේ සාමය, ආරක්ෂාව සහ යහපාලනය සඳහා නීති පැනවීමට පාර්ලිමේන්තුවට බලය තිබුනි. මෙසේ සඳහන් වුවත් පාර්ලිමේන්තුවේ නිතී සම්පාදන බලය කෙරෙහි සීමා පැනවෙන විධිවිධාන තුනක් සෝල්බරි ව්‍යවස්ථාවේ අඩංගු විය. ඒවා නම්

(1). 29(2) වගන්තියේ 'අ'- (ඇ) අනු වගන්ති

(අ). යම් ආගමක් නිදහසේ ඇදහීම තහනම් කරන හෝ සීමාකරන නීතියක් හෝ;

(ආ). යම් ප්‍රජාවකට හෝ ආගමකට අයත් පුද්ගලයින්ට වෙනත් ප්‍රජාවකට හෝ ආගමකට අයත් පුද්ගලයින්ට බල නොපාන සීමාවන්ට යටත් කරනු ලබන නීතියක් හෝ;

(ඇ). යම් ප්‍රජාවකට හෝ ආගමකට අයත් පුද්ගලයින්ට ලබා දී නැති වරප්‍රසාදයක් හෝ වාසියක් වෙනත් ප්‍රජාවකට හෝ අයත් පුද්ගලයින්ට ලබාදෙන නීතියක් හෝ;

(ඈ). යම් ආගමික ආයතනයක පාලක මණ්ඩලයේ අනුමැතිය නැතිව එම ආතනයේ සංයුතිය වෙනස් කරන නීතියක් පැනවීමේ බලය පාර්ලිමේන්තුවට අහිමි වන අතර මෙයට පටහැනිව පනවන නීතියක් වේ නම් 29(3) වගන්තිය ප්‍රකාරව ශූන්‍ය වේ.

(2). අධිකරණ විවරණ බලය

- මෙයින් අදහස් කරන්නේ ව්‍යවස්ථාදායකය පනවන නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වනවාද නැද්ද යන්න පරීක්ෂා කර බැලීමටත් අනුකූල නොවනවා නම් එම නීති අවලංගු කිරීමටත් අධිකරණයට ඇති බලයයි. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ මෙම බලය පළමුවෙන් ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයටත් අවසාන වශයෙන් බ්‍රිතාන්‍යයේ රාජාධිකරණයටත් හිමිව තිබුණි. මෙම බලය සම්බන්ධයෙන් දැක්විය හැකි හොඳම නිදසුන 1962 දී ප්‍රකාශයට පත්කළ රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ නඩුවේ තීන්දුවයි.

(3). සෝල්බරි ව්‍යවස්ථාවේ 2 වන වගන්තිය

- ලංකා පාර්ලිමේන්තුව ඉල්ලා සිටීනම් ලංකාව වෙනුවෙන් නීති පැනවීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට බලය තිබෙන බව මෙම වගන්තියෙන් ප්‍රකාශ විය.

- ඉහත සඳහන් විධිවිධාන මගින් සෝල්බරි පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලය සීමා කරනු ලැබූ අතර පාර්ලිමේන්තුවේ ස්වාධිපත්‍යයටද එමගින් හානි සිදුවිය.

- 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව ස්ථාපිත කර තිබුණේ පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය න්‍යාය පදනම් කර ගෙනය. මෙම න්‍යායෙන් ප්‍රකාශ වන්නේ පාර්ලිමේන්තුවේ බලය අසහාය වන බවත් එයට සමාන වන හෝ අභියෝග කළහැකි වෙනත් බලයක් නොමැති බවත්, එම බලය පදනම් කරගෙන පාර්ලිමේන්තුවට ඕනෑම නීතියක් පැනවිය හැකි බවත්, එම නීති කිසිදු අධිකරණයක් ඉදිරියේ අභියෝගයට ලක්කළ නොහැකි බවත් සහ පාර්ලිමේන්තුවේ බලය සීමා කරන නීති පැනවීමට කිසිදු වෙනත් කිසිදු ආයතනයට බලය නොමැති බවත්ය.

- මේ අනුව ජාතික රාජ්‍ය සභාවට ඕනෑම නීතියක් පැනවීමට සහ අහෝසි කිරීමට බලය හිමි වූ අතර මෙම තත්ත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4, 5, 44, 45 සහ 48.2 යන වගන්ති මගින් තහවුරු කර තිබුණි. මෙම වගන්ති මගින් කියවුනේ ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව සතුවන බවත්, එම බලය ජනතාව විසින් ජාතික රාජ්‍ය සභාව හරහා ක්‍රියාවට නංවන බවත්, ඒ අනුව ජාතික රාජ්‍ය සභාවේ ව්‍යවස්ථාදායක බලය උත්තරීතර වන බවත් සහ ජාතික රාජ්‍ය සභාවට ඕනෑම නීතියක් පැනවිය හැකි බවත්, එම නීති කිසිදු අධිකරණයක් ඉදිරියේ අභියෝගයට ලක්කළ නොහැකි බවත්ය.
- 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන පනත් වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කර බැලීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයට හිමි වූවද පනත සම්මත කොට නීතියක් බවට පත් වූ පසු ඒ ගැන ප්‍රශ්න කිරීමට කිසිදු අධිකරණයකට විනිශ්චය බලයක් හිමි නොවීය.
- මේ අනුව සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව මෙන් නොව 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව නීති පැනවීම සම්බන්ධයෙන් උත්තරීතර බලයක් භුක්ති විඳින්දේය.

නිගමනය : **ඉහත දැක් වූ කරුණුවලින් පෙනී යන්නේ 1948 සහ 1972 ව්‍යවස්ථා යටතේ ක්‍රියාත්මක වූයේ කැබිනට් මාදිලියේ ආණ්ඩුක්‍රමයක් වුවද එම ව්‍යවස්ථා දෙක යටතේ ක්‍රියාත්මක වූ ව්‍යවස්ථාදායක මණ්ඩල දෙක සංවිධාන ව්‍යුහය, සංයුතිය සහ බලතල යන සෑම කේෂ්ත්‍රයකින්ම අනෝන්‍ය වශයෙන් එකිනෙකට වෙනස් වන බව යි.**

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



7 ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 39%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 30%ක් ද
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ට වැඩියෙන් ලබා ගත් පිරිස 11%ක් වන අතර ලකුණු 6ට අඩුවෙන් ලබා ගත් පිරිස 30%කි. එමෙන් ම අපේක්ෂකයන්ගෙන් 59%ක් ම 06 - 15 දක්වා ලකුණු ලබා ගෙන ඇත.



මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගෙන් 43%ක් වූ වැඩි ම ප්‍රතිශතයක් (i) කොටස තෝරා ගෙන ඇති අතර 20%ක් වූ අවම ප්‍රතිශතයක් (iii) කොටස තෝරා ගෙන ඇත.



මෙම ප්‍රශ්නයෙහි 54%ක වැඩි ම පහසුතාව (i) කොටසට ද 35%ක අඩු ම පහසුතාව (ii) කොටසට ද දක්වා ඇත.

කොටස් තුනක් සහිත මෙම ප්‍රශ්නයෙහි ඕනෑ ම කොටස් දෙකක් තෝරා ගෙන පිළිතුරු ලිවීමේ අවස්ථාව අපේක්ෂකයන්ට ලබා දී තිබේ.

I කොටස

7 ප්‍රශ්නය තෝරාගත් අපේක්ෂකයන්ගෙන් 43% ක පිරිසක් මෙම කොටස තෝරා ගෙන ඇත. මෙම ප්‍රශ්නයේ අරමුණ සෝල්බරි ව්‍යවස්ථාව යටතේ නාමික විධායකය පත් කරන හා ඉවත් කරන ආකාරය, බලතල, කාර්යයන්, තත්ත්වය සහ මෙරට අග්‍රාණ්ඩුකාර ධූරය පිළිබඳ අත්දැකීම් සම්බන්ධ ව, අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම යි.

මෙම කොටසේ පහසුතාව 54%කි. මෙම කොටස 7 ප්‍රශ්නයේ වැඩි ම පහසුතාව පෙන්නුම් කළ කොටසයි. මෙම ප්‍රශ්නය පෙර වර්ෂවල දී ද විමසීමට ලක් කරන ලද ප්‍රශ්නයක් වීම පහසුතාව ඉහළ යාමට එක් හේතුවකි. මෙහි දී 46%ක දුෂ්කරතාවක් පෙන්නුම් කරන බැවින් පන්තියේ විෂය සාධන මට්ටම අඩු සිසුන් වෙත විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. සමකාලීන පොත පත පරිශීලනය කිරීමට යොමු කරවීම හා සාකච්ඡා සම්මන්ත්‍රණවලට සිසුන් යොමු කිරීම මගින් සිසුන්ගේ අවබෝධය වර්ධනය කිරීම කළ හැකි වේ. එ මගින් අපේක්ෂකයන්ගේ සාධන මට්ටම තටදුරටත් වර්ධනය කළ හැකි වේ.

II කොටස

7 ප්‍රශ්නයෙහි 35%ක පහළ ම පහසුතාව සහිත කොටස වේ. මෙම ප්‍රශ්නයෙන් 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටු වූ සත්‍ය විධායකයේ ස්වරූපය, එය තේරී පත් වූ ආකාරය හා බලතල යනාදී කරුණු සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කරයි.

නමුත් මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සැපයීමට අවශ්‍ය දැනුම සිසුන් තුළ නොමැති බව දක්නට ලැබිණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ නිවැරදි දැනුම ලැබෙන ආකාරයට සත්‍ය විධායකය සම්බන්ධ ව පන්ති කාමර තුළ දී සාකච්ඡා කිරීමට සිසුන් යොමු කරවා ගැනීමෙන් මේ තත්ත්වය මඟ හරවා ගත හැකි ය.

III කොටස

ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන්ගෙන් 20%ක් වූ අඩු පිරිසක් මෙම කොටසට පිළිතුරු සපයා ඇත. මෙම කොටසේ පහසුතාව 49%කි. එනම් මධ්‍යම මට්ටමේ පහසුතාවකි. පසුගිය ප්‍රශ්න පත්‍රවල සඳහන් ප්‍රශ්නයක් වීම එයට එක් හේතුවකි. සෝල්බරි හා 1972 ව්‍යවස්ථාදායකයන්හි පැවැති පරමාධිපත්‍යය පිළිබඳ ව පැහැදිලි සහ සංසන්දනාත්මක අවබෝධයක් ලැබෙන අයුරින් පන්ති කාමර තුළ දී සාකච්ඡා නොවීම පහසුතාව අඩු වීමට හේතුවක් වී ඇත.

එම ව්‍යවස්ථාව ඇසුරෙන් ව්‍යවස්ථාදායකයන්හි පැවැති සුවිශේෂ ලක්ෂණ පිළිබඳ සංසන්දනාත්මක අවබෝධයක් ලැබෙන අයුරින් පන්ති කාමරය තුළ කරුණු සාකච්ඡා කිරීමත්, කරුණු වගු ගත කොට දැක්වීමත් කළ හැකි ය. තව දුරටත් දැනුම වර්ධනය කිරීම සඳහා වාද විවාද, බුද්ධි කලම්හන සාකච්ඡා ආදිය සංවිධානය කළ හැකි වේ. අතිරේක කියවීම් සඳහා සිසුන් යොමුකිරීම ද අත්‍යවශ්‍ය වේ.

8 ප්‍රශ්නය

8. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද පහත දැක්වෙන සංශෝධන අතුරෙන් ඕනෑම දෙකක් තෝරාගෙන ඒවායේ මූලික අංග ලක්ෂණ සඳහන් කරන්න.

(i) 2001 වර්ෂයේ 17 වන ව්‍යවස්ථා සංශෝධනය

(iii) 2010 වර්ෂයේ 18 වන ව්‍යවස්ථා සංශෝධනය

(iv) 2015 වර්ශයේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය

(i) 17වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

අභිමථාර්තය : **1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්තාව යටතේ ගොඩනැගූ විධායක ජනාධිපති තනතුර සම්බන්ධයෙන් එල්ල වී ඇති ප්‍රධානම විවේචනය වන්නේ එය වූ කළී ප්‍රජාතන්ත්‍රවාදී සළුපිලි වලින් ආවරණය කළ ඒකාධිපති තනතුරක් වන බවය. විශේෂයෙන්ම රජයේ උසස් තනතුරු සඳහා පත්කිරීම් සම්බන්ධයෙන් ජනාධිපති වරයාට පවරා තිබුන අභිමතානුසාරී බලය ක්‍රියාවට නැංවීමේදී පෙනීගියේ ජනාධිපතිවරුන් හිතුවක්කාරී සහ අත්තනෝමතික ලෙස එම බලතල ක්‍රියාවට නැංවීම හේතුවෙන් රාජ්‍ය සේවය, අධිකරණය හා පොලීසිය යන රාජ්‍ය සේවාවන්හි ස්වාධීනත්වය සහ අපක්ෂපාතීභාවය නැතිව ගොස් ඒවා වේගයෙන් දේශපාලනීකරණය වෙමින් පවතින බවය. මෙම තත්ත්වය සංවරණය කිරීමේ අරමුණ පෙරදැරිව 2001 වර්ෂයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 17 වන සංශෝධනය ඇතුල් කරන ලදි. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ 17 වන ව්‍යවස්ථා සංශෝධනය පැනවීමේ ව්‍යවස්ථාමය පසුබිම සහ එම සංශෝධනයේ අන්තර්ගත මූලික සංවරණ විධික්‍රම පිළබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය මැන බැලීමය.**

පිළිතුර තුළ අඩංගු විය යුතු මූලික කරුණු

(1) 17 වන ව්‍යවස්ථා සංශෝධනයට බලපෑ ව්‍යවස්ථාමය පසුබිම (ලකුණු 03)

(2) 17 වන ව්‍යවස්ථා සංශෝධනයේ මූලිකාංග (ලකුණු 05)

(3) නිගමනය (ලකුණු 02)

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සංස්ථාපනය කළ විධායක ජනාධිපති ධුරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මගින් ප්‍රජාතන්ත්‍රවාදය නමැති කඩතුරාවට මුවා වී ගොඩ නගන ලද බරපතල ආඥාදායකත්වයක් වන බවට එම තනතුර හඳුන්වා දුන් දිනයේ සිටම චෝදනා එල්ල වේ.
- විශේෂයෙන්ම විචාරකයින්ගේ දැඩි විවේචනයට ලක්වූයේ රජයේ උසස් නිලතල සඳහා පත්කිරීම් කිරීමට සංවරණයකින් තොරව ජනාධිපතිවරයාට පවරා දී තිබූ අධි බලයයි.
- 1978 සිට තනතුරට පත් වූ ජනාධිපතිවරුන් විසින් මෙම බලතල භයානක ලෙස අවභාවිත කිරීමට පෙළඹෙන අතර මෙහි ප්‍රතිඵලය වූයේ රාජ්‍ය සේවාව, පොලීසිය සහ අධිකරණය වේගයෙන් දේශපාලනීකරණය වෙමින් ඒවායේ ස්වාධීනත්වය සහ අපක්ෂපාතීභාවය නැතිවී යාමය.
- මෙම අත්දැකීම් මගින් පෙනීගියේ ඇති වී තිබෙන තත්ත්වය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයට බෙහෙවින්ම අහිතකර බවත් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය යටපත් කරමින් වේගයෙන් රට තුළ ආඥාදායක ආණ්ඩුක්‍රමයක් බිහිවෙමින් පවතින බවත්ය.
- මෙම තත්ත්වය පාලනය කරමින් රාජ්‍ය සේවයේ, පොලීසියේ හා අධිකරණ ක්‍රමයේ ස්වාධීනත්වය ආරක්ෂා කොට පවත්වා ගෙන යාමට මෙන්ම මැතිවරණ ක්‍රියාවලිය ස්වාධීනව පවත්වා ගෙනයාම සඳහා ද ජනාධිපතිවරයාගේ සමහර විධායක බලතල සංවරණය කිරීමට යටත් කළයුතු බව පැහැදිලිවම පෙනී ගියේය.

- මෙම අරමුණ ඉලක්ක කර 2001 ඔක්තෝම්බර් මස තුන්වන දින 17 වන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබීය. මෙම සංශෝධනයේ විශේෂත්වය වන්නේ පාර්ලිමේන්තුව නියෝජනය කළ සියලුම දේශපාලන පක්ෂ ඒකඡන්දයෙන් යෝජනාව අනුමත කිරීමය.
- 17 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ව්‍යවස්ථාවට කරන ලද මූලික වෙනස්කම් පහත සඳහන් පරිදි වේ. 1. විධායක ජනාධිපතිවරයාගේ තීරණ ගැනීමේ බලයට සීමා පැනවෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවීම. කොමිසම සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත විය. කථානායකවරයා සභාපති විය. අගමැතිවරයා, විරුද්ධ පක්ෂයේ නායකයා, ජනාධිපතිවරයාගේ නියෝජිතයෙකු, අගමැති සහ විරුද්ධ පක්ෂයේ නායකයා විසින් නම් කළ ජනාධිපතිවරයා විසින් පත්කරන පස් දෙනෙකු සහ පාර්ලිමේන්තුවේ කුඩා පක්ෂ විසින් පත් කරන එක් අයෙකු, අනෙක් සාමාජිකයින් විය.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පැවරුන කාර්යයන් දෙකක් විය.
  (1). ස්වාධීන කොමිෂන් සභා සඳහා පත්කළ යුතු අයගේ නම් ජනාධිපතිවරයාට නිර්දේශ කිරීම.
  එම කොමිෂන් සභා වූයේ;
  (අ). මැතිවරණ කොමිෂන් සභාව
  (ආ). රාජ්‍ය සේවා කොමිෂන් සභාව
  (ඇ). ජාතික පොලිස් කොමිෂන් සභාව
  (ඈ). ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
  (ඉ). අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව
  (ඊ). මුදල් කොමිෂන් සභාව
  (උ). සීමා නීර්ණය කොමිෂන් සභාව
  (2). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කළයුතු පත්කිරීම්
  (අ). අගවිනිසුරු හා ශ්‍රේෂ්ඨාධිකරණයේ අනෙක් විනිශ්චයකරුවන්
  (ආ). අභියාචනාධිකරණයේ සභාපති සහ අනෙක් විනිසුරුවරුන්
  (ඇ). අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්
  (ඈ). නීතිපතිවරයා
  (ඉ). විගණකාධිපතිවරයා
  (ඊ). පොලිස්පතිවරයා
  (උ). ඔම්බුඩ්ස්මන්වරයා
  (ඌ). පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා

  2. එතෙක් පැවති සමහර කොමිෂන් සභා සඳහා අතිරේක බලතල ලබාදීම.
  නිද. අධිකරණ සේවා කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
  3. පරිපාලන විනිශ්චය සභාව නමැති ආයතනය පිහිටුවීම
  4. නව කොමිෂන් සභා කිහිපයක් පිහිටුවීම. ජාතික පොලිස් කොමිෂන් සභාව සහ මැතිවරණ කොමිෂන් සභාව.

නිගමනය : **ඉහත දැක්වූයේ 17 වන ව්‍යවස්ථා සංශෝධනයේ මූලිකාංගයන් ය. නමුත් දේශපාලන හේතූන් නිසා අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි විය. සංශෝධනයෙන් පිහිටවූ වැදගත්ම ආයතනය වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සාමාජිකයින් පත් නොකිරීම හේතුවෙන් 2005 වර්ෂය වනවිට මුළුමනින්ම අක්‍රීය තත්ත්වයකට පත්ව තිබුණි. මැතිවරණ කොමිසම කිසිදු දිනක පත් නොකළේය.**

(ii). 2010 වර්ෂයේ 18 වන ව්‍යවස්ථා සංශෝධනය

අභිමතාර්ථය :2010 වර්ෂයේදී ව්‍යවස්ථාවට කරන ලද 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් 17 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිවරයා කෙරෙහි පැනවූ සියලුම සංවරණ ඉවත් කර 1978 මූලික ව්‍යවස්ථාවේ අන්තර්ගත සමහර වගන්ති ද වෙනස් කෙරෙණ. විචාරකයින් මෙම සංශෝධනය හැඳින්වූයේ ආඥාදායකත්වයෙන් අධි ආඥාදායකත්වයක් කරා යාමට ගත් උත්සාහයක් ලෙසය. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ මෙම තත්ත්වය සම්බන්ධයෙන් අපේක්ෂකයින් දරණ මතය පරීක්ෂාවට ලක් කිරීමය.

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු මූලික කරුණු

(1) 18 වන සංශෝධනයේ මූලිකාංග (ලකුණු 05)

(2) 18 වන සංශෝධනයේ ප්‍රතිඵල (ලකුණු 03)

(3) නිගමනය (ලකුණු 02)

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිදු වූයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කොට කථානායකවරයා අවසාන අනුමැතිය දුන් 2010 සැප්තැම්බර් 08 දිනය. සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික වෙනස්කම් තුනක් කරන ලදි.
  (1). ජනාධිපති තනතුරට තරඟ කිරීම සම්බන්ධයෙන් පනවා තිබූ වාර දෙකක සීමාව ඉවත් කිරීම
  (2). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටුවා තිබූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කොට ඒ වෙනුවට බල විරහිත පාර්ලිමේන්තු සභාව පිහිටුවා ජනාධිපතිවරයාගේ බලතල පුළුල් කිරීම.
  (3). ස්වාධීන කොමිෂන් සභාවල බලතල කප්පාදු කිරීම.

පාර්ලිමේන්තු සභාව

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අහෝසි කොට ඒ වෙනුවට 18 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටවූයේ පාර්ලිමේන්තු සභාවය. එය සමන්විත වූයේ පහත දැක්වෙන සාමාජිකයින් පස් දෙනාගෙනි.
  1. අගමැතිවරයා
  2. කථානායකවරයා
  3. විරුද්ධ පක්ෂයේ නායකවරයා
  4. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන අගමැති නම් කරන අයෙක්
  5. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන විපක්ෂ නායකයා නම් කරන අයෙක්
- පෙර පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සමග පාර්ලිමේන්තු සභාව සසඳන විට මූලික වෙනස්කම් දෙකක් දැකිය හැකිවිය.
  (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සාමාජිකයින් 10 දෙනාගෙන් 07 දෙනෙක්ම පාර්ලිමේන්තුව නියෝජනය නොකළ සිවිල් පුද්ගලයින් විය. නමුත් පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයින් පස් දෙනාම පාර්ලිමේන්තු සාමාජිකයින් විය.
  (ii) ජනාධිපතිවරයා කරන පත්කිරීම් සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට සහ අනුමත කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව භුක්ති වින්ද බලය පාර්ලිමේන්තු සභාවට අහිමි කිරීම.
- 18 වන සංශෝධනයට අනුවත
  (අ). මැතිවරණ කොමිෂන් සභාව
  (ආ). රාජ්‍ය සේවා කොමිෂන් සභාව
  (ඇ). ජාතික පොලිස් කොමිෂන් සභාව
  (ඈ). ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
  (ඉ). අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව
  (ඊ). මුදල් කොමිෂන් සභාව
  (උ). සීමා නීර්ණය කොමිෂන් සභාව

යනාදියට සාමාජිකයින් පත්කිරීමේදී ජනාධිපතිවරයා පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ඉල්ලා සිටිය යුතුය.

එමෙන්ම;

(අ). අගවිනිසුරු හා ශ්‍රේෂ්ඨාධිකරණයේ අනෙක් විනිශ්චයකරුවන්

(ආ). අභියාචනාධිකරණයේ සභාපති සහ අනෙක් විනිසුරුවරුන්

(ඇ). අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයින්

(ඈ). නීතිපතිවරයා

(ඉ). විගණකාධිපතිවරයා

(ඊ). ඔම්බුඩ්ස්මන්වරයා

(උ). පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා

පත්කිරීමේදී ජනාධිපතිවරයා පාර්ලිමේන්තු සභාවේ නිරීක්ෂණ ඉල්ලා සිටිය යුතුය.

- නිරීක්ෂණ ඉල්ලා සිටියද, පාර්ලිමේන්තු සභාව ඒ අනුව නිරීක්ෂණ ලබා දුන්නද ඒවායින් බැඳීමක් ජනාධිපතිවරයාට නොවීය. නිරීක්ෂණ නොසළකා හරිමින් ජනාධිපතිවරයාගේ අභිමතය අනුව තමන්ට අවශ්‍ය පරිදි මෙම පත්කිරීම් කිරීමට ජනාධිපතිවරයාට හැකිවිය.
- 17 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ ජනාධිපතිවරයා විසින් පොලිස්පතිවරයා පත්කළ යුතු වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්වය. නමුත් 18 වන සංශෝධනය යටතේ එම සීමාව ඉවත් කොට පොලිස්පතිවරයා පත්කිරීම් සෘජුවම ජනාධිපතිවරයා යටතට අයත් කර ගත්තේය. 18 වන සංශෝධනය යටතේ කරන ලද තවත් බරපතල වෙනස්කමක් වූයේ ස්වාධීන කොමිෂන් සභා වලට හිමිකර දී තිබූ බලතල ඉතාම දැඩි ලෙස කප්පාදු කිරීමය. මේ අනුව මැතිවරණ කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව සහ ජාතික පොලිස් කොමිෂන් සභාව යන ආයතන වල බලතල අසීමිත ලෙස කප්පාදු කරන ලදි.
- මේ අතුරින් ඉතාම බරපතල කරුණ වන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුව පැවති බලතල කප්පාදු කිරීමය. 17 වන සංශෝධනයට අනුව රජයේ නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම ඇතුළු රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සකස් කිරීම පිළිබඳ බලය තිබුණේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවටය. නමුත් 17 වන සංශෝධනය යටතේ මේ බලතල අමාත්‍ය මණ්ඩලය වෙත පවරා ගනු ලැබීය.
- මෙයට අමතරව 17 වන සංශෝධනය යටතේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීම, උසස් කිරීම, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම යන කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිසමට පවරා තිබුන අමාත්‍ය මණ්ඩලයට උපදෙස් දීමේ බලය 18 වන සංශෝධනය යටතේ කෙළින්ම අමාත්‍ය මණ්ඩලය යටතට පවරා ගනු ලැබීය.

නිගමනය: **ඉහතින් දැක්වූයේ 18 වන සංශෝධනය යටතේ කරන ලද ව්‍යවස්ථාමය වෙනස් කිරීම් පිළිබඳ සාරාංශයක්ය. මෙම සංශෝධනය ප්‍රජතන්ත්‍රවාදීන් අර්ථකථනය කළේ ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල කරන ලද මරු පහරක් ලෙසය. විවේචකයින් පෙන්වා දුන්නේ මෙම සංශෝධනයේ බලපෑමෙන් ස්වාධීන රාජ්‍ය සේවය බිඳ වැටුන බවය. අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය බිඳ වැටුන බවය. ව්‍යවස්ථාදායකය විධායකයේ ග්‍රහණයට හසු වූ බවය. ස්වාධීන මැතිවරණ ක්‍රමය බිඳ වැටුන බවය. සමස්ථයක් ලෙස ගත්විට ප්‍රජාතන්ත්‍රවාදය බරලතල බාදනයකට ගොදුරු වූ බවය. මෙම චෝදනා වල සත්‍ය අසත්‍ය තත්ත්වය කෙසේ වෙතත් 18 වන ව්‍යවස්ථා සංශෝධනය ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රතිවිරෝධතාවක් බව අවසාන වශයෙන් කිව හැක.**

(iii) 2015 වර්ෂයේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය

අභිමථාර්තය : **18 වන සංශෝධනය රට තුළ අපේක්ෂා කළ පිබිදීම බරපතල දේශපාලන අර්බුදයක් ඇතිවීම කෙරෙහි ඉතාම දැඩි ලෙස බලපෑවේය. පැහැදිලිවම පෙනීගියේ රට තුළ විධායක ආඥාදායකත්වයක් ගොඩ නැගෙමින් පවතින බවය. රාජ්‍ය සේවය, පොලීසිය සහ අධිකරණය බලා සිටියදී ම විධායකයේ අතකොළු බවට පත්වන තත්ත්වයක් දැකිය හැකි විය. මෙයට සමාන්තරව රටේ දූෂණ හා වංචා ද දිනෙන් දින ඉහළ යාමට පටන් ගත්තේය. ආණ්ඩුවට එරෙහිව සිවිල් සමාජ විරෝධය දිනෙන් දිනම උග්‍ර ලෙස නැගී එන්නට විය. 2015 ජනවාරි මාසයේ පැවැත්වූ ජනාධිපතිවරණයේදී බලයේ සිටි ජනාධිපතිවරයා පරාජයට පත් වී නව ජනාධිපතිවරයෙකු තේරී පත් වන්නේ මෙම අර්බුදය හමුවේ නව ජනාධිපතිවරයා සහ නව ආණ්ඩුව විසින් ඉදිරිපත් කළ දින 100 වැඩ සටහනේ ප්‍රමුඛස්ථානය ගත් කරුණක් වූයේ රට තුළ ප්‍රජාතන්ත්‍රවාදී යහපාලනය ස්ථාපිත කිරීමය.**

මෙම ක්‍රියාදාමයේ ආරම්භක අවස්ථාව ලෙස 2015 මැයි මාසයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 19 වන ව්‍යවස්ථා සංශෝධනය පෙන්වා දීමට පුළුවන. මෙම ප්‍රශ්නයේ අභිමතාර්ථය වන්නේ ඉහතින් සඳහන් කල ආකාරයට 19 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම කෙරෙහි බලපෑ පසුබිම සහ 19 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් කරන ලද ව්‍යවස්ථාමය වෙනස්කම් පිලිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමය.

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු මූලික කරුණු

(1) 19 වන සංශෝධනයේ දේශපාලන පසුබිම **(ලකුණු 02)**

(2) 19 වන සංශෝධනයේ අන්තර්ගතය **(ලකුණු 06)**

(3) නිගමනය **(ලකුණු 02)**

ආදර්ශ පිළිතුර (ආධාර කර ගැනීම හැර මේ මතම පිළිතුරු පරීක්ෂා කර බැලීම නොකරන්න)

- 17 වන සංශෝධනය මගින් උත්සාහ ගත්තේ 1978 ව්‍යවස්ථාව මගින් නිර්මාණය කළ විධායක ආඥාදායකත්වය පාලනය කිරීමටය. 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් කළේ එම උත්සාහය ආපස්සට හැරවීමය. මෙහි ප්‍රතිඵලය වූයේ රට තුළ විධායක ආඥාදායකත්වයක් වර්ධනය වීමට පටන් ගැනීමය.
- පැහැදිලිවම පෙනීගිය දෙය වූයේ වර්ධනය වන විධායක ආඥාදායකත්වය යටතේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී සාරධර්ම පද්ධතිය ද බාදනය වෙමින් පවතින බවය.
- මෙම තත්ත්වය පාලනය කරමින් රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කොට පවත්වා ගෙනයාමේ අරමුණෙන් 2015 ජනවාරි මාසයේ බලයට පත්වන යහපාලන ආණ්ඩුව විසින් 19 වන සංශෝධනය ඉදිරිපත් කරනු ලැබීය.
- 19 වන සංශෝධනය මගින් කරන ලද ප්‍රධාන වෙනස්කම් පහත සඳහන් පරිදි වේ.
  1. තොරතුරු වෙත ප්‍රවේශවීමේ අයිතිවාසිකම හඳුන්වා දීම.
  2. ජනාධිපතිවරයාගේ ධුර කාලය වසර 5 දක්වා අඩු කිරීම.
  3. ජනාධිපති තනතුර එක් පුද්ගලයෙකුට දැරිය හැක්කේ දෙවතාවක් පමණක්ය යන විධිවිධානය යළි බලාත්මක කිරීම.
  4. බලයේ සිටින ජනාධිපති මියගිය හොත් හෝ ධුරය හිස්වීමක් සිදුවුව හොත් වැඩබලන ජනාධිපති ධුරයක් පිළිබඳ ප්‍රතිපාදන.
  5. ජනාධිපතිවරයා වෙත අතිරේක වගකීම් පැවරීම.
  6. ජනාධිපතිවරයාගේ මුක්තිය සීමා කිරීම.
  7. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නැවත හඳුන්වා දීම. මේ හරහා කොමිෂන් සභා සඳහා සාමාජිකයින් පත් කිරීම. හා ඉහළ නිලධාරීන් හා විනිශ්චයකාරවරුන් ජනාධිපතිවරයාට තිබූ බලතල සීමා කිරීම.
  8. කැබිනට් අමාත්‍යවරුන්ගේ උපරිම සීමාවක් පිළිබඳ ප්‍රතිපාදන හඳුන්වා දීම.
  9. පාර්ලිමේන්තුවේ නිල කාලය අඩු කිරීම.
  10. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට තිබූ බලතල සංශෝධනය කිරීම.
  11. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එරෙහිව විනය පරීක්ෂා පැවැත්වීමේ බලතල ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දීම.
  12. හදිසි පනත් පිළිබඳ ප්‍රතිපාදන අහෝසි කිරීම.
  13. විගණන කොමිසම සහ ප්‍රසම්පාදන කොමිසම හඳුන්වා දීම.
  14. මැතිවරණ කොමිෂන් සභාව, ජාතික පොලිස් කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව යන ඒවායේ බලතල වැඩි කිරීම.
  15. විදේශ රටක පුරවැසිභාවය ලත් පුද්ගලයෙකුට පාර්ලිමේන්තු මහ මැතිවරණයකදී හෝ ජනාධිපතිවරණයකදී තරග කළ නොහැකි පරිදි නීති සම්පාදනය.

නිගමනය : ඉහත දැක්වූයේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම කෙරෙහි බලපෑ දේශපාලන පසුබිම සහ 19 වන සංශෝධනයෙන් කරන ලද වෙනස්කම්ය. මෙම සංශෝධනයේ ප්‍රතිඵල ලෙස විධායක ජනාධිපති ධුරයේ අත්තනෝමතික බලතල සීමාවීම, රාජ්‍යයේ විනිවිදභාවය හා වගවීම වර්ධනය වීම සහ පුරවැසියන් සවිබල ගැන්වීම යනාදිය පෙන්වා දියහැක.

8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



B හා C කොටස් අතුරින් අවම තෝරා ගැනීමක් සහිත 8 වන ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 17%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 40%ක් ද
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 32%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 21%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 7%ක් ද
ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ට වැඩියෙන් ලබා ගත් පිරිස 7%ක් වන අතර ලකුණු 6ට අඩුවෙන් ලබා ගත් පිරිස 40%කි. එමෙන් ම අපේක්ෂකයන්ගෙන් 53%ක් 06 - 15 දක්වා ලකුණු ලබා ගෙන ඇත.



මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගෙන් 42% ක් වූ වැඩි ම ප්‍රතිශතයක් (iii) කොටස තෝරා ගෙන ඇති අතර 17%ක් වූ අවම ප්‍රතිශතයක් (i) කොටස තෝරා ගෙන ඇත.



මෙම ප්‍රශ්නයට අදාළ කොටස් 03න් (i) හා (iii) කොටස් දෙකෙහි ම 38%ක වැඩි ම පහසුතාව දක්වා ඇති අතර (ii) කොටසට 35%ක පහසුතාව දක්වා ඇත.

I කොටස

මෙම ප්‍රශ්නයේ පහසුතාව 38%කි. මෙම ප්‍රශ්නයෙන් 17 වන ව්‍යවස්ථා සංශෝධනයෙහි අන්තර්ගත 1978 විධායක ජනාධිපතිවරයාගේ බලතලවලට සීමා පැනවෙන විධිවිධාන පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කරයි.

මේ සඳහා අඩු පහසුතාව දැක්වීමට හේතු වී ඇත්තේ සංශෝධනයට අදාළ ව අන්තර්ගත කරුණු විස්තර කර නොතිබීම යි. බොහෝ අපේක්ෂකයන් පිළිතුරු ගොඩ නැගීමේ දී ව්‍යවස්ථා සංශෝධනයට බලපෑ ව්‍යවස්ථාමය පසුබිම හා සමස්ත නිගමනය ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමු නොකිරීමත් විස්තර කිරීමෙන් තොර ව සංශෝධනයේ මුලිකාංග දැක්වීමට පමණක් අවධානය යොමු කිරීමත් නිසා ඉහළ ලකුණු ලබා ගැනීමේ අවස්ථාව මඟ හැර ඇත. 17 වන සංශෝධනය විසින් වෙනස් කරන ලද 1978 ව්‍යවස්ථාව යටතේ තිබූ ජනාධිපතිවරයාගේ බලතල සම්බන්ධ විධිවිධාන පිළිබඳ සිසුන්ගේ අවබෝධය පුළුල් කළ යුතු ය. ඒ සඳහා නිවැරදි සහ පැහැදිලි නිරවුල් අවබෝධයක් ලැබෙන අයුරින් පන්ති කාමරය තුළ දී සිසුන් සමඟ සාකච්ඡා කළ යුතු ය.

II කොටස

මෙම කොටසෙහි පහසුතාව 35%කි. මෙම ප්‍රශ්නයෙන් 18 වන සංශෝධනය මඟින් ජනාධිපතිධූරය පිළිබඳ අලුතින් ඇතුළත් කර ඇති විධිවිධාන හා එම බලතල පිළිබඳ අපේක්ෂකයන් සතු දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම අරමුණු විය.

අඩු පහසුතාවක් දැක්වීමට හේතු වී ඇත්තේ ප්‍රමාණවත් දැනුමක් සිසුන් තුළ නොමැති වීමයි. එම නිසා 1978 මුල් ව්‍යවස්ථාව මඟින් ඇති කළ ජනාධිපතිධූර බලතලත් 17 වන සංශෝධනය මඟින් ඇති කරන ලද සංවරණ සහ එම සංවරණ ඉවත් කරමින් 18 වන සංශෝධනය මඟින් ඇති කළ නව තත්ත්වය පිළිබඳ විධිමත් අවබෝධයක් ගොඩ නැඟෙන අයුරින් සාකච්ඡා කළ යුතු වේ.

III කොටස

මෙම කොටසේ පහසුතාව 38%කි. එය ප්‍රමාණවත් සාධන මට්ටමක් ලෙස දැක්විය නො හැකි ය. මෙම ප්‍රශ්නයේ අරමුණ වන්නේ 19 වන ව්‍යවස්ථා සංශෝධනයේ ඇති කරන ලද ව්‍යවස්ථාමය වෙනස්කම් පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කර බැලීමයි. මෙම මාතෘකා පිළිබඳ අපේක්ෂකයන් ඉහළ සාධන මට්ටමක් පෙන්නුම් නොකිරීමට හේතුව 18 වන සංශෝධනයෙන් ඇති කළ විධායකය කේන්ද්‍ර කර ගත් පාලන ක්‍රමය වෙනස් කොට ප්‍රජාතන්ත්‍රවාදය නැවත රට තුළ ඇති කළ සංශෝධනයක් ලෙස ඇතුළත් විය යුතු විග්‍රහයක් සිසුන්ගේ පිළිතුරුවල අන්තර්ගත නො වීමයි. 19 වන සංශෝධනය මඟින් ඇති කරන ලද ප්‍රධාන වෙනස්කම් රාජ්‍යයේ විනිවිදභාවය වර්ධනය වීම, පුරවැසියන් සවිබල ගැන්වීම යනා දී කරුණු සම්බන්ධ දැනුම පන්ති කාමරය තුළ සිසුන් වෙත සම්ප්‍රේෂණය කළ යුතු ය.

ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ආණ්ඩු ක්‍රමය පිළිබඳ මෑත කාලයේ සිදු වූ වෙනස්කම් සහ මහජන විවාදය පිළිබඳ සිසුන් කොතෙක් දුරට අවබෝධයකින් සහ උනන්දුවකින් සිටින්නෙහි දැයි පරීක්ෂා කිරීමක් ද 8 වන ප්‍රශ්නයේ කොටස් තුනෙන් ම අපේක්ෂා කර ඇත. දේශපාලන විද්‍යාව විෂයට අදාළ වැදගත් සමකාලීන තේමා පිළිබඳ ව සිසුන් මෙන් ම ගුරුවරුන් ද වඩාත් සැලකිලිමත් වීමේ අවශ්‍යතාව ද මෙයින් අවධාරණය වේ.

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා පිළිබඳ ව ගුරු සිසු දෙපාර්ශවයට ම දැනුවත් කිරීමේ වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම මඟින් ඒ පිළිබඳ දැනුම හා අවබෝධය වර්ධනය කළ හැකි ය.

2.2.3 **II** ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :



දේශපාලන විද්‍යාව II පත්‍රය A, B, C ලෙස කොටස් තුනකින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. අපේක්ෂකයන්ගෙන් නිශ්චිත කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න මාලාවක් A කොටසෙහි අන්තර්ගත ය. ව්‍යුහගත කෙටි රචනා හා රචනා වර්ගයේ ප්‍රශ්න B හා C කොටස්වල අන්තර්ගත ය. එම කොටස්වලින් අපේක්ෂා කරනු ලැබුවේ රචනා මාදිලියේ පිළිතුරු ය.

2018 වසරේ උසස් පෙළ දේශපාලන විද්‍යාව II ප්‍රශ්න පත්‍රයේ A, B, C කොටස් තුනෙන් අපේක්ෂකයන්ට පහසුතාව වැඩි ම කොටස බවට පත්ව ඇත්තේ A කොටස ය. එහි පහසුතාව 46%කි. එසේ වුව ද එම ප්‍රශ්නය 54%ක පිරිසකට දුෂ්කර වී ඇති බව ද සැලකිල්ලට ගත යුතු කරුණකි. II පත්‍රයෙහි පහසුතාව අඩු ම කොටස B කොටස වන අතර, එයට ලැබුණු පහසුතාව 31%කි. B කොටස යනු දේශපාලන විද්‍යාවේ න්‍යායාත්මක කරුණු විමසීමකට ලක් කරන ප්‍රශ්න මාලාවක් ලබා දෙන්නකි. මෙහි දී ද වඩා සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ 69%ක ප්‍රමාණයකට මෙම කොටසට සාර්ථක ව පිළිතුරු සැපයීමට නොහැකි වූ බවයි. ලංකාණ්ඩුක්‍රමය පිළිබඳ අඛණ්ඩ ව පරීක්ෂා කර බැලීමක් සිදු කරනු ලබන C කොටසෙහි පහසුතාව 38%කි.

එසේ වුව ද මෙම කොටසට ද 62% පිරිසකට ඉහළ සාධන මට්ටමකට ලඟා වීමට නොහැකි වූ බව නිරීක්ෂණය හැකි ය. සමස්තයක් ලෙස II පත්‍රයෙහි A, B, C යන කොටස් තුනෙන් එක් කොටසකට හෝ 50% පහසුතාව ලබා ගැනීමට අපේක්ෂකයන්ට නොහැකි වී ඇත.

A කොටසට අපේක්ෂකයන් පිළිතුරු සපයන ලද ආකාරය අනුව පහත සඳහන් දුර්වලතා හඳුනා ගත හැකි විය.

01. ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ප්‍රශ්නයේ අනුකොටස් අංක මාරුවන කෙටි පිළිතුරු ලිවීම (උදා: 07 ප්‍රශ්නයේ (i) ජෝන් ලොක් (ii) තෝමස් ගොබ්ස් ලෙසට පිළිතුරු මාරු කර ලියා තිබීම)
02. ප්‍රශ්නයට අවශ්‍ය කරන පිළිතුරෙන් කොටසක් පමණක් ලියා තිබීම. (උදා: 17-ii ප්‍රශ්නයේ මහා මණ්ඩලය පිළිතුර සපයා තිබීම / ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ මත යන්න සටහන් නොවීම)
03. අවශ්‍ය කරන කරුණු සංඛ්‍යාව නොතිබීම (උදා: 16 (ii) ප්‍රශ්නයේ ලංකාවේ පළාත් පාලන ආයතන තුන (03) ප්‍රාදේශීය සභා, නගර සභා ලෙස පමණක් දැක්වීම)
04. අදාළ වර්ෂ හා නාමයන් මාරුකර දක්වා තිබීම (උදා: 1978 පළමු ජනරජ ව්‍යවස්ථාව ලෙස) සඳහන් කිරීම.
05. සාවද්‍ය දෝෂ සහිත පිළිතුරු සපයා තිබීම (උදා: 10 ප්‍රශ්නයට දේශපාලන පක්ෂ, මහජන නියෝජිතයන් ලෙස) දක්වා තිබීම.

එබැවින් මෙවැනි දෝෂ සහගත තත්ත්වයන් අපේක්ෂකයන් වෙතින් සිදු නොවන ආකාරයට පංති කාමරය තුළ ඔවුන් සූදානම් කරවීමේ කාර්යය ගුරුවරුන්ට පැවැරෙන අතර, මෙවැනි දෝෂ සිදු නොවන ආකාරයට අපේක්ෂකයන් වඩාත් සැලකිලිමත් විය යුතු ය. ඒ අනුව විෂය නිර්දේශයන් තුළ අන්තරගතවන කරුණු සැලකිල්ලට ගනිමින් නිශ්චිත කෙටි පිළිතුරු අපේක්ෂා කළ හැකි ප්‍රශ්න සකසා, ඒවා පිළිබඳ ව පන්ති කාමරය තුළ සිසුන් අඛණ්ඩ අභ්‍යාසකරණයකට යොමු කරවීම ඉතා වැදගත් ය.

B හා C කොටස් දෙක පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ දෝෂ ගණනාවක් ම සිදු කර ඇති බවයි.

01. විෂය නිර්දේශයේ ඇතැම් මාතෘකා අවධානයෙන් ගිලිහි තිබීම.
02. ඇතැම් විෂය කරුණු දෝෂ සහිත ව අවබෝධ කර ගැනීම.
03. ඇතැම් මාතෘකා පිළිබඳ ව අඩු අවබෝධයක් පැවැතීම
04. ඇතැම් මාතෘකා පිළිබඳ කිසිදු අවබෝධයක් නොමැති වීම
05. පිළිතුරු සැපයීමේ දී භාෂා කුසලතා අපේක්ෂකයන් සතු නොවීම.
06. ඇතැම් මාතෘකා පිළිබඳ ව පිළිතුරු සැපයීමට ප්‍රායෝගික උදාහරණ සැපයිය යුතු වුව ද ඒවා පිළිබඳ නිසි අවබෝධයක් නොමැතිකම.
07. ඇතැම් මාතෘකා පිළිබඳ ව පිළිතුරු සැපයීමට න්‍යායාත්මක මූලධර්ම ද යොදා ගත යුතු වුවත් ප්‍රායෝගික සිදුවීම් පමණක් ම ඉදිරිපත් කර තිබීම.
08. ප්‍රශ්නයට ප්‍රමාණවත් කරුණු පිළිතුරෙහි ඉදිරිපත් කර නොතිබීම.
09. ප්‍රශ්නයට අදාළ නොවන කරුණු දැක්වීම.
10. ඇතැම් පිළිතුරු සඳහා අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා කරුණු ඉදිරිපත් කිරීමට කාලය වැය කර තිබීම.
11. ප්‍රශ්න නිසි ලෙස අවබෝධ කර ගැනීමකින් තොරව පිළිතුරු සැපයීම.
12. ඇතැම් මාතෘකා පිළිබඳ ව දැනුම සහ අවබෝධය පැවැතියත්, ඒවා සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීමට අසමත් වීම.
13. ඇතැම් අපේක්ෂකයන් නිසි සූදනමකින් තොරව විභාගයට පෙනී සිටීම.

යන දුර්වලතා දක්නට ලැබිණි. මෙම තත්ත්වයන් අවම කිරීමට ගුරු උපදේශකවරුන් හා විෂය ප්‍රවීනයන්ද යොදා ගත් වැඩසටහන් සැකසීම, සෑම මසකම නිශ්චිත ප්‍රශ්න ප්‍රමාණයකට අපේක්ෂකයන්ට පිළිතුරු සැපයීමට අවකාශ ලබා දීම, පිළිතුරු පත් පරීක්ෂා කිරීමේ දී හා ඇගයීමේ දී අඩුපාඩු දෝෂ හා සාර්ථක තැන් හඳුනා ගනිමින් ඒවා පිළිබඳ විචාරාත්මක අදහස් ඉදිරිපත් කිරීම සිසුන්ට බෙහෙවින් ඵලදායී වනු ඇත. මෙවැනි අභ්‍යාස විෂයය ඒකක අවසානයේ සිදු කිරීම වඩාත් ඵලදායී වේ.

III කොටස

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

පොදු උපදෙස් :

* අපේක්ෂකයාගේ විභාග අංකය ද පිටු අංකය ද සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.
* ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී ලබා දී ඇති කාලය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතු ය.
* පිළිතුරු ලිවීමේ දී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතු ය.
* I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි එක් පිළිතුරක් පමණක් තෝරා ගත යුතු ය. තව ද පැහැදිලි ව එක් කතිර ලකුණක් පමණක් ඒ වෙනුවෙන් යෙදිය යුතු ය.
* ලබා දී ඇති මිනිත්තු 10ක අමතර කියවීම් කාලය ඵලදායී ලෙස භාවිත කළ යුතුය.
* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙනවඩාත් සාර්ථක පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්න තෝරා ගත යුතු ය.
* II පත්‍රයේ A කොටසට පිළිතුරු සැපයීමේ දී ප්‍රශ්න පත්‍රයේ ම අදාළ ස්ථානයේ ම පමණක් පිළිතුරු ලිවිය යුතු ය.
* II පත්‍රයේ B හා C කොටස්වල ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් ඡේද වෙන් කරමින් පිළිතුරු ලිවිය යුතු ය.ඇ
* ප්‍රශ්න අංකය, කොටස් හා අනු කොටස් අංක නිවැරදි ව ලිවිය යුතුය.
* II පත්‍රයේ A කොටස තුළ නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර එක් එක් අනුකොටසට අදාළ ඉලක්කගත පිළිතුර පමණක් ලිවිය යුතු ය.
* II කොටසේ B හා C කොටස්වල විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතු ය.
* ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මක ව කරුණු ඉදිරිපත් කළ යුතු ය.
* II පත්‍රයේ B හා C කොටස්වලට පිළිතුරු සැපයීමේ දී ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න අනුපිළිවෙළට නොව ඔබට ඉතාම පහසුවෙන් පිළිතුරු සැපයිය හැකි යැයි ඔබ සිතන අනුපිළිවෙළින් පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
* ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුගතව පමණක් ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු අතර ඊට අමතර වැඩිපුර ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමෙන් වැළකිය යුතු ය.

විශේෂ උපදෙස්

★ පිළිතුරු ලිවීමේ දී සංවිධානාත්මකව එය ගොඩනගා ගත යුතු ආකාරය සිසුන්ට පැහැදිළි කර දිය යුතු ය.

නිදසුන් - ප්‍රවේශය, පිළිතුරට අදාළ කරුණු සහ නිගමනය ඇතුළත්වන ආකාරයෙන් පිළිතුරු සකස් කර ගැනීමට සිසුන් යොමු කිරීම සහ ඒ සඳහා ලකුණු දීමේ පටිපාටියේ පිළිතුරු සංවිධානය කර ඇති ආකාරය භාවිතයට ගත හැකි ය.

★ ඒ ඒ මාතෘකාවලට අදාළ කරුණු පැහැදිළි කිරීමේ දී ප්‍රායෝගික වශයෙන් භාවිතයට ගැනුණු සහ භාවිතයේ පවතින දේශපාලන ක්‍රියාකාරකම් හා සිදුවීම් විෂයානුබද්ධව පැහැදිළි කර දිය යුතු ය.

★ පිළිතුරු ලිවීමේ දී එක් එක් න්‍යායන් හා සම්බන්ධ නිර්වචන නිවැරදි ව මතක තබා ගැනීමට සිසුන් යොමු කළ යුතු ය.

★ විෂයයට අදාළ චින්තකයන්/ දාර්ශනිකයන්, න්‍යාය හා මතවාද පිළිබඳ සිසුන්ගේ දැනුම නිශ්චිත කළ යුතු ය.

★ මැතිවරණ-නියෝජන ක්‍රම හා සම්බන්ධ පිළිතුර ලිවීමේ දී අදාළ සංඛ්‍යා ලේඛන නිසි පරිදි භාවිතයට ගැනීමට යොමු කළ යුතු ය.

★ දේශපාලන විද්‍යාවේ II පත්‍රය හා අදාළ මාතෘකා ඉගැන්වීමේ දී අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, සහ ව්‍යවස්ථා සංශෝධන කියවීමට සහ ඒවායේ අන්තර්ගතය නිසි ලෙස අවබෝධ කර ගැනීම සිසුන් යොමු කළ යුතු ය.

★ සිසුන් ලවා පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර ආශ්‍රිත අභ්‍යාස කරවා පුහුණුවක් ලබා දිය යුතු ය. එහිදී අභ්‍යාස පිළිතුරුවල අඩුපාඩු හා දෝෂ සිසුන්ට පෙන්වා දී ඒවා නිවැරදි කර ගැනීමට ඔවුන්ට මඟ පෙන්විය යුතු ය.

★ ප්‍රශ්නයට අදාළ සියලු ම කරුණු කිසියම් හේතුවක් නිසා පිළිතුරෙහි ඇතුළත් කිරීමට දුෂ්කරතා ඇතිවන අවස්ථාවල දී (උදා : කාලය ප්‍රමාණවත් නොවීම වැනි) ලියා ඇති පිළිතුරු මගින් තමන් තුළ පවත්නා දැනුම ප්‍රමාණවත් ලෙස අනාවරණය වන පරිදි පිළිතුරු සැපයීම කළ යුතු ය.

★ ප්‍රශ්න පත්‍රයේ ආකෘතිය පිළිබඳ (i වන පත්‍රය හා ii පත්‍රය) මනා වැටහීමක් අපේක්ෂකයන් තුළ ඇති කිරීමට කටයුතු කළ යුතු ය.

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා

ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ප්‍රතිඵල සංවර්ධනය සඳහා,

අ.පොෂ. (උ.පෙළ) දේශපාලන විද්‍යාව ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු ලිවීමට, වර්තමානයේදී එම විෂය හදාරන සිසුන් තුළ ඇති අවබෝධය ප්‍රමාණවත් නොවන බව දක්නට ඇත. එසේ ම ප්‍රශ්න තේරුම් නොගැනීම දුර්වල පිළිතුරු සැපයීම කෙරෙහි සෘජුව බලපා ඇත.

සිසු පිළිතුරු තුළින් පහත දුර්වලතා දෘෂ්‍යමාන විය.

- ප්‍රශ්නය නිසි ලෙස අවබෝධ කර නොගැනීම
- කටපාඩම් කරගත් පිළිතුර ප්‍රශ්නයට අදාළ වන්නේද යන්න නොතකා ලියා දැක්වීම.
- අදාළ උධෘත මතක තබා නොගැනීම හා ව්‍යවස්ථාමය වගන්ති ගිලිහී තිබීම
- බාහිර පොත පත ඇසුරින් කරුණු රැස් කිරීමට උනන්දු නොවීම
- පිළිතුරු ඉදිරිපත් කිරීමේ දී විචාරශීලීව සහ තර්කානුකූලව කරුණු ලියා නොදැක්වීම
- කරුණු ඉදිරිපත් කිරීමේදී නිරවුල් අවබෝධයක් නොමැති වීමෙන් විශ්වාසනීයත්වය, සපයන ලද පිළිතුරු දක්නට නොමැති වීම
- ප්‍රශ්නයට අදාළ කරුණු පමණක් තෝරා බේරා නොගැනීම
- ප්‍රශ්නයකට පිළිතුරු ලිවීමේ දී පිළිතුරෙහි ගලා යාම, දුර්වල මට්ටමක පැවතීම
- න්‍යාය සහ භාවිතය අතර වෙනස හඳුනා නොගැනීම
- පිළිතුර අවසානයේ දක්වන නිගමනය හරවත් අදාළ නිගමනයක් නොවීම.
- පිටු අංක 80හි සඳහන් කර ඇති දුර්වලතා දක්නට ලැබීම.

උක්ත දුර්වලතා මග හරවා ගැනීමට,

දේශපාලන විද්‍යාව උගන්වන ගුරුවරයා දේශපාලන විද්‍යාව පිළිබඳ පුළුල් අවබෝධයකින් ද, යාවත්කාලීන වූ දැනුමකින් ද යුතුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වීම ඉතා වැදගත් ය. දේශපාලන විද්‍යාව ඉගැන්වීමේදී විෂයෙහි අභිමතාර්ථ සහ ඉගෙනුම් ඵලය පිළිබඳව සිසුන් දැනුවත් කිරීම ඉතා වැදගත් ය.

දේශපාලන විද්‍යාව විෂයය සම්බන්ධ සංකල්ප, පාරිභාෂික පද සහ නව විෂය ප්‍රවණතා හඳුනා ගැනීම කෙරෙහි සිසුන්ට මග පෙන්වීම අවශ්‍ය වේ. විශේෂයෙන් පාඨ ග්‍රන්ථ පරිහරණයට පෙළඹවීම, අභ්‍යාස පිළිතුරු ලිවීම සහ එම පිළිතුරු ඇගයීමට සිසුන් සහභාගි කර ගනිමින් මණ්ඩල ක්‍රමයට පිළිතුරු පත් ඇගයීම හා ප්‍රතිපෝෂණය ලබා දීම යෝග්‍ය ය.